# 2022 දෙසැම්බර් 13

# මහා සභා රැස්වීමේ වාර්තාව

## දෙහිඕවිට ප්‍රාදේශීය සභාව

## දෙහිඕවිට ප්‍රාදේශීය සභාව

## මහා සභා රැස්වීම් වාර්තාව - 2022 දෙසැම්බර්

දෙහිඕවිට ප්‍රාදේශීය සභාවේ ගරු සභාපති ඒ.ජී.දමිදු ශ්‍යාමින්ද මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් 2022.12.13වෙනි දින පෙ:ව: 09.30 ට දෙහිඕවිට ප්‍රාදේශීය සභා කාර්යාලයේදී ආරම්භ වූ 2022 දෙසැම්බර් මස මහා සභා රැස්වීමේ වාර්තාව.

සභාගිත්වය:

1. ඒ.ජී.දමිදු ශ්‍යාමින්ද මැතිතුමා - ගරු සභාපති
2. ආර්.ඒ.විමුක්ති කුමාර ජයරත්න මැතිතුමා - ගරු උප සභාපති
3. අමිල කන්දෙආරච්චි මැතිතුමා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
4. ඩබ්.අබේසේන මැතිතුමා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
5. ඩී.එස්.එම්.නිමල් මැතිතුමා. - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
6. යූ.ජී.සරත් විජේසිරි මැතිතුමා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
7. එම්.ටී.ආර්.ලක්මාල් සමරරත්න මැතිතුමා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
8. එච්.අමරාවතී මැතිණිය - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී
9. ප්‍රියන්ත උදයකුමාර මැතිතුමා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
10. කේ.නිශාන් මැතිතුමා. - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
11. පී.ඊ.ශාන්තප්‍රිය පතිරණ මැතිතුමා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
12. අතුල ජයසිරි මැතිතුමා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
13. පී.වී.එන්.සඳමාලි විජේරත්න මැතිණිය - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී
14. කේ.විකුම් චන්දන කස්තිරගේ මැතිතුමා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
15. යශෝධ ලලංග පද්මසිරි මැතිතුමා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
16. යූ.ආර්.ඒ.සී.කරුණාරත්න මැතිතුමා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
17. ජේ.ඩී.තුෂාර අමරසිරි මැතිතුමා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
18. කේ.ඩී.එන්.ප්‍රියන්ති මැතිණිය - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී
19. යූ.සුධර්මා ලක්මාලි විජේසේකර මැතිණිය - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී
20. බී.ඒ.නීතා බාලසූරිය මැතිණිය - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී
21. සෙස්ටස් අර්සකුලරත්න මැතිතුමා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
22. එම්.එම්.එම්.ෆර්හාන් මැතිතුමා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
23. ඩී.එම්.වික්ටර් බණ්ඩාර මැතිතුමා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
24. ඒ.ආර්.ඒ.එම්.දරුක් මැතිතුමා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
25. පී.කේ.නිමල් රාජපක්ෂ මැතිතුමා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
26. එම්.වී.සුගත් මාධව මැතිතුමා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
27. ආර්.පී.ශ්‍රියානි ජයකොඩි මැතිණිය - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී
28. රනිල් චන්ද්‍ර කුමාර විජේසිරි මැතිතුමා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
29. එම්.බී.ආර්.එන්.එල්ලාවල මැතිණිය - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී
30. කේ.ජී.ඒ.කේ.සුමනදාස මැතිණිය - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී
31. ඩී.ජී.එච්.සී.කේ. පියරත්න මැතිතුමා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
32. කෝසල නුවන් ජයවීර මැතිතුමා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී

නොපැමිණි:

01. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අරුණ ශාන්තසිරි නිල්වල මැතිතුමා -
02. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී දිස්නා කුමාරි වීරක්කොඩි මැතිණිය -

-

කාර්යාල නිලධාරීන්:

Iඑම්.ඩී.සී.රුක්ෂානි මිය - ලේකම්
II.ඩී. එම්.එන්.එන්. දිසානායක මිය - සංවර්ධන නිලධාරී.
IIIඑම්.ජී. ආර්.සී.ජී.විජේරත්න මිය - සංවර්ධන නිලධාරී.
IV ඩබ්.එස්.කේ.වර්ණපුර මිය - කළමනාකරණ සේවා නිලධාරී

සභාවට පැමිණි සියලු දෙනා ආගම සිහිකිරීම, රණ විරුවන් සිහිකිරීම හා පළාත් පාලන ගීතය ගායනා කිරීමෙන් අනතුරුව සභාවේ කටයුතු ආරම්භ කරන ලදී.

**(අ)2022.11.08 දින පැවැත් වූ මහා සභා රැස්වීමේ වාර්තාව සභා සම්මත කිරීම:**

**ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

2022.11.08වෙනි දින පවත් වන ලද මහා සභා රැස්වීමේ වාර්තාව සියලුම මන්ත්‍රීවරුන් වෙත ලබා දී ඇති බවත් එම වාර්තාව කියවූවා සේ සලකා විරෝධතා හෝ නිවැරදි කිරීම් ඇත්නම් ඉදිරිපත් කරන ලෙසත්,එසේ නොමැතිනම් එම මහා සභා වාර්තාව සභා සම්මත කරන ලෙසත් දන්වන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීඩී.එස්.එම්.නිමල් මැතිතුමා:**

2022.11.08 වෙනි දින පැවති මහා සභා රැසවීමේ වාර්තාව සත්‍ය වාර්තාවක් බව ප්‍රකාශ කර සිටියේය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.අබේසේන මැතිතුමා:**

එම යෝජනාව ස්ථිර කරන ලදී.

ඒ අනුව 2022.12.13 වෙනි දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාවසභා සම්මත විය.

**(ආ) ගරු සභාපතිතුමාගේ නිවේදන:**

**ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

2022 වර්ෂයේ අවසන් මහා සභා රැස්වීම පැවැත්වෙන අද දිනයේදී ලබන්නා වූ 2023 වර්ෂය සියළුම මන්ත්‍රීතුමන්ලාට හා මන්ත්‍රීතුමියන්ලාට සුබම සුබ නව වසරක් වේවායි ප්‍රාර්ථනා කරන බව පවසා සිටියේය.

**(ඇ)** ප්‍රාදේශිය සභාව අමතා එවන ලද සංදේශ, පෙත්සම්, පැමිණිලි හා නිවේදන සභාවට ඉදිරිපත් කිරීම :

නැත

**(ඈ)** යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න: නැත

**(ඉ)යථා පරිදි කල් දී ඇති යෝජනා:**

**01.(i)** **ගරු සභාපති ඒ.ජී. දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

සභාවේ පොදු කාර්යයන් සඳහා වූ වියදම් වෙනුවෙන් ඇමුණුම 01 හි දැක්වෙන 2022.11.22 වෙනි දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා වාර්තාව පිළිගැනීමට හා එහි සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බව යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී එච්.අමරාවතී මැතිණිය විසින් ස්ථිර කරන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුගත් මාධව මැතිතුමා:**

පළවෙනි යෝජනාවට අදාල වාර්තාව න්‍යාය පත්‍රය සමඟ නොලැබුණු බවත් එය මේ වන විට මන්ත්‍රීවරුන් වෙත ලබා දී ඇති බවත් පවසා සිටියේය. එම වාර්තාව අධ්‍යනය කිරීමට අවශ්‍ය නිසා එයත් න්‍යාය පත්‍රය සමඟ ලබා දෙන ලෙස ඉල්ලා සිටියේය. වෙනදාට මෙය වට්ස් ඇප් සමූහයට යොමු කළත් මෙවර එය සිදු වී නොමැති බව පැවසීය.

**ගරු සභාපති ඒ.ජී. දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

එය වට්ස් ඇප් සමූහය වෙත යොමු කර ඇති බව පෙන්වා දෙන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රනිල් චන්ද්‍රකුමාර මැතිතුමා:**

න්‍යාය පත්‍රය බෙදාහරින විට කාරක සභා රැස්වීම් පවත්වා අවසන් නිසා හැකි නම් කාරක සභා වාර්තා වට්ස් ඇප් සමූහයට මෙන්ම න්‍යාය පත්‍රය සමඟ ඇමුණුමක් ලෙසද ලබා දීමට කටයුතු කරන්නේ නම් වඩාත් සුදුසු බව පෙන්වා දෙන ලදී.

**ගරු සභාපති ඒ.ජී. දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

මින් ඉදිරියට සියළුම කාරක සභා වාර්තා ඇමුණුම් ලෙස මන්ත්‍රීවරුන්ට ලබා දීමට කටයුතු කරන ලෙස උපදෙස් ලබා දෙන ලදී.

යෝජනාව බෙදීමකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

**01.(ii) ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

සභාවේ පොදු කාර්යයන් සඳහා වූ වියදම් වෙනුවෙන් ඇමුණුම 02 හි දැක්වෙන 2022 ඔක්තොම්බර් මාසයේ මාසික වියදම් සඳහා ගෙවීම් අනුමැතිය ලබා දීම සුදුසු බවට යෝජනා කරමි.

ඇමුණුමඅංක 02

**දෙහිඕවිට ප්‍රාදේශීයසභාව**

**2022 නොවැම්බර්මස 30 වනදිනතෙක් ගෙවීම් වවුචර්පත්**

| දිනය | වවුචර්පත් අංකය | විස්තරය | වටිනාකම |
|---|---|---|---|
| නොවැ: 01 | 1664 | සභාපති-දෙ/ප්‍රා/සභාව<br>ශ්‍රවණාගාරයකුලියටලබාදීමවෙනුවෙන් ලබා ගත් තැන්පත්ම මුදල ආදායමට ගැනීම.(No Cash) | 30,000.00 |
| නොවැ: 01 | 1665 | සභාපති-දෙ/ප්‍රා/සභාව<br>ශ්‍රවණාගාරය කුලියට ලබාදීම වෙනුවෙන් ලබාගත් තැන්පත් මුදල් ආදායමට ගැනීම.(No Cash) | 30,000.00 |
| නොවැ: 01 | 1666 | සභාපති-දෙ/ප්‍රා/සභාව<br>RD8018 අංක දරණ ට්‍රැක්ටරයට හෝස්බටයක් ලබාගැනීමට ගත් අත්තිකාරම් මුදල්පියවීම.(No Cash) | 1,200.00 |

| | | | |
|---|---|---|---|
| නොවැ: 01 | 1667 | මු.හා.ක-දෙ/ප්‍රා/සභාව<br>දෙ/ප්‍රා/සභාවට අයත් වාහන සඳහා වාර්ශික ආදායම් බලපත්‍ර ලබා ගැනීමට අත්තිකාරම් මුදල් ලබා ගැනීම. | 8,000.00 |
| නොවැ: 02 | 1668 | මු.හා.ක-එච්.පී.පී.සමන්කුමාර<br>සංයුක්ත දීමනා ගෙවීම. | 4,200.00 |
| නොවැ: 02 | 1669 | මු.හා.ක-ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද<br>සංයුක්ත දීමනා ගෙවීම. | 10,500.00 |
| නොවැ: 02 | 1670 | මු.හා.ක-එච්.පී.පී.සමන්කුමාර<br>2022 ඔක්තොම්බර් මස අතිකාල ගෙවීම. | 12,095.00 |
| නොවැ: 03 | 1671 | විගණකාධිපති-ජාතික විගණන කාර්යාලය<br>2021වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන විගණනය කිරීම වෙනුවෙන් විගණන ගාස්තු ගෙවීම. | 298,500.00 |
| නොවැ: 03 | 1672 | පළාත් පාලන කොමසාරිස්<br>අවි/මහේස්ත්‍රාත් අධිකරණය 2022 පෙබරවාරි සිට මැයි දක්වා උසාවි දඩමුදල් වෙනුවෙන් කාර්යමණ්ඩල දීමනා ගෙවීම. | 24,006.60 |
| නොවැ: 03 | 1673 | පළාත් පාලන කොමසාරිස්<br>අවි/මහේස්ත්‍රාත් අධිකරණය 2022 ජනවාරි සහ ජූනි උසාවි දඩමුදල් වෙනුවෙන් කාර්යමණ්ඩල දීමනා ගෙවීම. | 14,938.28 |
| නොවැ: 03 | 1674 | ශ්‍රී ලංකා ටෙලිකොම්<br>දු:අ:-036-3868934 දරණ ඊ/ආදාහනාගාරයේ දුරකථනයේ 2022/09/16-2022/10/15 දක්වා බිල්පත ගෙවීම. | 672.66 |
| නොවැ: 03 | 1675 | ශ්‍රී ලංකා ටෙලිකොම්<br>දු. අ.036-2262315 දරණ කාර්යාලීය දුරකතනයේ 2022 ඔක්තොම්බර් මස බිල්පත ගෙවීම. | 3,525.33 |
| නොවැ: 03 | 1676 | මු.හා.ක-එච්.එස්.ජී.දිනාලංකාර<br>250-4053 අංක දරණ කැබ්රථය අලුත්වැඩියා කිරීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 4,600.00 |
| නොවැ: 03 | 1677 | මු.හා.ක-එච්.එස්.ජී.දිනාලංකාර<br>250-4053 අංක දරණ කැබ් රථයට අමතර කොටස් ලබා ගැනීම වෙනුවෙන් අතින් වියදම් වූ මුදල් ගෙවීම. | 4,410.00 |
| නොවැ: 04 | 1678 | මු.හා.ක-දෙ/ප්‍රා/සභාව<br>2022/11/08 දින පැවැත්වීමට නියමිත මහා සභා රැස්වීමේ සංග්‍රහ කටයුතු සඳහා අත්තිකාරම් මුදලක් ලබා ගැනීම. | 15,000.00 |
| නොවැ: 04 | 1679 | මු.හා.ක-අයි.ඩී.ඩබ්.එස්.කුමාර<br>2022 සැප්තැම්බර් මස අතිකාල ගෙවීම. | 1,745.00 |
| නොවැ: 04 | 1680 | මු.හා.ක-අයි.ඩී.ඩබ්.එස්.කුමාර<br>2022 අගෝස්තු මස අතිකාල ගෙවීම. | 1,052.00 |
| නොවැ: 04 | 1681 | මු.හා.ක-යූ.එල්.ජී.ජයතිලක<br>සංයුක්ත දීමනා ගෙවීම. | 350.00 |
| නොවැ: 04 | 1682 | මු.හා.ක-ඩී.එල්.ආර්.සිසිරකුමාර<br>සංයුක්ත දීමනා ගෙවීම. | 350.00 |
| නොවැ: 04 | 1683 | මු.හා.ක-එම්.ඩී.සී.රුක්ෂානි<br>සංයුක්ත දීමනා (1000.00) හා ගමන් වියදම්ගෙ වීම.(360.00) | 1,360.00 |

| | | | |
|---|---|---|---|
| නොවැ: 04 | 1684 | මු.හා.ක-එච්.ගයාන් දේශප්‍රිය<br>2022 ඔක්තොම්බර් මස අතිකාල ගෙවීම. | 11,533.00 |
| නොවැ: 04 | 1685 | මු.හා.ක-ආර්.ඒ.යූ.එන්.රණසිංහ<br>නිවාඩු දින සේවයෙහි දීමනා ගෙවීම. | 4,786.00 |
| නොවැ: 04 | 1686 | මු.හා.ක-ආර්.ඒ.යූ.එන්.රණසිංහ<br>පරිවර්තිත ගමන් වියදම් ගෙවීම. | 5,000.00 |
| නොවැ: 04 | 1687 | මු.හා.ක-එච්.ඒ.ආර්.එස්.තිලකරත්න<br>පළාත් රාජ්‍ය කළමනාකරණ සේවා සංගමයේ වාර්ශික සම්මේලනයට සහභාගීවීම සඳහා හිමි වන දුම්රිය බලපත්‍ර කට්ටල සඳහා අදාල වන ගාස්තු මුදලින් ලබා ගැනීම. | 89,100.00 |
| නොවැ: 04 | 1688 | එකමුතු ගොවි සංවිධානය-යාලගම<br>යාලගම බැලවන්කන්ද මාර්ගය දුශ්කර ස්ථාන කොන්ක්‍රීට් කිරීම කර්මාන්තයේ 10% රැදවුම් මුදල් ගෙවීම. | 49,500.00 |
| නොවැ: 08 | 1689 | මු.හා.ක-එච්.පී.පී.සමන්කුමාර<br>PF7369 අංක දරණ කැබ් රථයේ A/C ෆිල්ටරය දැමීම වෙනුවෙන් අතින් වියදම් වූ මුදල් ගෙවීම. | 3,200.00 |
| නොවැ: 08 | 1690 | මු.හා.ක-එච්.එම්.එම්.ආර්.වීරසූරිය<br>ගමන් වියදම් ගෙවීම. (සංයුක්තදීමනා - 2100.00, ප්‍රවාහනදීමනා - 1298.00) | 3,398.00 |
| නොවැ: 08 | 1691 | ලේකම්-දෙ/ප්‍රා/සභාව<br>2022 නොවැම්බර් මස දෙ/ප්‍රා/සභාවේ සභික දීමනා ගෙවීම. | 795,000.00 |
| නොවැ: 08 | 1692 | එන්.කරුණාරත්න<br>දෙ/ප්‍රා/සභා කාර්යාල පරිශ්‍රය හා පොදු වෙළඳ සංකීර්ණය පිරිසිඳු කිරීම සඳහා 2022 ඔක්තෝම්බර් මස මුදල් ගෙවීම. | 85,200.00 |
| නොවැ: 08 | 1693 | ඩී.එච්.එන්.දිසානායක<br>ජලය ලබා ගැනීම සඳහා මාර්ගය පළුදු කිරීම වෙනුවෙන් තැන්පත් කල මුදල ආපසු ගෙවීම. | 3,500.00 |
| නොවැ: 08 | 1694 | සාමාන්‍යාධිකාරී ලංකා විදුලිබල මණ්ඩලය<br>ගි:අ:6312082709 දරණඉඹුල්පිටියම.පුස්තකාලයේ 2022/09/14-2022/10/15 දක්වාබිල්පතගෙවීම. | 385.00 |
| නොවැ: 08 | 1695 | සාමාන්‍යාධිකාරී ලංකා විදුලි බල මණ්ඩලය<br>ගි:අ:7991368912 දරණ මාගම්මන ආයුර්වේදයේ 2022/09/20-2022/10/18 දක්වා බිල් පත ගෙවීම. | 1,110.00 |
| නොවැ: 08 | 1696 | සාමාන්‍යාධිකාරී ලංකා විදුලිබල මණ්ඩලය<br>ගි:අ:7918009002 දරණ තල්දූව පුස්තකාලයේ 2022/09/13-2022/10/13 දක්වා බිල්පත ගෙවීම. | 985.00 |
| නොවැ: 08 | 1697 | සාමාන්‍යාධිකාරී ලංකා විදුලිබල මණ්ඩලය<br>ගි:අ:7909280106 දරණ ඊරියගොල්ල ආදාහනාගාරයේ 2022/10/02-2022/10/31 දක්වා බිල්පත ගෙවීම. | 4,241.03 |
| නොවැ: 08 | 1698 | සාමාන්‍යාධිකාරී ලංකා විදුලිබල මණ්ඩලය<br>ගි.අ.6321102601 දරණ පනාවල පෙරපාසැල් ගොඩනැගිල්ලේ 2022/09/25 සිට 2022/10/25 දක්වා බිල්පත ගෙවීම. | 794.80 |

| | | | |
|---|---|---|---|
| නොවැ: 09 | 1699 | මු.හා.ක-කේ.ජී.සී.වෙරෝනිකාගමඇතිගේ<br>පෙර පාසැල් සහය පාලිකා දීමනා ගෙවීම.(2022 ඔක්තෝම්බර්) | 15,000.00 |
| නොවැ: 09 | 1700 | ලේකම්-දෙ/ප්‍රා/සභාව<br>2022 ඔක්තෝම්බර් මස දෙ/ප්‍රා/සභාවේ කුලී පදනම මත වැටුප් ගෙවීම හා 2022 සැප්තැම්බර් මස දින 15 ක් සඳහා එම්.පී.ඩී.ජී.විජේතිලක මයාට වැටුප් ගෙවීම. | 828,659.39 |
| නොවැ: 10 | 1701 | කෑගල්ල ඩිස්ට්‍රිබියුටර්ස් ප්‍රයිවට්ලි මිටඩ්<br>රි/ආදාහනාගාරයට 37.5kg ගෑස් සිලින්ඩර් 04ක් ලබා ගැනීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 71,776.00 |
| නොවැ: 11 | 1702 | සරත් ඔටෝ ට්‍රේඩර්ස්<br>PF 7369 දරණ කැබ් රථයේ ඉදිරිපස දොරේ වීදුරුව අලුත් වැඩියා කිරීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 18,500.00 |
| නොවැ: 11 | 1703 | මු.හා.ක-ජේ.පී.ජයවර්ධන<br>ගරු සභාපතිතුමාගේ පෞද්ගලික ලේකම් ධූරයේ වැඩබැලීම වෙනුවෙන් වූ දීමනා ගෙවීම.(2022.06.19-2022.10.18 දක්වා) | 60,000.00 |
| නොවැ: 11 | 1704 | මු.හා.ක-ආර්.ඩී.සී.කරුණාරත්න<br>2022 ඔක්තොම්බර් මස අතිකාල ගෙවීම. | 3,375.00 |
| නොවැ: 11 | 1705 | මු.හා.ක-එච්.ආර්.කේ.ජයවර්ධන<br>2022 ඔක්තොම්බර් මස අතිකාල ගෙවීම. | 8,166.00 |
| නොවැ: 11 | 1706 | මු.හා.ක-ආර්.ජී.එස්.ඩී.රොෂාන්ත<br>2022 සැප්තැම්බර් මස අතිකාල ගෙවීම. | 10,390.00 |
| නොවැ: 11 | 1707 | මු.හා.ක-ඩී.එල්.ආර්.එස්.කුමාර<br>2022 ඔක්තොම්බර්මසඅතිකාලගෙවීම. | 7,475.00 |
| නොවැ: 11 | 1708 | මු.හා.ක-එම්.එල්.ඒ.කුමාර<br>2022 ඔක්තොම්බර් මස අතිකාල ගෙවීම. | 4,041.00 |
| නොවැ: 11 | 1709 | මු.හා.ක-එම්.ආර්.පී.කුමාරසිරි<br>2022 ඔක්තොම්බර් මස අතිකාල ගෙවීම. | 8,504.00 |
| නොවැ: 11 | 1710 | මු.හා.ක-එච්.එම්.එස්.නන්දකුමාර<br>2022 ඔක්තොම්බර් මස අතිකාල ගෙවීම. | 6,926.00 |
| නොවැ: 11 | 1711 | මු.හා.ක-එන්.ජී.ආර්.ටී.ගුණරත්න<br>2022 ඔක්තොම්බර් මස අතිකාල ගෙවීම. | 6,233.00 |
| නොවැ: 11 | 1712 | මු.හා.ක-එස්.පී.තිලකරත්න<br>2022 ඔක්තොම්බර් මස අතිකාල ගෙවීම. | 6,301.00 |
| නොවැ: 11 | 1713 | මු.හා.ක-කේ.කේ.එස්.ජයරුක්ෂි<br>2022 ඔක්තොම්බර් මස අතිකාල ගෙවීම. | 807.00 |
| නොවැ: 11 | 1714 | මු.හා.ක-ඩබ්.ඒ.දර්ශන කොඩිකාර<br>2022 ඔක්තොම්බර් මස අතිකාල ගෙවීම. | 5,877.00 |
| නොවැ: 11 | 1715 | මු.හා.ක-එම්.එල්.ඒ.කුමාර<br>2022 ජූලි මස අතිකාල ගෙවීම. | 2,020.00 |
| නොවැ: 11 | 1716 | මු.හා.ක-දෙ/ප්‍රා/සභාව<br>දෙ/ප්‍රා/සභාවට අයත් LF4836 දරණ වාහනය සඳහා දුම් වාර්තාව ලබා ගැනීමට අත්තිකාරම් මුදල් ලබා ගැනීම. | 2,000.00 |

| | | | |
|---|---|---|---|
| නොවැ: 14 | 1717 | සපුමල් වැඩිහිටි සමිතිය - බොරලංකඩ<br>සපුමල් ජනපදය උතුරු මඩවල පාලම අසලින් ඩබ්.ප්‍රේමරත්න මයාගේ නිවස දක්වා මාර්ගය බැකෝ යන්ත්‍රයක් මඟින් කැපීම කර්මාන්තයේ වැඩ අවසන් ගෙවීම. | 126,000.00 |
| නොවැ: 14 | 1718 | ඉඹුල් පිටිය ගොවි සංවිධානය<br>අක්කර 70 නාය ගිය ස්ථානයේ සිට ඉදිරියට කොන්ක්‍රීට් කිරීම කර්මාන්තයේ 10% රඳවුම් මුදල් ගෙවීම. | 49,500.00 |
| නොවැ: 14 | 1719 | පන්නිල ගොවි සංවිධානය<br>පන්නිල ගම්වාසම මාර්ගයේ නාගස අසල සිට ඉදිරියට සංවර්ධනය කිරීම 10% රඳවුම් මුදල් ගෙවීම. | 49,500.00 |
| නොවැ: 14 | 1720 | ආර්.යූ.දසනායක<br>250-4053 අංක දරණ කැබ් රථයට පවර් පොම්පය හා පැන්බෙල්ට් 02ක් ලබා ගැනීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 43,700.00 |
| නොවැ: 16 | 1721 | මෙත් සහන වැඩිහිටි සංවිධානය -ඇපලපිටිය<br>බැලවාන සිරි වෙදමැඳුර ඉදිරිපිට මැදිගොඩැල්ල වෙල්යාය හරහා වැටී ඇති බෝක්කුව සංවර්ධනය කිරීම කර්මාන්තයේ අවසන් ගෙවීම.(90%) | 450,000.00 |
| නොවැ: 16 | 1722 | සභාපති-දෙ/ප්‍රා/සභාව<br>දෙ/ප්‍රා/සභාවට අයත් වාහන සඳහා ආදායම් බලපත්‍ර ලබා ගැනීමට ගත්අ අත්තිකාරම් පියවීම.(No Cash) | 7,650.00 |
| නොවැ: 16 | 1723 | සභාපති-දෙ/ප්‍රා/සභාව<br>දෙ/ප්‍රා/සභාවටඅයත් LF4836 දරණ වාහනය සඳහා දුම්ව වාර්තාව ලබා ගැනීමට ගත් අත්තිකාරම් පියවීම.(No Cash) | 1,620.00 |
| නොවැ: 16 | 1724 | සභාපති-දෙ/ප්‍රා/සභාව<br>දිගලවත්ත කසල මධ්‍යස්ථානයේ තේ හා රබර් අස්වැන්න විකුණා ලද ආදායමෙන් 50% ක් ආදායමට ගැනීම.(No Cash) | 7,050.00 |
| නොවැ: 16 | 1725 | මු.හා.ක-දෙ/ප්‍රා/සභාව<br>දෙ/ප්‍රා/සභාවට අයත් LF4836 දරණ වාහනය සඳහා ආදායම් බලපත්‍ර ලබා ගැනීමට අත්තිකාරම් මුදල් ලබා ගැනීම. | 42,000.00 |
| නොවැ: 16 | 1726 | මු.හා.ක-එම්.සී.පී.කුමාරි<br>ගමන් වියදම් ගෙවීම.(සංයුක්තදීමනාව-7000.00,ප්‍රවාහන දීමනාව-2100.00) | 9,022.00 |
| නොවැ: 16 | 1727 | මු.හා.ක-එච්.එස්.ජී.දිනාලංකාර<br>තණකොල කපන යන්ත්‍රය අලුත් වැඩියා කිරීමට අතින් වියදම් වූ මුදල් ලබා ගැනීම. | 780.00 |
| නොවැ: 16 | 1728 | මු.හා.ක-එච්.එස්.ජී.දිනාලංකාර<br>QU2004 දරණ ත්‍රීවිල් රථය අලුත් වැඩියා කිරීම වෙනුවෙන් අතින් වියදම්වූ මුදල් ලබා ගැනීම. | 2,090.00 |
| නොවැ: 16 | 1729 | ලේකම්-දෙ/ප්‍රා/සභාව<br>2022 ඔක්තෝම්බර් මස එම්.සී.ආර්.විජේරත්න මයාට කුලී පදනම මත වැටුප් ගෙවීම | 36,944.55 |
| නොවැ: 16 | 1730 | ඊ.ඩබ්.සුගතදාස<br>සෞඛ්‍ය අංශයට ලබා ගත් ඉදල් වෙනුවෙන් මුදල් ගෙවීම. | 5,000.00 |

| | | | |
|---|---|---|---|
| නොවැ: 18 | 1731 | මු.හා.ක-පී.ජී.සෙනවිරත්න<br>2022 ඔක්තොම්බර් මස අතිකාල ගෙවීම. | 11,250.00 |
| නොවැ: 18 | 1732 | මු.හා.ක-එම්.එල්.ඒ.කුමාර<br>2022 සැප්තැම්බර් මස අතිකාල ගෙවීම. | 2,020.00 |
| නොවැ: 18 | 1733 | මු.හා.ක-එම්.එල්.ඒ.කුමාර<br>2022 සැප්තැම්බර් මස අතිකාල ගෙවීම. | 2,020.00 |
| නොවැ: 18 | 1734 | මු.හා.ක-ඒ.බී.හේමචන්ද්‍ර<br>2022/10/26 දින පැවති පරිසර හා පොදු පහසුකම් කාරක සභාවේ සංග්‍රහ කිරීම වෙනුවෙන් අතින් වියදම් වූ මුදල් ලබා ගැනීම. | 2,210.00 |
| නොවැ: 18 | 1735 | ශ්‍රී ලංකා ටෙලිකොම්<br>දු:අ:-036-2222575 දරණ කාර්යාලීය දුරකථනයේ 2022 ඔක්තෝම්බර් මස බිල්පත ගෙවීම. | 10,910.21 |
| නොවැ: 18 | 1736 | ශ්‍රී ලංකා ටෙලිකොම්<br>ගි.අ.94363123537 දරණ WIFI රවුටරයේ 2022 ඔක්තෝම්බර් මස බිල්පත ගෙවීම. | 1,143.33 |
| නොවැ: 18 | 1737 | ශ්‍රී ලංකා ටෙලිකොම්<br>දු. අ.036-2222534 දරණ ගරු සභාපතිතුමාගේ කාර්යාලීය දුරකතනයේ 2022 ඔක්තෝම්බර් මස බිල්පත ගෙවීම. | 9,688.23 |
| නොවැ: 18 | 1738 | ශ්‍රී ලංකා ටෙලිකොම්<br>ගි.අ.94363123540 දරණ WIFI රවුටරයේ 2022 ඔක්තෝම්බර් මස බිල්පත ගෙවීම. | 1,143.33 |
| නොවැ: 18 | 1739 | ශ්‍රී ලංකා ටෙලිකොම්<br>ගි.අ.94363123539 දරණ WIFI රවුටරයේ 2022 ඔක්තෝම්බර් මස බිල්පත ගෙවීම. | 1,143.33 |
| නොවැ: 18 | 1740 | ශ්‍රී ලංකා ටෙලිකොම්<br>ගි.අ.94363123538 දරණ WIFI රවුටරයේ 2022 ඔක්තෝම්බර් මස බිල් පත ගෙවීම. | 1,143.33 |
| නොවැ: 18 | 1741 | මු.හා.ක-කේ.එම්.ඒ.ජේ.එන්.සිරිසේන<br>ගමන් වියදම් ගෙවීම.(සංයුක්තදීමනාව-7000.00,ප්‍රවාහන දීමනාව-4800.00) | 11,800.00 |
| නොවැ: 22 | 1742 | ලේකම්-දෙ/ප්‍රා/සභාව<br>2022 ඔක්තෝම්බර් මස දෙ/ප්‍රා/සභාවේ ස්ථිර සේවක වැටුප් ගෙවීම. | 3,445,659.06 |
| නොවැ: 25 | 1743 | සී/ර බොරලංකඩ සකසුරුවම් හා ණය ගනු දෙනු සමූපාකාර සමිතිය<br>ලිපි ද්‍රව්‍ය ලබා ගැනීම වෙනුවෙන් මුදල ගෙවීම. | 26,018.50 |
| නොවැ: 25 | 1744 | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය<br>දෙ/ප්‍රා/සභාව වෙත බවුසර් මගින් ලබා ගත් ජලය සඳහා ගාස්තු ගෙවීම .(2022 මාර්තු මාසය) | 20,520.00 |
| නොවැ: 25 | 1745 | ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය<br>ගි:අ:-25/04/068/152/18 දරණ මාගම්මන ආයුර්වේදයේ 2022/09/23-2022/10/24 දක්වා බිල්පත ගෙවීම. | 450.80 |

| | | | |
|---|---|---|---|
| නොවැ: 25 | 1746 | සාමාන්‍යාධිකාරී ලංකා විදුලිබල මණ්ඩලය<br>ගි:අ:-7991487016 දරණදෙ/පැරණි සභාවේ 2022/10/07-2022/11/05 දක්වා බිල්පත ගෙවීම. | 2,046.67 |
| නොවැ: 25 | 1747 | සාමාන්‍යාධිකාරී ලංකාවිදුලි බල මණ්ඩලය<br>ගි.අ.2692684915 දරණ පනාවල මහජන පුස්තකාලයේ 2022/09/25 සිට 2022/10/29 දක්වා බිල්පත ගෙවීම. | 427.94 |
| නොවැ: 25 | 1748 | ඩබ්.ටී.නිශාන්තකුමාර<br>LL7582 අංක දරණ කැබ් රථයට ඉදිරිපස ටයර් දෙක දැමීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 127,400.00 |
| නොවැ: 25 | 1749 | දෙහිඕවිට ටයර් ට්‍රේඩින්<br>ZA0126 දරණ JCB යන්ත්‍රයට ඉදිරිපස ටයර් දෙක දැමීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 236,800.00 |
| නොවැ: 25 | 1750 | ඒ.කේ.නාලනී<br>2022 අගෝස්තු හා සැප්තැම්බර් මස පෙර පාසැල් පාලිකාව සඳහා වන දීමනා ගෙවීම. | 4,000.00 |
| නොවැ: 25 | 1751 | පෝස්ට් මාස්ටර් ජනරාල්<br>තැපැල් මුද්‍රා යන්ත්‍රයට ගාස්තු ඇතුලත් කිරීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 25,000.00 |
| නොවැ: 25 | 1752 | මු.හා.ක-ඊ.පී.එස්.සමන්ලතා<br>සංයුක්ත දීමනාව ගෙවීම. | 400.00 |
| නොවැ: 25 | 1753 | මු.හා.ක-ඊ.පී.එස්.සමන්ලතා<br>සංයුක්ත දීමනාව ගෙවීම. | 800.00 |
| නොවැ: 25 | 1754 | මු.හා.ක-එච්.ඒ.ආර්.එස්.තිලකරත්න<br>සංයුක්ත දීමනාව ගෙවීම. | 700.00 |
| නොවැ: 25 | 1755 | මු.හා.ක-ඊ.පී.එස්.සමන්ලතා<br>ගමන් වියදම් ගෙවීම.(සංයුක්තදීමනාව-800.00,ප්‍රවාහන දීමනාව-1080.00) | 1,880.00 |
| නොවැ: 25 | 1756 | එම්.ලාල් ප්‍රේමසිරි විජේරත්න<br>මාගම්මන ආයුර්වේදයේ හා පුස්තකාලභූමියේ අනතුරුදායක ගස්වල අතු කපා ඉවත්කිරීම වෙනුවෙන් මුදල්ගෙවීම. | 13,500.00 |
| නොවැ: 28 | 1757 | ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස්<br>ඊරියගොල්ල ආදාහනාගාරයේ රක්ෂණය වාර්ෂිකව අලුත්කිරීමට අදාල ගාස්තු ගෙවීම. | 53,735.03 |
| නොවැ: 28 | 1758 | මු.හා.ක-දෙ/ප්‍රා/සභාව<br>දෙ/ප්‍රා/සභාවටඅයත් PF7369 දරණ වාහනය සඳහා ආදායම් බලපත්‍ර ලබා ගැනීමට අත්තිකාරම් මුදල් ලබා ගැනීම. | 11,000.00 |
| නොවැ: 29 | 1759 | කේ.කේ.ඒ.ආර්.කුමාරසිංහ<br>දෙහිඕවිට ප්‍රා/සභාවේ වාහන සඳහා 2022 ඔක්තෝම්බර් මස ඉන්ධන සැපයීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 697,842.00 |
| නොවැ: 30 | 1760 | සභාපති-දෙ/ප්‍රා/සභාව<br>2022/11/08 දින පැවති මහා සභාවේ සංග්‍රහ කටයුතු සඳහා ලබාගත් අත්තිකාරම් මුදල් පියවීම.(No Cash) | 11,770.00 |

| | | | |
|---|---|---|---|
| නොවැ: 30 | 1761 | සභාපති-දෙ/ප්‍රා/සභාව<br>ශ්‍රවණාගාරය කුලියට ලබාදීම වෙනුවෙන් ලබා ගත තැන්පත් මුදල් ආදායමට ගැනීම.(No Cash) | 30,000.00 |
| නොවැ: 30 | 1762 | සභාපති-දෙ/ප්‍රා/සභාව<br>ශ්‍රවණාගාරය කුලියට ලබාදීම වෙනුවෙන් ලබා ගත් තැන්පත් මුදල් ආදායමට ගැනීම.(No Cash) | 10,000.00 |
| නොවැ: 30 | 1763 | සභාපති-දෙ/ප්‍රා/සභාව<br>ශ්‍රවණාගාරය කුලියට ලබාදීම වෙනුවෙන් ලබා ගත් තැන්පත් මුදල් ආදායමට ගැනීම.(No Cash) | 30,000.00 |
| නොවැ: 30 | 1764 | දේශීය ණය සහ සංවර්ධන අරමුදල<br>තල්දූව පොදු වෙළඳ සංකීර්ණය ඉදිකිරීමට දේශිය ණය සංවර්ධන අරමුදලෙන් ලබා ගත් ණය මුදලේ මුදල හා පොළී මුදල ගෙවීම.(2022 ඔක්තෝම්බර් සඳහා) | 156,136.31 |
| නොවැ: 30 | 1765 | ටෙෂ්මි ඉලෙක්ට්‍රිකල්ස්<br>වීථි පහන් සවි කිරීමට අවශ්‍ය උපකරණ මිලදී ගැනීම වෙනුවෙන් ගාස්තු ගෙවීම. | 253,500.00 |
| නොවැ: 30 | 1766 | ඒ.ජී.බී.ඊ.අටුළුගම<br>මාර්ග සිතියම් ගත කිරීමට අවශ්‍ය විදුලුත් උපකරණ මිලදීගැනීම වෙනුවෙන්මුදල්ගෙවීම. | 39,000.00 |
| නොවැ: 30 | 1767 | ඒ.ජී.බී.ඊ.අටුළුගම<br>කාර්යාලයේ කලර් මුද්‍රණ යන්ත්‍රයට කාට්ලේජ මිලදීගැනීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 16,000.00 |
| නොවැ: 30 | 1768 | නිපෝන් හාඩ්වෙයාර්<br>පැරණි වීථි පහන් ප්‍රදර්ශනය වෙනුවන් අවශ්‍ය ද්‍රව්‍ය මිලදී ගැනීම. | 2,975.00 |
| නොවැ: 30 | 1769 | නිපෝන් හාඩ්වෙයාර්<br>කාර්යාල ගොඩනැගිල්ලේ පළමු මහලට ප්‍රවේශ වන පඩි පෙල සඳහා කුඩා ගේට්ටුවක් සවි කිරීම වෙනුවෙන් ගාස්තු ගෙවීම. | 2,730.00 |
| නොවැ: 30 | 1770 | නිපෝන් හාඩ්වෙයාර්<br>QU2004 ත්‍රී රෝද රථයේ වහලය අලුත් වැඩියා කිරීමට අවශ්‍ය ද්‍රව්‍ය මිල දී ගැනීම. | 490.00 |
| නොවැ: 30 | 1771 | නිපෝන්හා ඩ්වෙයාර්<br>කාර්යාලයේ ඵලදායිතා ඒකකය සැකසීමට අවශ්‍ය උපකරණ මිලදී ගැනීම වෙනුවෙන් ගාස්තු ගෙවීම. | 7,390.00 |
| නොවැ: 30 | 1772 | නිපෝන් හාඩ්වෙයාර්<br>දිගලවත්ත කසල මධ්‍යස්ථානයේ ආරක්ෂිත වැ ට සැකසීමට අවශ්‍ය ද්‍රව්‍ය මිලදී ගැනීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 2,850.00 |
| නොවැ: 30 | 1773 | නිපෝන් හාඩ්වෙයාර්<br>ශ්‍රවණාගාරයේ ප්‍රධාන තිරය අලුත්වැඩියා කිරීමට අවශ්‍ය ද්‍රව්‍ය මිලදී ගැනීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 2,775.00 |

| | | | |
|---|---|---|---|
| නොවැ: 30 | 1774 | නිපෝන් හාඩ්වෙයාර්<br>ශ්‍රවණාගාරයේ තිර රෙදි අලුත් වැඩියාකර නැවත සවිකිරීමට අවශ්‍ය ද්‍රව්‍ය මිල දීගැනීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 5,640.00 |
| නොවැ: 30 | 1775 | නිපෝන් හාඩ්වෙයාර්<br>දෙ/ප්‍රා/සභාවේ පවතින පැරණි කැනපි හට් තහඩු හට් ලෙසට සැකසීමට අවශ්‍ය ද්‍රව්‍ය මිල දීගැනීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 4,620.00 |
| නොවැ: 30 | 1776 | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය<br>ගි:අ:-25/04/003/001/18 දරණ දෙහිඕවිට පැරණි ප්‍රා/සභා කාර්යාලයේ 2022/10/04-2022/11/03 දක්වා බිල්පත ගෙවිම. | 3,367.20 |
| නොවැ: 30 | 1777 | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය<br>ගි:අ:-25/04/002/073/13 දරණ දෙහිඕවිට පොදු ජල කණුවේ 2022/10/04-2022/11/03 දක්වා බිල්පත ගෙවිම. | 603.75 |
| නොවැ: 30 | 1778 | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය<br>ගි:අ:-25/04/067/174/14 දරණ ඊ/ආදාහනාගාරයේ 2022/09/21-2022/11/26 දක්වා බිල්පත ගෙවිම. | 402.50 |
| නොවැ: 30 | 1779 | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය<br>ගි:අ:-25/04/002/054/16 දරණ දෙහිඕවිට පොදුජල කණුවේ 2022/10/03-2022/11/02 දක්වා බිල්පත ගෙවිම. | 3,084.30 |
| නොවැ: 30 | 1780 | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය<br>ගි:අ:-10/44/108/265/16 දරණ තල්දූව පුස්තකාලයේ 2022/10/04-2022/11/04 දක්වා බිල්පත ගෙවිම. | 495.46 |
| නොවැ: 30 | 1781 | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය<br>ගි:අ:-25/04/003/035/18 දරණ දෙ/ පොදු ජල කණුවේ 2022/10/09-2022/11/08 දක්වා බිල්පත ගෙවිම. | 369.17 |
| නොවැ: 30 | 1782 | ශ්‍රී ලංකා ටෙලිකොම්<br>දු:අ:-036-2262315 දරණ කාර්යාලීයදු රකථනයේ 2022/10/16-2022/11/15 දක්වා බිල්පත ගෙවීම. | 2,666.37 |
| නොවැ: 30 | 1783 | ශ්‍රී ලංකා ටෙලිකොම්<br>දු:අ:-036-3868934 දරණ ඊ/ආදාහනාගාරයේ දුරකථනයේ 2022/10/16-2022/11/15 දක්වා බිල්පත ගෙවීම. | 662.96 |
| නොවැ: 30 | 1784 | සාමාන්‍යාධිකාරී ලංකා විදුලිබල මණ්ඩලය<br>ගි:අ:7918009002 දරණ තල්දූව පුස්තකාලයේ 2022/10/13-2022/11/11 දක්වා බිල්පත ගෙවීම. | 980.38 |
| නොවැ: 30 | 1785 | සාමාන්‍යාධිකාරී ලංකා විදුලිබල මණ්ඩලය<br>ගි:අ:6312082709 දරණ ඉඹුල්පිටිය මහජන පුස්තකාලයේ 2022/10/15-2022/11/10 දක්වා බිල්පත ගෙවීම. | 420.52 |
| නොවැ: 30 | 1786 | මු.හා.ක-දෙ/ප්‍රා/සභාව<br>සුළු මුදල් අග්‍රිමයඅලුති කිරීම. | 4,951.00 |
| නොවැ: 30 | 1787 | මු.හා.ක-ඒ.බී.හේමචන්ද්‍ර<br>සංයුක්ත දීමනා ගෙවීම. | 1,976.00 |
| නොවැ: 30 | 1788 | මු.හා.ක-ඒ.බී.හේමචන්ද්‍ර<br>සංයුක්ත දීමනා ගෙවීම. | 4,400.00 |

| | | | |
|---|---|---|---|
| නොවැ: 30 | 1789 | මු.හා.ක-එච්.එන්.ආර්.එස්.කරුණාරත්න<br>සංයුක්ත දීමනා ගෙවීම. | 2,376.00 |
| නොවැ: 30 | 1790 | මු.හා.ක-එච්.ඒ.ආර්.එස්.තිලකරත්න<br>දෙ/ප්‍රා/සභාවට අයත් මස් කඩ හා මාළු කඩ ටෙන්ඩර් දැමීම වෙනුවෙන් බැනර් මුද්‍රණය කිරීමට අදාල මුදල් ගෙවීම. | 3,420.00 |
| නොවැ: 30 | 1791 | මු.හා.ක-එච්.එන්.ආර්.එස්.කරුණාරත්න<br>සංයුක්ත දීමනා ගෙවීම. | 3,600.00 |
| නොවැ: 30 | 1792 | මු.හා.ක-එම්.ඩී.සී.රුක්ෂානි<br>නිවාඩු දින සේවයෙහි දීමනා ගෙවීම. | 4,535.50 |
| නොවැ: 30 | 1793 | මු.හා.ක-එච්.ඒ.ආර්.එස්.තිලකරත්න<br>සංයුක්ත දීමනාව ගෙවීම. | 700.00 |
| නොවැ: 30 | 1794 | මු.හා.ක-ආර්.එච්.එම්.එන්.පත්මසිරි<br>ගමන් වියදම් ගෙවීම.(සංයුක්තදීමනාව-1400.00,ප්‍රවාහන දීමනාව-760.00) | 2,160.00 |
| නොවැ: 30 | 1795 | මු.හා.ක-එම්.සී.පී.කුමාරි<br>ගමන් වියදම් ගෙවීම.(සංයුක්ත දීමනාව-1400.00,ප්‍රවාහන දීමනාව-880.00) | 2,280.00 |
| නොවැ: 30 | 1796 | සභාපති-දෙ/ප්‍රා/සභාව<br>දෙ/ප්‍රා/සභාවට අයත් LF4836 දරණ වාහනය සඳහා ආදායම් බලපත්‍ර ලබා ගැනීමට ගත්අත්තිකාරම් පියවීම හා අතින් වියදම් වූ මුදල් (135.00) ලබා ගැනීම.(No Cash) | 42,135.00 |
| නොවැ: 30 | 1797 | සභාපති-දෙ/ප්‍රා/සභාව<br>දෙ/ප්‍රා/සභාවට අයත් PF7369 දරණ කැබ් රථය සඳහා ආදායම් බලපත්‍ර ලබා ගැනීමට ගත් අත්තිකාරම් පියවීම හා අතින් වියදම් වූ මුදල් (1740.00) ලබා ගැනීම.(No Cash) | 12,740.00 |
| නොවැ: 30 | 1798 | කෑගල්ල ඩිස්ට්‍රිබියුටර්ස් ප්‍රයිවට් ලිමිටඩ්<br>ඊ/ආදාහනාගාරයට ගෑස් සිලින්ඩර් 04ක් ලබා ගැනීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 71,776.00 |
| නොවැ: 30 | 1799 | ඩබ්.ඒ.විකුම් ආනන්ද<br>2022 වර්ෂයේ සැප්තැම්බර් මස ඉඹුල්පිටිය මහජන පුස්තකාලයට ලබාගත් පුවත් පත් වෙනුවෙන් මුදල් ගෙවීම. | 1,760.00 |
| නොවැ: 30 | 1800 | ඩබ්.ඒ.විකුම් ආනන්ද<br>2022 වර්ෂයේ සැප්තැම්බර් මස දෙහිඕවිට මහජන පුස්තකාලයට ලබාගත් පුවත්පත් වෙනුවෙන් මුදල් ගෙවීම. | 4,010.00 |
| නොවැ: 30 | 1801 | ඒ.ඩී.චන්ද්‍රසේන<br>2022 වර්ෂයේ සැප්තැම්බර් මස තල්දූව මහජන පුස්තකාලයට ලබා ගත් පුවත්පත් වෙනුවෙන් මුදල් ගෙවීම. | 3,660.00 |
| නොවැ: 30 | 1802 | කේ.ඒ.පී.කුරුප්පු<br>2022 වර්ෂයේ සැප්තැම්බර් මස පනාවල මහජන පුස්තකාලයට ලබාගත් පුවත්පත් වෙනුවෙන් මුදල් ගෙවීම. | 2,710.00 |
| නොවැ: 30 | 1803 | එම්.එච්.ඩී.එස්.සුගතපාල<br>2022 වර්ෂයේ සැප්තැම්බර් මස මාගම්මන මහජන පුස්තකාලයට ලබාගත් පුවත්පත් වෙනුවෙන් මුදල් ගෙවීම. | 2,410.00 |

| | | | |
|---|---|---|---|
| නොවැ: 30 | 1804 | දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්<br>2022 වර්ෂයේ II වන කාර්තුවට අයකර ඇති මුද්දර බදු ගාස්තු ප්‍රේෂණය කිරීම. | 28,700.00 |
| නොවැ: 30 | 1805 | ගුරුගේ සර්විස්සෙන්ටර්<br>QU 2004 ත්‍රීවිල් රථය සේවා කිරීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 10,800.00 |
| නොවැ: 30 | 1806 | යූ.ඒ.ආර්.ශ්‍යාමලි<br>ජලය ලබාගැනීම සඳහා මාර්ගය පලුදු කිරීම වෙනුවෙන් තැන් පත් කල මුදල ආපසු ලබා ගැනීම. | 14,000.00 |
| නොවැ: 30 | 1807 | ගොඩගම්පලගොවිසංවිධානය<br>මීගස්තැන්නමාර්ගයේආරම්භයේසිටඉදිරියටයනවිටකොන්ක්‍රීට්කරඉතිරිවඇතිකොටසහාරබර්වත්තමැදඇතිකොටසකොන්ක්‍රීට්කිරීමකර්මාන්තයේ 30% රුදවුම්මුදල්ගෙවීම. | 148,500.00 |
| නොවැ: 30 | 1808 | මු.හා.ක-එච්.පී.පී. සමන් කුමාර<br>මාගම්මන ඉන්ධන පිරවුම්හලින් PF7369 කැබ් රථය සඳහා ඉන්ධන ලබා ගැනීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 21,500.00 |
| නොවැ: 30 | 1809 | මු.හා.ක-එම්.සී.පී.කුමාරි<br>2022/10/07 දින පැවති විගණන කමිටුවේ නිලධාරීන්ට සංග්‍රහ කිරීම වෙනුවෙන් අතින් වියදම් වූ මුදල් ලබා ගැනීම. | 675.00 |
| නොවැ: 30 | 1810 | මු.හා.ක-එම්.සී.පී.කුමාරි<br>2022/09/27 හා 28 දිනයන්හි සභාවට පැමිණි විගණන නිලධාරීන්ට සංග්‍රහ කිරීම වෙනුවෙන් අතින් වියදම් වූ මුදල ලබා ගැනීම. | 680.00 |
| | | | **9,129,179.82** |
| නොවැ: 28 | 22 | සේවකණය - එම්.ඒ.පී.හංසමාලි<br>ආපදා ණය අත්තිකාරම් ගෙවීම. | 250,000.00 |
| | | **එකතුව** | **9,379,179.82** |

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.අබේසේන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

යෝජනාව බෙදීමකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

**01.(iii) ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

අක්කර බදු සතොෘක්ෂණයේදී අනාවරණය වූ වල්පොල වසමෙහි කිසිදු තොරතුරක් සොයාගත නොහැකි වූ දේපල, නිශ්චිත භූමි ප්‍රමාණයක් නොමැති දේපල, ලේඛනයේ ස්ථාන දෙකක ලියාපදංචි වී ඇති දේපල, බෙදුම් නඩුවක් නිසා ගෙවීම් ප්‍රතික්ෂේප කරන දේපල, ලේඛනයේ ඉඩමේ නම සහ භූමි ප්‍රමාණය සඳහන්ව නොමැති දේපල යන කරුණු මත ඇමුණුම 03 හි සඳහන් ඒකක 33 කට අයත් දේපල අක්කර බදු ලේඛනයෙන් ඉවත් කිරීමටත් 2022.12.31 දින දක්වා ශේෂය වන රු.47244.44 ක මුදල කපා හැරීමත් සුදුසු බව යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී යූ.ආර්.ඒ.සී.කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

යෝජනාව බෙදීමකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

**01.(iv) ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

පුස්තකාල සේවය නව්‍යකරණය සහ කාර්යක්ෂමතාව තුළින් සාම්ප්‍රදායිකව ක්‍රියාත්මක වන පුස්තකාල සේවාව නවීකරණය කර බල ප්‍රදේශයේ ජනතාවගේ දැනුම හා ආකල්ප වර්ධනය කිරීම, සාමාජික ප්‍රවර්ධන වැඩසටහන් මඟින් සභාවේ ආදායම් උත්පාදක ව්‍යාපෘතියක් ලෙස පුස්තකාල සේවාව යොදාගෙන පළාත් පාලන ආයතන වඩාත් කාර්යක්ෂම සේවාවක් සපයන ආයතන බවට පත් කිරීමේ අරමුණින් දෙහිඕවිට ප්‍රාදේශීය සභාවේ මහජන පුස්තකාලය සඳහා ඉ- මහජන පුස්තකාලය (E – public library) සහ පුස්තකාල කළමනාකරණ පද්ධතිය(E-Library Management System) හඳුන්වා දීමට අදාල ව්‍යාපෘති වාර්තාව සඳහා අනුමැතිය ලබා දීමටත්, එම ව්‍යාපෘතිය ආරම්භ කිරීම සඳහා අපේක්ෂිත මූලික පිරිවැය ඇස්තමේන්තුවට අදාල රු. 450,000.00 ක මුදල සභා අරමුදලින් වැය කර අදාල ව්‍යාපෘතිය ආරම්භ කිරීමටත්, ව්‍යාපෘතියට අදාල මෘදුකාංගය වාර්ෂිකව යාවත්කාලීන කරමින් පවත්වාගෙන යාමේ පිරි වැය සභා අරමුදලින් වියදම් දැරීම සඳහාත් අනුමැතිය ලබා දිම සුදුසු බව යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී.එච්.අමරාවතී මැතිණිය විසින් ස්ථිර කරන ලදී.
යෝජනාව බෙදීමකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

**01.(v) ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

දෙහිඕවිට ප්‍රාදේශීය සභාවට අයත් පොදු වැසිකිළි ටෙන්ඩර් පදනම මත ලබා දීමේදී එම වැසිකිළි වලට අදාල ජල බිල්පත් ගෙවීමේ කාර්යයට සම්බන්ධව අදාල ටෙන්ඩර්කරු සමඟ අත්සන් කරනු ලබන ගිවිසුම් පත්‍රයේ කොන්දේසි යටතට පහත දක්වා ඇති වගන්තිය ඇතුළත් කර 2023 වර්ෂයේ සිට එම ගිවිසුම් පත්‍ර සකස් කිරීම සුදුසු බව යෝජනා කරමි.

- පොදු වැසිකිළි පවිත්‍ර කිරීමේ කාර්යයන් සඳහා ලබා ගන්නා ජලයට අදාල ජල බිල්පත ටෙන්ඩර්කරු විසින් ගෙවිය යුතුය.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී නීතා බාලසූරිය මැතිණිය විසින් ස්ථිර කරන ලදී.
යෝජනාව බෙදීමකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

**01.(vi) ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

දෙහිඕවිට ප්‍රාදේශීය සභාවේ 2023 වර්ෂය සඳහා වූ අභ්‍යන්තර විගණන සැලසුම (අර්ධ වාර්ෂික) සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බව යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.අබේසේන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

යෝජනාව බෙදීමකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

**01.(vii) ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

සබරගමු පළාත් පාලන කොමසාරිස්ගේ අංක CLG/1/15/21 සහ 2018.10.19 දිනැති ලිපියේ උපදෙස් පරිදි විගණන හා කළමනාකරණ කමිටු පැවැත්විය යුතු අතර 2023 වර්ෂය සඳහා අදාල වන පරිදි නව කමිටු සාමාජිකයින් පත් කර ගැනීම සුදුසු බවට හා 2023 වර්ෂයේදී පහත පරිදි දක්වා ඇති දිනයන් වල විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීම සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට යෝජනා කරමි.

**<u>විගණන හා කළමනාකරණ කමිටුව - 2023</u>**

1.පළාත් පාලන ආයතනයේ සභාපති - ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා (කමිටු සභාපති)

2.පළාත් පාලන ආයතනයේ ලේකම් - එම්.ඩී.සී.රුක්ෂානි මිය (කමිටු ලේකම්)

3.පළාත් පාලන ආයතනයේ ගිණුම් නිලධාරී - ආර්.එච්.එම්.එන්.පත්මසිරි මිය (කමිටු සාමාජික)

4.පළාත් පාලන ආයතනයේ ආදායම් පරීක්ෂක - බී.ඩී.ටී.ටී .ප්‍රේමරත්න මිය (කමිටු සාමාජික)

5.විගණන විෂය භාර නිලධාරි - එම්.සී.පී.කුමාරි මිය (කමිටු සාමාජික)

6.පළාත් පාලන ආයතනයේ අංශ ප්‍රධානීන් -එච්.ඒ.ආර්.එස්.තිලකරත්න මයා - ආයතනික අංශය(කමිටු සාමාජික)
- ආර්.එච්.එම්.එන්.පත්මසිරි මිය - ගිණුම් අංශය (කමිටු සාමාජික)
-කේ.ජී.කේ.තිලකරත්න මෙ/ය - ආදායම් අංශය (කමිටු සාමාජික
-ආර්.ඒ.යූ.එන් .රණසිංහ මයා - සංවර්ධන අංශය (කමිටු සාමාජික)

7.වෙනත් අවශ්‍ය නිලධාරීන් -ඒ.එම්.කේ.කේ.අත්තනායක මිය (කමිටු සාමාජික)
-බී.එස්.එස්.කුමාරි මිය(කමිටු සාමාජික)
-එච්.එන්.ආර්.එස්.කරුණාරත්න මයා (කමිටු සාමාජික)
-කේ.ජී.පී.එල්.සෝමවීර මිය (කමිටු සාමාජික)

8.ප්‍රජා සංවර්ධන නිලධාරී/ විමර්ශන නිලධාරි - නම් කරන ලද නිලධාරියෙකු (කමිටු නිරීක්ෂක)

9.සබරගමු පළාත් අභ්‍යන්තර විගණන නිලධාරී - නම් කරන ලද නිලධාරියෙකු (කමිටු නිරීක්ෂක)

10.විගණකාධිපති දෙපාර්තමේන්තු නිලධාරීන් - නම් කරන ලද නිලධාරියෙකු (කමිටු නිරීක්ෂක)

11.වෙනත් අවශ්‍ය නිලධාරීන් - නම් කරන ලද නිලධාරියෙකු (කමිටු නිරීක්ෂක)

03.මෙම කමිටුවේ රැස්වීම් කාලසටහන

| කාර්තුව | දිනය | වේලාව | ස්ථානය |
|---|---|---|---|
| 1 වන කාර්තුව-2023 | 2023.03.30 | පෙ.ව.10.30 | දෙහිඕවිට ප්‍රාදේශීය සභා ශ්‍රවණාගාරය |
| 2 වන කාර්තුව-2023 | 2023.06.30 | පෙ.ව.10.30 | දෙහිඕවිට ප්‍රාදේශීය සභා ශ්‍රවණාගාරය |
| 3 වන කාර්තුව-2023 | 2023.09.27 | පෙ.ව.10.30 | දෙහිඕවිට ප්‍රාදේශීය සභා ශ්‍රවණාගාරය |
| 4 වන කාර්තුව-2023 | 2023.12.27 | පෙ.ව.10.30 | දෙහිඕවිට ප්‍රාදේශීය සභා ශ්‍රවණාගාරය |

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී එච්.අමරාවතී මැතිණිය විසින් ස්ථිර කරන ලදී.

යෝජනාව බෙදීමකින් තොරව ඒකමතිකව සහා සම්මත විය.

**01.(viii) ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

දෙහිඕවිට ප්‍රාදේශීය සභාවේ 2022 – 2026 සිව් වාර්ෂික සැලැස්මෙ 2023 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම සඳහා මහා සභා අනුමැතිය ලබා දීම සුදුසු බව යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී තුෂාර සංජීව මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

යෝජනාව බෙදීමකින් තොරව ඒකමතිකව සහා සම්මත විය.

**01.(ix) ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ iv වන කොටසේ මහජන සෞඛ්‍ය පොදු පරිපාලන අධිකාරිය ප්‍රාදේශීය සභාව වන හෙයින් ඒ සඳහා පැවරී ඇති කාර්යයන් ක්‍රියාත්මක කිරීම සඳහා මහජන සෞඛ්‍ය පිළිබඳව ප්‍රමාණවත් දැනුමක් හා පුහුණුවක් ඇති පහත 01 උප ලේඛනයේ සඳහන් නිලධාරීන් හට උප ලේඛනයේ වැඩිදුරටත් සඳහන් කරනු ලබන ප්‍රදේශ තුළ ප්‍රාදේශීය සභාව හෝ සභාපතිවරයා හෝ වෙත පැවරී ඇති මහජන සෞඛ්‍ය බලතල 02 උප ලේඛනයේ සඳහන් පනත්, ආඥා පනත් හා අතුරු ව්‍යවස්ථාවල බලතල ප්‍රාදේශීය සභාවේ සහ සභාපතිවරයාගේ පාලනයට හා අනුමැතියට යටත්ව 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 8 (2) වගන්තිය සහ ඒ හා සමඟ කියවිය යුතු 216 වගන්තිය ප්‍රකාරව මහජන සෞඛ්‍ය කටයුතු වලට අදාල කාර්යයන් ක්‍රියාත්මක කිරීම සඳහා අධිකාරිය හා බලය පැවරීම සුදුසු බව යෝජනා කරමි.

<u>**උප ලේඛන 01**</u>

| අනු අංකය | නිලධාරියාගේ නම සහ තනතුර | බලය පවරනබල ප්‍රදේශය |
|---|---|---|
| 1 | එම්.ර්.කේ.අයිරාජ් මයා - සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී | දෙහිඕවිට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය |
| 2 | වී.බී.සී.ධර්මසේන මයා - පරිපාලන මහජන සෞඛ්‍ය පරීක්ෂක | දෙහිඕවිට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය |
| 3 | ටී.ඩී.එන්.උද්දික මයා - මහජන සෞඛ්‍ය පරීක්ෂක | දෙහිඕවිට මහජන සෞඛ්‍ය පරීක්ෂක කොට්ඨාසය |
| 4 | එම්.එම්.පී.රුද්‍රිගු මයා - මහජන සෞඛ්‍ය පරීක්ෂක | ගොඩගම්පල මහජන සෞඛ්‍ය පරීක්ෂක කොට්ඨාසය |
| 5 | කේ.ඒ.සමරසිංහ මයා - මහජන සෞඛ්‍ය පරීක්ෂක | තල්දූව මහජන සෞඛ්‍ය පරීක්ෂක කොට්ඨාසය |
| 6 | කේ.ජී.ටී.බී.ප්‍රියදර්ශන මයා - මහජන සෞඛ්‍ය පරීක්ෂක | බටංගල මහජන සෞඛ්‍ය පරීක්ෂක කොට්ඨාසය |
| 7 | එම්.ඒ.ප්‍රදීප් මානතුංග මයා - මහජන සෞඛ්‍ය පරීක්ෂක | පනාවල මහජන සෞඛ්‍ය පරීක්ෂක කොට්ඨාසය |
| 8 | ජේ.ඒ.එච්.ටී.ජයකොඩි මයා - මහජන සෞඛ්‍ය පරීක්ෂක | වල්පොල මහජන සෞඛ්‍ය පරීක්ෂක කොට්ඨාසය |

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී නීතා බාලසූරිය මැතිණිය විසින් ස්ථිර කරන ලදී.

යෝජනාව බෙදීමකින් තොරව ඒකමතිකව සහා සම්මත විය.

**01.(x) ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

මෙම සභාවේ සේවා ගිවිසුම් මත සේවය කරනු ලබන පහත උපලේඛනයේ නම් සඳහන් සේවක මහතුන්ගේ ගිවිසුම්ගත කාලය අවසන් වීමට නියමිත බැවින් උපලේඛනයේ සඳහන් දින සිට ඉදිරි වර්ෂයක කාලයක් සඳහා නැවත දීර්ඝ කිරීම සුදුසු බව යෝජනා කරමි.

| අනු අංකය | සේවකයාගේ නම | තනතුර | ගිවිසුම අවසන් වන දිනය |
|---|---|---|---|
| 01 | කේ.භාරත නිර්මාල්මයා | සෞඛ්‍ය කම්කරු | 2020. 01.03 |
| 02 | ඩී.එස්.එම්.එන්.දිල්හානි මිය | වැඩ/ක්ෂේත්‍ර කම්කරු | 2020. .01.09 |
| 03 | එම්.ඒ.සේනාරත්න | සෞඛ්‍ය කම්කරු | 2021.01.08 |
| 04 | අරුණ කුමාර රාජපක්ෂ | සෞඛ්‍ය කම්කරු | 2021.01.22 |

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එස්.එම්.නිමල් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

යෝජනාව බෙදීමකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

**01.(xi) ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

2023 වර්ෂය සඳහා සකස් කරන ලද වාර්ෂික පුහුණු සැලැස්ම සහ 2023 වර්ෂයට අදාලව සකස් කර ඇති කාර්ය සාධන සැලැස්ම සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බව යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.අබේසේන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

යෝජනාව බෙදීමකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

**01.(xii) ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

පහත සඳහන් කර්මාන්තය ප්‍රාදේශීය සභාවේ පොදු අරමුදලින් ප්‍රතිපාදන වෙන් කර ක්‍රියාත්මක කිරීමටත් ඒ සඳහා වන වියදම සභා අරමුදලින් දැරීමත් සුදුසු බව යෝජනා කරමි.

- දීගලවත්ත කසළ කළමනාකරණ මධ්‍යස්ථානයේ ප්‍රධාන ගොඩනැගිලි දෙක අතර වහලේ දිරා ඇති ප්‍රධාන වැහි පීලි නැවත සවි කිරීම. - රු. 104223.60

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී යූ.ආර්.ඒ.සී.කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනිමල් රාජපක්ෂ මැතිතුමා:**

මේ සභා වාරය ආරම්භ කළ දිනයේ සිට අද දක්වාම වරින් වර දීගලවත්ත කසළ කළමනාකරණ මධ්‍යස්ථානයට අලුතින් කොටස් එකතු කිරීමට හෝ තිබෙන කොටස් අලුත්වැඩියා කිරීම සඳහා යෝජනා ගෙන ආ බවත් මේ සභා වාර්ය ආරම්භයේදී මෙම කසළ මධ්‍යස්ථානය අවට ජනතාවට තර්ජනයක් බැවින් එය වෙනත් සුදුසු ස්ථානයක ස්ථාපිත කිරීම සුදුසු බවට මේ සභාවේ මන්ත්‍රීවරු විසින් එකඟ වූ බවත් පවසා සිටියේය. එසේ තිබියදී වරින් වර මේ සඳහා කොටස් එකතු කිරීම සුදුසු නොවන බවත් එලෙස යම් සංවර්ධන කාර්යක් සිදු කරන්නේ නම් එය අදාල ගොඩනැගිල්ල පිහිටි වසමේ ඇති සමිතියක් මඟින් සිදු කර නොගෙන ගුරුගල්ල ආදි ප්‍රදේශ වල සමිති සඳහා එම අවස්ථා ලබා දීම අනුමත කළ නොහැකි බවත් පවසා සිටියේය. එම නිසා ඉදිරියේදී මේ ගොඩනැගිල්ලට අලුතින් කොටස් එකතු කිරීමට කටයුතු නොකරන ලෙස ඉල්ලා සිටියේය.

**ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

දීගලවත්ත කසළ කළමනාකරණ මධ්‍යස්ථානයේ ප්‍රධාන ගොඩනැඟිලි දෙක අතර වහලේ වැහිපිහිලි දිරා යාම හේතුවෙන් වර්ෂා දිනවල එම කසළ තෙමීමට ලක් වන බවත් වැසි ජලය කසළ සමඟ මිශ්‍ර වී ගම්මානයට එකතු වීමට ඉඩ ඇති බැවින් එය වහා ප්‍රතිසංස්කරණය කළ යුතු බවත් පෙන්වා දෙන ලදී. ෙම් සඳහා අවශ්‍ය වන වැහි පිහිලි ලබා ගැනීමට වැය වන මුදල් පමණක් ඇස්තමේන්තුවට ඇතුලත් කර ඇති බවත් සභාවේ කම්කරුවන් යොදාගෙන මේ කාර්ය සිදු කිරීමට අපේක්ෂා කරන බවත් පවසා සිටියේය.

යෝජනාව බෙදීමකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

**01.(xiii) ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

දෙහිඕවිට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ 2022 වර්ෂයට පෙර පවත්වාගෙන ගිය නමුත් 2022 වර්ෂයේ සිට වසා ඇති පහත උපලේඛනයේ ඇති ව්‍යාපාර ව්‍යාපාර නාම වෙළඳ බලපත්‍ර හා කර්මාන්ත බදු ලේඛනයෙන් කපා හැරීමටත් 2022.12.31 දින දක්වා ඇති හිඟ ශේෂය වන රු.26,000.00 ක මුදල අදාල ලේඛනයෙන් කපා හැරීමටත් සුදුසු බව යෝජනා කරමි.

| අනු අංකය | අයිතිකරුගෙනම | ව්‍යාපාරය | ලිපිනය |
|---|---|---|---|
| 1 | කෙ.ඒ.කමලවතී මිය | සිල්ලර වෙළදාම | ඊ 32/සී, තලපිටිය, පනාවල |
| 2 | අයි.එල්.එම්.මුක්තාර්මයා | ප්ලාස්ටික්භාණ්ඩ අලෙවිය | නාපාවල,අවිස්සාවේල්ල |
| 3 | එම්.එම්.ඉස්මතුල්ලාමයා | සිල්ලරවෙළදාම | 168, නාපාවල, අවිස්සාවේල්ල |
| 4 | එම්.එච්.එම්.ෆාරුක්මයා | සිල්ලරවෙළදාම | ෆාරුක්ස්ටෝර්ස්, නාපාවල, අවිස්සාවේල්ල |
| 5 | ජයන්ත ඉලුක්පිටිය මයා | සිමෙන්ති ගල් වැඩපල | නො. 688/1ඒ, තල්දූව, අවිස්සාවේල්ල. |
| 6 | වී.ධර්මරත්න මයා | ආපන ශාලාව | උපාලි ටී රූම්,නො. 491, කෑගල්ල පාර, තල්දූව, අවිස්සාවේල්ල |
| 7 | බී.වීරසිංහ මයා | පළතුරු වෙළදාම | යටියන්තොට පාර,තල්දූව,අවිස්සාවෙල්ල |
| 8 | කේ.ආර්.රාජකරුණා මයා | පළතුරු වෙළදාම | 821, තල්දූව, අවිස්සාාවේල්ල |
| 9 | ආර්.පී.ජී.රාජපක්ෂ මයා | ලැගුම්හල | 213,තල්දූව,අවිස්සාවේල්ල |
| 10 | එච්.වී.එල්.එම්.කුමාරසිංහ මයා | මාළු කඩය | තල්දූව සති පොළ |
| 11 | එච්.එම්. ඉරෙෂා දීපානි මිය | ස්විට් කෑම අලෙවිය | 533, ගුරුගල්ල පාර, තල්දූව, අවිස්සාවේල්ල |
| 12 | කේ.ශ්‍රියාලතා මිය | තේ කඩය | නො. 694/2, වත්තේ කඩේ, තල්දූව, අවිස්සාවේල්ල |
| 13 | එම්.ඒ.චන්ද්‍රකුමාර මයා | කෑම වර්ග අලෙවිය | සියරස, අම්තිරිගල පාර, තල්දූව, අවිස්සාවේල්ල |
| 14 | කේ.එම්.ඉඳුනිල් ප්‍රියන්ත අමුකොටුව මයා | ආයුර්වේද වෛද්‍ය මධ්‍යස්ථානය | සුව අරණ පංච කර්ම මධ්‍යස්ථානය, නො. 250/2, යටියන්තොට පාර, තල්දූව, අවිස්සාවේල්ල |

| | | | |
|---|---|---|---|
| 15 | එස්.එම්.සිරාජ් මයා | හාඩ්වෙයාර් ව්‍යාපාරය | එස්.එෆ්.ඉලෙක්ට්‍රික් ඇන්ඩ් හාඩ්වෙයාර්, නො. 979, තල්දූව, අවිස්සාවේල්ල. |
| 16 | එල්.ආර්.ඩී.දීපිකා කරුණාරත්න මිය | ග්‍රොසරි ව්‍යාපාරය | එෆ් /87/1, කහනාවිට, දෙහිඕවිට |
| 17 | එම්.සවුපදි පුෂ්පකුමාරි | සිල්ලර වෙළඳාම | කහංකොටුව,බොරලංකඩ,දෙහිඕවිට |
| 18 | බී.කේ.ජයසේකර මයා | රබර් ඔට්ටපාලු වෙළඳාම | ඉඹුල්පිටිය, |
| 19 | එම්.කෙ.රසිකා නන්දසෙන මිය | ගෘහ විදුලි උපකරණහා පාසල්උපකරණ | ඒ144/2, මානියංගම, අවිස්සාවේල්ල |
| 20 | රාමසාමි තන්ගවේළු | විවිධ ආහාර ද්‍රව්‍යය | සී/127/2,වෙලන්ගල්ල ,ගැටහැත්ත |
| 21 | සම්පත්සිසිර තරුණාරත්න | ගොඩනැගිලිද්‍රව්‍යවිකිනීම | එස්.එන්.හාඩ්වෙයාර්,වෙලන්ගල්ල,මානියංගම, අවිස්සාවේල්ල |
| 22 | ඩී.ජී.එන්.චතුරානි ධර්මරත්න මිය | බයිට්වර්ග පැකට් කිරීම | සී 72/7, වෙගන්ගල්ල, ගැටහැත්ත |
| 23 | ඩබ්.එම්.එන්.දමයන්තිසෙනෙවිරත්න මිය | සිල්ලරවෙළඳාම | බී 15/1, මුරුත්තෙට්ටුව , දෙහිඕවිට |
| 24 | ඩී.ජී.කේ.සී.විමලරත්නමයා | සිල්ලරවෙළඳාම | බී/35, මුරුත්තෙට්ටුව, දෙහිඕවිට |
| 25 | එන්.පී.අයි.කීර්තිරණතුංග මයා | සිල්ලර වෙළඳාම | ලක්මාලිස්ටෝර්ස්, ඊ/217, අටුළුගම, දෙහිඕවිට |
| 26 | ජගත්සෙනෙවිරත්න මයා | ආපන ශාලාව | සෙනෙවිරත්නහෝටලය, අටුළුගම, |
| 27 | ජී.ආර්.පී.ගම්ලත්මයා | සිල්ලර වෙළඳාම | 217/බී, දෙබෑලම පාර,අටුළුගම |

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී සඳමාලි විජේරත්න මැතිණිය විසින් ස්ථිර කරන ලදී.

යෝජනාව බෙදීමකින් තොරව ඒකමතිකව සහා සම්මත විය.

**01.(xiv) ගරු සභාපති ඒ.ජී.දම්මු ශ්‍යාමින්ද මැතිතුමා:**

2023 වර්ෂයට වරිපනම් බදු පැනවීමට අදාල යෝජනාව 2022.09.06 වෙනි දින මහා සභ රැස්වීමට ඉදිරිපත් කර අනුමැතිය ලබා ගත් පසු 2018 නව වරිපනම් තක්සේරුව 2023 වර්ෂය වන විට ක්‍රියාත්ම කිරීම අවශ්‍ය බැවින් ඒ අනුව 2023 වර්ෂය සඳහා 2018 නව තක්සේරුවට අනුව වරිපනම් පැනවීම සඳහා 2022.10.11යෝජනා අංක 01(xi) යටතේ වරිපනම් බදු පැනවීම සිදු කිරීමට මහා සභා අනුමැතිය ලබා දෙන ලදී. එසේ වුවද ගරු ආණ්ඩුකාර ලේකම්ගේ GS/ES/06/14/03/11හා2022.10.13 දිනැති ලිපිය මඟින් 2023.12.31 දින දක්වා නව වරිපනම් පැනවීම් සිදු නොකරන ලෙස දැන්වීම හේතුවෙන් නැවත 2022.11.08 මහා සභාවේ තීරණ අංක 01(iv) මඟින් 2022.10.11 මහා සභාවේදී සම්මත කරන ලද 2018 නව තක්සේරුවට අනුව වරිපනම් බදු පැනවීමේ යෝජනාව පරිච්ඡින්න කර 2012 පැරණි තක්සේරුවට අනුව වරිපනම් බදු පැනවීම සඳහා යෝජනාවක් තීරණ අංක 01(v) යටතේ සභා සම්මත කර ගැසට් පත්‍ර මුද්‍රණය සඳහා යවන ලදී. ඉන් පසු නැවත 2022.11.17 දින සබරගමුව

පළාත් පාලන කොමසාරිස්ගේ CLG/LG/5/3/1 (iii) අංක දරණ ලිපියෙන් 2023.12.31 දින දක්වා නව වරිපනම් බදු පැනවීම කල් දැමීම සඳහා ලබා දුන් අනුමැතිය අවලංගු කර ඇති බව දන්වා ඇත. 2022.10.11 මහා සභාවේදී 2012 පැරණි තක්සේරුවට අනුව වරිපනම් බදු පැනවීම සඳහා අනුමැතිය හිමි වූ පසු 2023 වර්ෂය සඳහා නව තක්සේරු වාර්තා බෙදා හැරීම මේ වන විට ආරම්භ කර අදාල වරිපනම් ගාස්තු අය කිරීමේ කටයුතු මේ වනසිදු කරමින් පවතී. එබැවින් නව තක්සේරුව ක්‍රියාත්මක කිරීම සඳහා වන අනුමැතිය ගරු ආණ්ඩුකාරතුමාගෙන් ලබා ගැනීම, අදාල  දත්ත මෘදුකාංගයට ඇතුලත් කිරීම , ඒකක 5076 ක නව තක්සේරු නිවේදන මුද්‍රණය කිරීමට ප්‍රමාණවත් කාලයක් නොමැති වීම, නව තක්සේරුවට අනුව වරිපනම් ගාස්තු සඳහා වට්ටම් කාල සීමා ලබා දිමට ප්‍රමාණවත් කාලයක් නොමැති වීම යන කරුණු හේතුවෙන්  2018 නව තක්සේරුවට අනුව වරිපනම් බදු පැනවීම 2024 වර්ෂය දක්වා කල් දැමීමටත් 2023 වර්ෂය සඳහා 2012 පැරණි තක්සේරුවට අනුව වරිපනම් ගාස්තු අය කිරීම ඒ ආකාරයෙන්ම  සිදු කිරීමත් සුදුසු බවට යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී සඳමාලි විජේරත්න මැතිණිය විසින් ස්ථිර කරන ලදී.

යෝජනාව බෙදීමකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

**01.(xv) ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

**<u>2023 වර්ෂය සඳහාමුදල්හාප්‍රතිපත්තිකාරකසභාව:</u>**

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 12 (1) වගන්තිය අනුව හා ඒ සමඟ කියවෙන 12 (2) ට අනුව දෙහිඕවිට ප්‍රාදේශීය සභාවේ ආදායම් උත්පාදනය, වත්කම් ඇති කිරීම හා ආරක්ෂා කිරීම, මූල්‍ය පරිපාලනය විධිමත් කිරීම,ගෙවීම් වලට අදාල උපදෙස් සැපයීම හා ගෙවීම් අනුමත කිරීම යන කරුණු සම්බන්ධයෙන් මහා සභාව වෙත උපදෙස් ලබා දීම සඳහා පහත නම් සඳහන් සභිකයන්ගෙන් යුත් මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාවක් 2023 වර්ෂය සඳහා පත් කිරීමටත් එමෙන්ම ඉහත කී ප්‍රාදේශීය සභා පනතේ 216 වගන්තිය ප්‍රකාරව මෙම කාරක සභාව සඳහා රුපියල් ලක්ෂ 10 දක්වා වූ වියදම් සඳහා බැඳීමට බලය දීමට සහ වියදම් අනුමත කිරීමට බලය පැවරීම සුදුසු බවටත් යෝජනා කරමි.

**2023 වර්ෂය සඳහාමුදල්හාප්‍රතිපත්තිකාරකසභාව:**

01. ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා - කාරක සභා සභාපති
02. ගරු උප සභාපති විමුක්ති කුමාර ජයරත්න මැතිතුමා - සාමාජික
03. ගරු ප්‍රාදේශීය මන්ත්‍රී අමිල කන්දෙආරච්චි මැතිතුමා - සාමාජික
04. ගරු ප්‍රාදේශීය මන්ත්‍රී ඩබ්.අබේසේන මැතිතුමා - සාමාජික
05. ගරු ප්‍රාදේශීය මන්ත්‍රී සෙස්ටස් අර්සකුලරත්න මැතිතුමා - සාමාජික
06. ගරු ප්‍රාදේශීය මන්ත්‍රී යූ.ජී.සරත් විජේසිරි මැතිතුමා - සාමාජික
07. ගරු ප්‍රාදේශීය මන්ත්‍රී ලක්මාල් සමරරත්න මැතිතුමා - සාමාජික
08. ගරු ප්‍රාදේශීය මන්ත්‍රී එම්.එම්.එම්. ෆර්හාන් මැතිතුමා - සාමාජික
09. ගරු ප්‍රාදේශීය මන්ත්‍රී විකුම් චන්දන කස්තිරගේ මැතිතුමා - සාමාජික
10. ගරු ප්‍රාදේශීය මන්ත්‍රිනී සුධර්මා ලක්මාලි මැතිණිය - සාමාජික

දෙහිඕවිට ප්‍රාදේශීය සභාවේ ලේකම් එම්.ඩී.සී.රුක්ෂානි මහත්මිය - කාරක සභා ලේකම්

ඩබ්.එස්.කේ.වර්ණපුර මිය - විෂය නිලධාරී

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීඩබ්.අබේසේන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

යෝජනාව බෙදීමකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

**01.(xvi) ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

**<u>2023 වර්ෂය සඳහා නිවාස හා ප්‍රජා සංවර්ධන කාරක සභාව</u>**

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 12 (1) වගන්තිය අනුව හා ඒ සමඟ කියවෙන 12 (2) ප්‍රකාරව දෙහිඕවිට ප්‍රාදේශීය සභාවේ පුස්තකාල, පෙර පාසල්, නිවාස හා ප්‍රජා සංවර්ධන කාර්යයන්, අනවසර ඉදි කිරීම්,වීථි ලාම්පු සවි කිරීම ආදී පොදු උපයෝගිතා සේවා සම්බන්ධ කටයුතු විධිමත් කිරීම සම්බන්ධයෙන් ගැටළු නිරාකරණය හා අධීක්ෂණ කාර්යයන් ඉටු කිරීම සඳහා සහ මහා සභාව වෙත එකී කාර්යයන් සම්බන්ධයෙන් උපදෙස් දීම සඳහා පහත නම් සඳහන් සභිකයන්ගෙන් යුත් නිවාස හා ප්‍රජා සංවර්ධන කාරක සභාවක් 2023 වර්ෂය සදහා පත් කිරීමටත් මෙම කාරක සභාව වෙත ඉහත කාර්යයන් ඉටු කිරීමට බලය පැවරීම සුදුසු බවටත් යෝජනා කරමි.

**2023 වර්ෂය සඳහා නිවාස හා ප්‍රජා සංවර්ධන කාරක සභාව**

01. ගරු උප සභාපති විමුක්ති කුමාර ජයරත්න මැතිතුමා - සාමාජික
02. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සරත් විජේසිරි මැතිතුමා - කාරක සභා සභාපති
03. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.ඊ.ශාන්තප්‍රිය පතිරණ මැතිතුමා - සාමාජික
04. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ලක්මාල් සමරරත්න මැතිතුමා - සාමාජික
05. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ප්‍රියන්ත උදයකුමාර මැතිතුමා - සාමාජික
06. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අරුණ ශාන්තසිරි නිල්වල මැතිතුමා - සාමාජික
07. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ආර්.ඒ.එම්.දරුක් මැතිතුමා - සාමාජික
08. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී.එච්.අමරාවතී මැතිණිය - සාමාජික
09. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුගත් මාධව මැතිතුමා - සාමාජික
10. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී නීතා බාලසූරිය මැතිණිය - සාමාජික
11. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී කේ.ඩී.එන්.ප්‍රියන්ති මැතිණිය - සාමාජික

විෂය භාර නිලධාරිනී වත්සලා හේනකආරච්චි මිය - කාරක සභා ලේකම්

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.අමරාවතී මැතිණිය විසින් ස්ථිර කරන ලදී.

යෝජනාව බෙදීමකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

**01.(xvii) ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

**<u>2023 වර්ෂය සඳහා කාර්මික හා සේවා කාරක සභාව</u>**

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 12 (1) වගන්තිය අනුව හා ඒ සමඟ කියවෙන 12 (2) ප්‍රකාරව දෙහිඕවිට ප්‍රාදේශීය සභාවේ ඇස්තමේන්තු අනුමත කිරීම, මාර්ග ගැටළු නිරාකරණය, මාර්ග නම් කිරීම්, මාර්ග සංවර්ධන කටයුතු අධීක්ෂණය හා කොන්ත්‍රාත්කරුවන්ගේ ගැටළු නිරාකරණය සඳහා මහා සභාව වෙත උපදෙස් ලබා දීම පිණිස පහත නම් සඳහන් සභිකයන්ගෙන් යුත් කාර්මික හා සේවා කාරක සභාවක් 2023 වර්ෂය සඳහා පත් කිරීමටත් මෙම කාරක සභාව වෙත ඉහත කාර්යන් ඉටු කිරීමට බලය පැවරීම සුදුසු බවටත් යෝජනා කරමි.

**2023 වර්ෂය සඳහා කාර්මික හා සේවා කාරක සභාව**

01. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ් අබේසේන මැතිතුමා - කාරක සභා සභාපති
02. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එස්.එම්. නිමල් මැතිතුමා - සාමාජික
03. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වික්ටර් බණ්ඩාර මැතිතුමා - සාමාජික
04. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අතුල ජයසිරි මැතිතුමා - සාමාජික
05. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී තුෂාර සංජීව මැතිතුමා - සාමාජික

06. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිමල් රාජපක්ෂ මැතිතුමා - සාමාජික
07. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.ඒ.කේ.එන්.ජයවීර මැතිතුමා - සාමාජික
08. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී දිස්නා කුමාරි වීරක්කොඩි මැතිණිය - සාමාජික
09. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.නිශාන් මැතිතුමා - සාමාජික
10. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී යශෝධ ලලංග පද්මසිරි මැතිතුමා - සාමාජික
11. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී එම්.බී.ආර්.එන්.එල්ලාවල මැතිණිය - සාමාජික

විෂය භාර නිලධාරී එච්.එන්.ආර්.එස්.කරුණාරත්න මහතා - කාරක සභා ලේකම්

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීඩී.එස්.එම්.නිමල් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

යෝජනාව බෙදීමකින් තොරව ඒකමතිකව සහා සම්මත විය.

**01.(xviii) ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

**2023 වර්ෂය සඳහා පරිසර හා පහසුකම් කාරක සභාව**

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 12 (1) වගන්තිය අනුව හා ඒ සමඟ කියවෙන 12 (2) ප්‍රකාරව දෙහිඕවිට ප්‍රාදේශීය සභාවේ මහජන සෞඛ්‍ය, ඝන අපද්‍රව්‍ය කළමනාකරණය, ආදාහනාගාරය හා පරිසරය සම්බන්ධ කටයුතු විධිමත් කිරීම පරිපාලනයට අදාල වන්නා වූ උපදෙස් සැපයීම,ගැටළු නිරාකරණය කිරීම,ඊට අනුෂාංගික කරුණු සම්බන්ධයෙන් සංවර්ධන යෝජනාවන්ට නිර්දේශ සැපයීම යන කරුණු සම්බන්ධයෙන් මහා සභාව වෙත උපදෙස් ලබා දීම පිණිස පහත නම් සඳහන් සභිකයන්ගෙන් යුත් පරිසර හා පහසුකම් කරක සභාවක් 2023 වර්ෂය සඳහා පත් කිරීමටත් මෙම කාරක සභාව වෙත ඉහත කාර්යයන් ඉටු කිරීමට බලය පැවරීම සුදුසු බවටත් යෝජනා කරමි.

**2023 වර්ෂය සඳහා පරිසර හා පහසුකම් කාරක සභාව**

01. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එස්.එම්.නිමල් මැතිතුමා - කාරක සභා සභාපති
02. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සෙස්ටස් අර්සකුලරත්න මැතිතුමා - සාමාජික
03. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ප්‍රියන්ත උදයකුමාර මැතිතුමා - සාමාජික
04. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අරුණ ශාන්තසිරි නිල්වල මැතිතුමා - සාමාජික
05. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී එච්.අමරාවතී මැතිණිය - සාමාජික
06. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී යූ.ආර්.ඒ.සී. කරුණාරත්න මැතිතුමා - සාමාජික
07. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී පී.වී.එන්. සඳමාලි මැතිණිය - සාමාජික
08. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රනිල් චන්ද්‍රකුමාර මැතිතුමා - සාමාජික
09. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.ජී.එස්.සී.කේ. පියරත්න මැතිතුමා - සාමාජික
10. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී නීතා බාලසූරිය මැතිණිය - සාමාජික
11. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී ශ්‍රියානි ජයකොඩි මැතිණිය - සාමාජික
12. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී කේ.ජී.ඒ.කේ.සුමනදාස මැතිණිය - සාමාජික

විෂය භාර නිලධාරී බුද්ධික හේමචන්ද්‍ර මහතා - කාරක සභා ලේකම්

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීකේ.නිශාන් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

යෝජනාව බෙදීමකින් තොරව ඒකමතිකව සහා සම්මත විය.

**01.(xix) ගරු සභාපති ඒ.ජී. දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

**2023 වර්ෂය සඳහා ප්‍රසම්පාදන කමිටුව**

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 12 (1) වගන්තිය අනුව හා ඒ සමඟ කියවෙන 12 (2) ප්‍රකාරව දෙහිඕවිට ප්‍රාදේශීය සභාවේ වැඩ සැපයුම් සේවා සම්බන්ධයෙන් තීරණ ගැනීමටත්, මිල දී ගැනීම් විකිණීම්, බදු දීම් සම්බන්ධයෙන් අනුමැතිය ලබා දීමටත්, ඉදිකිරීම් සම්බන්ධයෙන් ලියවිලි අනුමත කිරීම උපදෙස් සැපයීම හා අධීක්ෂණය සම්බන්ධයෙන් පහත නම් සඳහන් සභිකයන්ගෙන් යුත් ප්‍රසම්පාදන කමිටුවක් 2023 වර්ෂය සඳහා පත් කිරීමටත් මෙම කාරක සභාව වෙත ඉහත කාර්යයන් ඉටු කිරීමට බලය පැවරීම සුදුසු බවටත් යෝජනා කරමි.

**2023 වර්ෂය සඳහා ප්‍රසම්පාදන කමිටුව**

01. ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා - කාරක සභා සභාපති
02. ගරු උප සභාපති විමුක්ති කුමාර ජයරත්න මැතිතුමා - සාමාජික
03. ගරු ප්‍රාදේශීය මන්ත්‍රී අමිල කන්දෙආරච්චි මැතිතුමා - සාමාජික
04. ගරු ප්‍රාදේශීය මන්ත්‍රී ඩබ්.අබේසේන මැතිතුමා - සාමාජික
05. ගරු ප්‍රාදේශීය මන්ත්‍රී සෙස්ටස් අර්සකුලරත්න මැතිතුමා - සාමාජික
06. ගරු ප්‍රාදේශීය මන්ත්‍රී යූ.ජී.සරත් විජේසිරි මැතිතුමා - සාමාජික
07. ගරු ප්‍රාදේශීය මන්ත්‍රී ලක්මාල් සමරරත්න මැතිතුමා - සාමාජික
08. ගරු ප්‍රාදේශීය මන්ත්‍රී එම්.එම්.එම්. ෆර්හාන් මැතිතුමා - සාමාජික
09. ගරු ප්‍රාදේශීය මන්ත්‍රී විකුම් චන්දන කස්තිරගේ මැතිතුමා - සාමාජික
10. ගරු ප්‍රාදේශීය මන්ත්‍රිනී සුධර්මා ලක්මාලි මැතිණිය - සාමාජික

විෂය භාර නිලධාරී එච්.ඒ.ආර්.එස්.තිලකරත්න මහතා - කමිටු ලේකම්

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.අබේසේන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

යෝජනාව බෙදීමකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

**01.(xx) ගරු සභාපති ඒ.ජී. දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

**2023 වර්ෂය සඳහා ආපදා කළමනාකරණ කාරක සභාව**

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 12(1) වගන්තිය අනුව වර්ෂාවෙන්,ජල ගැල්මෙන්,ගින්නෙන්,සාගතයෙන්,හෝ වසංගතයකින් සිදු වන ආපදා සම්බන්ධයෙන් ක්‍රියා කිරීම සඳහා උපදෙස් ලබා දීම,පහසුකම් සැලසීම, නිර්දේශයන් ඉදිරිපත් කිරීම හා එයට අදාල වන්නාවූ ආනුෂාංගික කාරණා සම්බන්ධයෙන් ක්‍රියා කිරීම සඳහා පහත සඳහන් සාමාජිකයන්ගෙන් යුත් ආපදා කළමනාකරණ කාරක සභාවක් 2023 වර්ෂය සඳහා පත් කිරීමටත් මෙම කාරක සභාව වෙත ඉහත කාර්යයන් ඉටු කිරීමට බලය පැවරීම සුදුසු බවටත් යෝජනා කරමි.

**2022 වර්ෂය සඳහා ආපදා කළමනාකරණ කාරක සභාව**

1. ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා - කාරක සභා සභාපති
2. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එස්.එම්.නිමල් මැතිතුමා - සාමාජික
3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.ඊ. ශාන්තප්‍රිය පතිරණ මැතිතුමා - සාමාජික
4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වික්ටර් බණ්ඩාර මැතිතුමා - සාමාජික
5. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී එච්.අමරාවතී මැතිණිය - සාමාජික
6. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී.දිස්නා කුමාරි වීරක්කොඩි මැතිණිය - සාමාජික
7. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අරුණ ශාන්තසිරි නිල්වල මැතිතුමා - සාමාජික
8. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී විකුම් චන්දන කස්තිරගේ මැතිතුමා - සාමාජික
9. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී කේ.ජී.ඒ.කේ.සුමනදාස මැතිණිය - සාමාජික
10. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.නිශාන් මැතිතුමා - සාමාජික

විෂය භාර නිලධාරී ඩබ්.උපුල් ජයසිරි මහතා - කාරක සභා ලේකම්

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී සඳමාලි විජේරත්න මැතිණිය විසින් ස්ථිර කරන ලදී.

යෝජනාව බෙදීමකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

**01.(xxi) ගරු සභාපති ඒ.ජී. දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

2022.12.31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා දෙහිඕවිට ප්‍රාදේශීය සභාවේ භාණ්ඩ සමීක්ෂණ කටයුතු සිදු කිරීම සඳහා පහත නම් සඳහන් ගරු මන්ත්‍රීතුමන්ලා හා මන්ත්‍රීතුමියන්ලා සහ නිලධාරීන්ගෙන් සැදුම්ලත් භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලයක්,මිල කමිටුවක්,වෙන්දේසි කමිටුවක්, අපහරණ කමිටුවක් සහ භාණ්ඩ සමීක්ෂණ නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ කමිටුවක් පත් කර ගැනීම සුදුසු බව යෝජනා කරමි.

**<u>පුස්තකාල සමීක්ෂණ මණ්ඩලය.</u>**

i. ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩබ්. අබේසේන මැතිතුමා
ii. ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීසෙස්ටස් අර්සකුලරත්න මැතිතුමා
iii. ආර්.ඩී. ඩබ්.ජේ.විජේරත්න මෙ/ය (කළමනාකරණ සේවා නිලධාරි) - සභාපති
iv.බී. එස්.එස්. කුමාරි මිය (කළමනාකරණ සේවා නිලධාරී) - සාමාජික
v. යූ.ඩී. ශ්‍රියානි මල්කාන්ති මිය (සංවර්ධන නිලධාරි) - සාමාජික
vi ආර්. එම්.එච්.රත්නායක මෙ/ය (සංවර්ධන නිලධාරි) - සාමාජික
vii. එස්. එන්.ඩී.එම්.කුමාරි මිය (සංවර්ධන නිලධාරි) - සාමාජික
viii. ඒ.බී. හේමචන්ද්‍ර මයා (සංවර්ධන නිලධාරි) - සාමාජික
ix. කේ.ජී.කේ.තිලකරත්න මෙ/ය (සංවර්ධන නිලධාරී) - සාමාජික
x. ඩබ්. එස්.කේ.වර්ණපුර මිය ( කළමනාකරණ සේවා නිලධාරී ) - සාමාජික
xi. එච්. එස්.ඩී.ආර්. නයනානන්ද මිය (කළමනාකරණ සේවා නිලධාරි) - සාමාජික
xii. ආර්.ඩී. එස්.එස්.වික්‍රමආරච්චි මිය (කාර්මික නිලධාරී) - සාමාජික

**<u>ගබඩා සමීක්ෂණ මණ්ඩලය.</u>**

i. ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩී. එස්.එම්.නිමල් මැතිතුමා
ii.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිනී. එම්.බී.ආර්.එන්.එල්ලාවල මැතිණිය
iii.ඒ. එම්.කේ.කේ.අත්තනායක මිය (සංවර්ධන නිලධාරි) - සාමාජික
iv.එම්.එල්.ටී.එන්. මුණසිංහ මිය (සංවර්ධන නිලධාරි) - සාමාජික
v. කේ. එම්.ටී.එම්. කපුකොටුව (සංවර්ධන නිලධාරි) - සාමාජික
vi. එච්. එස්.ජී.දිනාලංකාර මිය(සංවර්ධන නිලධාරි) - සාමාජික
vii.ඒ.ඩී. ප්‍රබෝධි රණතුංග මෙ/ය (සංවර්ධන නිලධාරි) - සාමාජික
viii.එම්.ඒ. එස්.මධුෂිකා මිය (කළමනාකරණ සේවා නිලධාරි) - සාමාජික
ix.ආර්. ඩබ්.ඩී.රාජපක්ෂ මිය (කළමනාකරණ සේවා නිලධාරි) - සාමාජික
x. එම්.ඒ. එෆ්.අස්රා මෙ/ය (කළමනාකරණ සේවා නිලධාරී) - සාමාජික
xi.එච්.ඒ. ආර්.එස්.තිලකරත්න මයා (කළමනාකරණ සේවා නිලධාරි) - සාමාජික
xii.ආර්.ඒ.යූ. එන්.රණසිංහ මයා (කාර්මික නිලධාරි) - සාමාජික

**<u>මිළ කමිටුව.</u>**

i.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ලක්මාල් සමරරත්න මැතිතුමා

ii. ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එම්. එම්.එම්.ෆර්හාන් මැතිතුමා
iii. එච්.ඒ. ආර්.එස්.තිලකරත්න මයා (කළමනාකරණ සේවා නිලධාරි)
iv.යූ.ඩී. ශ්‍රියානි මල්කාන්ති මිය (සංවර්ධන නිලධාරි)
v. ඩබ්.ජී. එස්.එම්. එස්.කුමාර මෙ/ය (සංවර්ධන නිලධාරි)
vi.ආර්.ඒ.යූ. එන්.රණසිංහ මයා (කාර්මික නිලධාරි)

<u>**වෙන්දේසි කමිටුව.**</u>

i.ගරු උප සභාපති විමුක්ති කුමාර ජයරත්න මැතිතුමා
ii.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී රනිල් චන්ද්‍රකුමාර මැතිතුමා
iii. ඒ.බී. හේමචන්ද්‍ර මයා (සංවර්ධන නිලධාරී)
iv. ඒ. එම්.කේ.කේ.අත්තනායක මිය (සංවර්ධන නිලධාරි)
v. බී.ඩී.ටී.ටී. ප්‍රේමරත්න මිය ( ආදායම් පරීක්ෂක)
vi. බී. එස්.එස්. කුමාරි මිය (කළමනාකරණ සේවා නිලධාරී)
vii.යූ. එල්.ගාමිණී ජයතිලක මහතා (වැඩ ක්ෂේත්‍ර කම්කරු)

<u>**අපහරණ කමිටුව.**</u>

i.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී යූ.ජී. සරත් විජේසිරි මැතිතුමා
ii.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිනි ශ්‍රියානි ජයකොඩි මැතිණිය
iii.එච්.ඒ.ආර්.එස්.තිලකරත්න මයා (කළමනාකරණ සේවා නිලධාරි)
iv. එම්.ඒ. එෆ්.අස්රා මෙ/ය (කළමනාකරණ සේවා නිලධාරී)
v. කේ.ජී.කේ. තිලකරත්න මෙ/ය (සංවර්ධන නිලධාරී)

<u>**නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ කමිටුව.**</u>

i. බී. එස්.එස්. කුමාරි මිය (කළමනාකරණ සේවා නිලධාරි)
ii. ආර්.ඩී. ඩබ්.ජේ.විජේරත්න මෙ/ය (කළමනාකරණ සේවා නිලධාරි)
iii. ආර්.ඩී. එස්.එස්.වික්‍රමආරච්චි මිය (කාර්මික නිලධාරී)

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී එච්.අමරාවතී මැතිණිය විසින් ස්ථිර කරන ලදී.

යෝජනාව බෙදීමකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සෙස්ටස් අර්සකුලරත්න මැතිතුමා:**

මෙහි 2022 ලෙස සඳහන් වී ඇති බවත් එය 2023 යනුවෙන් නිවැරදි විය යුතු බවත් පෙන්වා දෙන ලදී.

**ගරු සභාපති ඒ.ජී. දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

එය ගරු මන්ත්‍රී යූ.ආර්.ඒ.සි.කරුණාරත්න මැතිතුමා විසින්ද පෙන්වා දුන් බවත් එය 2023 ලෙස නිවැරදි විය යුතු බවත් පවසා සිටියේය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සෙස්ටස් අර්සකුලරත්න මැතිතුමා:**

සභා වාර්තාවට මෙය ඇතුලත් වන බැවින් මුද්‍රණ දෝෂ සහිතව න්‍යාය පත්‍රය සකස් නොකළ යුතු බවත් එවැනි දෑ අනුමත කළ නොහැකි බවත් පවසා සිටියේය. එසේම හිඟුරලකන්ද වසම නියෝජනය කරන ගරු මන්ත්‍රී නිමල්

රාජපක්ෂ මැතිතුමා ප්‍රකාශ කළ කරුණ සම්බන්ධයෙන් තමන්ද එකඟ වන බවත් හිටපු සභාපතිතුමාගේ කාලයේදී එතුමාට මෙම කසළ සම්බන්ධයෙන් විවිධ දෝෂාරෝපණ එල්ල වූ බව සිහිපත් කළ එතුමා අද වන විට වර්තමාන සභාපතිතුමා දීගලවත්ත කසළ කළමනාකරණ මධස්ථානය ඉදි කර එහි නොයෙකුත් අවශ්‍යතා පෙන්වා දෙමින් යෝජනා ගෙන එන බව පවසා සිටියේය. රට තුළ ආර්ථික අර්බුදයක් ඇති අවස්ථාවේ මෙවැනි කාර්යන් සඳහා මුදල් වියදම් කිරීමේදී අප ඒ සම්බකන්ධයෙන් සැලකිලිමත් විය යුතු බවත් මෙය අනිවාර්යයෙන්ම සිදු විය යුතු කාරණයක්ද යන්න සම්බන්ධයෙන් සිතා බලන ලෙස පවසා සිටියේය.

(ගරු මන්ත්‍රී යශෝධ පද්මසිරි මැතිතුමා සභාවට පැමිණෙන ලදී. පෙ:ව: 09.58)

**ගරු සභාපති ඒ.ජී. දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

මේ ඇස්තමේන්තුව මුදල් කාරක සභාව වෙත යොමු කළ අවස්ථාවේදී ගරු මන්ත්‍රී සෙස්ටස් අර්සකුලරත්න මැතිතුමා එම කමිටුවේ සිටි බවත් මෙය අලුත් සංවර්ධන කාර්යක් නොවන බවත් දිරා ගිය වැහ පිහිලි වෙනුවට අලුතින් වැහි පිහිල්ලක් දැමීම පමණක් සිදු කරන බවත් පවසා සිටියේය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සෙස්ටස් අර්සකුලරත්න මැතිතුමා:**

මේ සභාවේ මුදල් ඉතාමත් අරපිරිමැස්මෙන් පරිහරනය කළ යුතු බවත් මිල ගණන් කැඳවා අදාල කාර්යන් සිදු කළ යුතු බවත් පවසා සිටි එතුමා රු.20,000.00 කට වැලි කියුබ් එකක් මිලදී ගත් බවට මේ ගෙවීම් ලේඛන වල සඳහන්ව ඇති බවත් එම මුදලට වඩා අඩුවෙන් වැලි කියුබ් එකක් මිලදී ගත හැකි බවත් පවසා සිටියේය.

**ගරු සභාපති ඒ.ජී. දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

මේ මිලදීගැනීම සිදු කරන්නේ ටෙන්ඩර් ක්‍රියා පටිපාටියට අනුකූලව බවත් 2023 වර්ෂය සඳහා අලුතින් සැපයුම් කරුවන් ලියාපදිංචිය මේ සිදු කරන බැවින් එවැනි අවම අය කිරීම් සිදු කරන ආයතන සම්බන්ධයෙන් ගරු මන්ත්‍රී සෙස්ටස් අර්සකුලරත්න මැතිතුමා දැනුවත් නම් ඔවුන් මේ සභාවේ ලියාපදිංචිය සඳහා යොමු කරන ලෙස දන්වා සිටියේය.

**01.(xxii) ගරු සභාපති ඒ.ජී. දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව සහ ඒ සමඟ කියවිය යුතු ඒ පනතේ 184 වගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් සාදන ලද රීති මාලාවේ 2(1) වගන්තිය අනුව 2023 වර්ෂය සඳහා පහත සඳහන් දිනයන්හිදී පෙ:ව: 09.30 ට දෙහිඕවිට ප්‍රාදේශිය සභාවේ මහා සභා රැස්වීම පැවැත්වීමටත් එමෙන්ම අදාල කාරක සභා රැස්වීම් පහත උපලේඛනයේ සඳහන් දිනයන්හිදී පැවැත්වීමටත් සුදුසු බවට යෝජනා කරමි.

| **2023 වර්ෂය සඳහා මහා සභා රැස්වීම් පැවැත්වෙන දිනයන්** | **2023 වර්ෂය සඳහා කාරක සභා රැස්වීම් පැවැත්වෙන දිනයන්** |
|---|---|
| 2023 ජනවාරි 10 | 2023ජනවාරි 31 |
| 2023පෙබරවාරි 14 | 2023පෙබරවාරි 28 |
| 2023මාර්තු 14 | 2023 මාර්තු 28 |
| 2023 අප්‍රේල් 04 | 2023 අප්‍රේල් 25 |
| 2023 මැයි09 | 2023 මැයි 23 |
| 2023 ජූනි 13 | 2023 ජූනි 27 |
| 2023 ජූලි 11 | 2023ජූලි 25 |

| | |
|---|---|
| 2023 අගෝස්තු 08 | 2023 අගෝස්තු 29 |
| 2023සැප්තැම්බර් 12 | 2023සැප්තැම්බර් 26 |
| 2023 ඔක්තෝබර් 10 | 2023 ඔක්තෝබර් 24 |
| 2023 නොවැම්බර් 14 | 2023 නොවැම්බර් 28 |
| 2023දෙසැම්බර් 12 | 2023 දෙසැම්බර් 26 |

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.අබේසේන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

යෝජනාව බෙදීමකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

**01.(xxiii) ගරු සභාපති ඒ.ජී. දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

දෙහිඕවිට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ විශාල දැන්වීම් පුවරු වෙනත් තාවකාලික නිර්මාණ ඉදි කිරීම හෝ යම් වීථියක හෝ ඊට යාබදව යම් මාර්ගයක සැරසිලි කිරීම හා ඒ සම්බන්ධයෙන් නිකුත් කරන ලද යම් අවසර පත්‍ර සඳහා ගාස්තු අය කිරීම ප්‍රාදේශීය සභාව විසින් ඉදි කරන ලද විශාල දැන්වීම් පුවරු භාවිතා කිරීම සඳහා ගාස්තු අය කිරීම සඳහා 1987 අංක 15 දරණප්‍රාදේශිය සභා පනතේ 126 (vii) (ඊ) වගන්තිය යටතේ කියවිය යුතු සහ එම පනතේ 122 (1) උප වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාරව දෙහිඕවිට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළස්ථාවර ප්‍රචාරක දැන්වීම්පවත්වාගෙන යනු ලබන පුවරු විධිමත් කිරීම හා පාලනය කිරීම සම්බන්ධයෙන් අතුරු ව්‍යවස්ථාවක් පනවා ගැනීම සුදුසු බව යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී නීතා බාලසූරිය මැතිණිය විසින් ස්ථිර කරන ලදී.

යෝජනාව බෙදීමකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

**01.(xxiv) ගරු සභාපති ඒ.ජී. දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

දෙහිඕවිට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ යම් මාවතක සිට පෙනෙන පරිදි විහිදා ඇති හෝ ප්‍රදර්ශනය කර ඇති කටවුට්, පෝසටර් , බැනර් යනාදී තාවකාලික ප්‍රචාරණ දැන්වීම් විධිමත් කිරීම හා පාලනය කිරීම සහ එලෙස විහිදා ඇති හෝ ප්‍රදර්ශනය කර තාවකාලික ප්‍රචාරණ දැන්වීම් සම්බන්ධයෙන් ගාස්තු අය කිරීම සඳහා 1987 අංක 15 දරණ ප්‍රාදේශිය සභා පනතේ 126 (xxx) වගන්ති සමඟ කියවිය යුතු සහ එම පනතේ 122 (1) උප වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාරව දෙහිඕවිට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළස්ථාපිත කරනු ලබන තාවකාලික ප්‍රචාරක දැන්වීම් පුවරු විධිමත් කිරීම හා පාලනය කිරීම සම්බන්ධයෙන් අතුරු ව්‍යවස්ථාවක් පනවා ගැනීම සුදුසු බව යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීඩී.එස්.එම්.නිමල් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සෙස්ටස් අර්සකුලරත්න මැතිතුමා:**

අදහස් ප්‍රකාශ කිරීමකට ඉඩ නොමැතිව කඩිනමින් යෝජනා සම්මත කිරීමට සභාවේ මන්ත්‍රීවරු පෙළඹීම සුදුසු නොවන බවත් එකින් එක යෝජනාව කාලය ගෙන අධ්‍යනය කර අනුමැතිය දීමට කටයුතු කිරීම මන්ත්‍රීවරුන්ගේ වගකීම බව පවසා සිටියේය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එස්.එම්.නිමල් මැතිතුමා:**

මේ යෝජනා පූර්වයෙන් මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාවට ඉදිරිපත් කර ඇති බවත් ඒ කමිටුවේ සාමාජිකයෙකු වශයෙන් එය නියෝජනය කර එම අවස්ථාවේ මේ යෝජනා සඳහා අනුමැතිය ලබා දී මහා සභාවේදී ඒවාට විරුද්ධ වීම සාධාරණ නොවන බව පවසා සිටියේය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සෙස්ටස් අර්සකුලරත්න මැතිතුමා:**

මුදල් කමිටුවේ අනුමැතිය ලබා දුන්නත් මහා සභාව එයට වඩා බලවත් බව පවසා සිටියේය. ඒ නිසා මහා සභාවේ තීරණය විමර්ශනය කර ලබා දිය යුතු බව පවසා සිටියේය. එසේම තමන් මුදල් කමිටුව නියෝජනය කළත් අයුතු යෝජනා හෝ අත්‍යාවශ්‍ය නොවන යෝජනා සඳහා සිය අනුමැතිය ලබා නොදෙන බව පවසා සිටියේය.

(සභාව ඝෝෂාකාරී)

**ගරු උප සභාපති විමුක්ති ජයරත්න මැතිතුමා:**

තමන්ද මුදල් කමිටුව නියෝජනය කරනු ලබන බවත් සෙස්ටස් අර්සකුලරත්න මැතිතුමාගේ මේ ක්‍රියා කළාපය සම්බන්ධයෙන් අතිශයින් කණගාටු වන බවත් පවසා සිටියේය. දීගලවත්තේ වැහි පිහිල්ල සම්බන්ධනේ කීප අවස්ථාවකදීම කතා කර මේ තීන්දුව ලබා ගත් බවත් වැසි ජලය කසළ සමඟ මිශ්‍ර වුවහොත් උද්ගත වන තත්වය පිළිබඳව සලකා බලා මේ අලුත්වැඩියාව සිදු කිරීම සඳහා අනුමැතිය ලබා දී ඇති බව පවසා සිටියේය. ඒ අවස්ථාවේදී කිසිදු විරෝධයක් නොදක්වා මේ සභාව තුළදී විරුද්ධ වීම සාධාරණ නොවන බව පවසා සිටියේය.

යෝජනාව බෙදීමකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

**01.(xxv) ගරු සභාපති ඒ.ජී. දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

දෙහිඕවිට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පවත්වාගෙන යනු ලබන නවාතැන් ගෙවල් සහ ගෙපත් ගොඩනැඟිලි විධිමත් කිරීම, අධීක්ෂණය කිරීම, පරීක්ෂා කිරීම සහ පාලනය කිරීම ඒවා සඳහා සඳහා බලපත්‍ර නිකුත් කිරීම එම මධ්‍යස්ථාන පවත්වාගෙන යාමේදී උද්ගත වන ගැටළු සහ අවහිරතා මඟහරවා ගැනීම සඳහා 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 126 (ix) (ඉ) වගන්ති සමඟ කියවිය යුතු සහ එම පනතේ 122 (1) උප වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාරව දෙහිඕවිට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළස්ථාපිත කරනු ලබන සම්භාහන මධ්‍යස්ථාන, නවාතැන් ගෙවල් සහ ගෙපත් ගොඩනැඟිලි සම්බන්ධ අතුරු ව්‍යවස්ථාවක් පනවා ගැනීම සුදුසු බව යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී එච්.අමරාවතී මැතිණිය විසින් ස්ථිර කරන ලදී.

යෝජනාව බෙදීමකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

**01.(xxvi) ගරු සභාපති ඒ.ජී. දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

දෙහිඕවිට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ඇති මාර්ග වල ධානය වන වාහන වල බර සහ වේගය සීමා කිරීම, යම් පාලමක් පාරක් හෝ අඩි පාරක් මත යම් ස්ථානයක වාහනයක් පාවිච්චි කිරීමෙන් මහජනයාට අනතුරු සිදු විය හැකි හෝ එකී පාලම, පාර , හෝ මංමාවතට අලාභ සිදු විය හැකි අවස්ථාවකදී එකී පාවිච්චිය වැලැක්වීම හෝ සීමා කිරීම සම්බන්ධයෙන් 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 126 (vii) (ඇ) වගන්තිය ප්‍රකාරව සමඟ කියවිය යුතු සහ එම පනතේ 122 (1) උප වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාරව දෙහිඕවිට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළඇති මාර්ග වල ධානය වන වාහන වල බර සහ වේගය සීමා කිරීම සම්බන්ධ අතුරු ව්‍යවස්ථාවක් පනවා ගැනීම සුදුසු බව යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.අබේසේන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

යෝජනාව බෙදීමකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

**01.(xxvii) ගරු සභාපති ඒ.ජී. දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 19 වන වගන්තියේ (2) ආ උප වගන්තිය මඟින් පැවරී ඇති බලතල ප්‍රකාරව දෙහිඕවිට ප්‍රාදේශීය සභා ඉන්ධන පිරවුම්හල, බස් නැවතුම්පල හා වෙළඳ සංකීර්ණය ඉදි කිරීමේ ව්‍යාපෘතිය සිදු කිරීමට සැලසුම් කර ඇත. එම කාර්ය සිදු කිරීමට යෝජිත දෙහිඕවිට - ඇහැළියගොඩ බස් නැවතුම්පල භූමිය නීතිමය වශයෙන් පිළිගන්නා ආකාරයට පැවරුම් සහතිකය සංශෝධනය කර ගත යුතුව ඇත. එබැවින් දෙහිඕවිට ප්‍රාදේශීය සභා ඉන්ධන පිරවුම්හල, බස් නැවතුම්පල හා වෙළඳ සංකීර්ණය ඉදි කිරීමේ ව්‍යාපෘතිය සඳහා රූඩ් 03 පර්චස් 26.7 ක ප්‍රමාණයෙන් යුත් ගුදමේ වත්ත හෙවත් අතුමුණ කුරහන් වත්ත නැමති ඉඩමේ පැවරුම් සහතිකයේ දෙවන උප ලේඛනයේ සඳහන් කොන්දේසි හා සීමා යටතේ පළමු උප ලේඛනයේ සවිස්තරාත්මක වශයෙන් දක්වා ඇති "මුළු ප්‍රමාණයෙන් රූඩ් 03 පර්චස් 26.7 ක ඉඩම දෙහිඕවිට- ඇහැළියගොඩ බස්නැවතුම්පල සඳහා අත්කර ගන්නා ලදී. මෙම ඉඩම අත් කරගෙන ඇති ඉහත අරමුණෙන් බැහැරව වෙනත් කාර්යක් සඳහා යොදා නොගත යුතුය". ලෙස සඳහන් කර ඇති කොන්දේසිය හා සීමාව **" පළමු උප ලේඛනයේ සවිස්තර වශයෙන් දක්වා ඇති මුළු ප්‍රමාණයෙන් රූඩ් 03 පර්චස් 26.7 ක ඉඩම දෙහිඕවිට- ඇහැළියගොඩ බස්නැවතුම්පල හා ඉන්ධන පිරවුම්හල සහිත වෙළඳ සංකීර්ණය ඉදි කිරිම සඳහා අත්කර ගන්නා ලදී. මෙම ඉඩම අත්පත් කරගෙන ඇති ඉහත අරමුණෙන් බැහැරව වෙනත් කාර්යක් සඳහා යොදා නොගත යුතුය."**ලෙස සංශෝධනය කර ගැනීම සුදුසු බව යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී යූ.ආර්.ඒ.සී.කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කෝසල ජයවීර මැතිතුමා:**

මෙම යෝජනාවට අනුව එම කාර්ය සඳහා පමණක් මෙම භූමිය යොදා ගන්නා බවට සඳහන් වෙන බව පෙන්වා දෙන ලදී. ඒ ආකාරයට වෙනත් කාර්යක් සඳහා යොදා නොගත යුතුයි යනුවෙන් පැහැදිලිව සඳහන් කර තිබෙන බවත් එය පැහැදිලි කර දෙන ලෙසත් ඉල්ලා සිටියේය.

**ගරු සභාපති ඒ.ජී. දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

මේ ඉඩම පවරාගෙන ඇත්තේ බස් නැවතුම්පළක් සඳහා පමණයි යනුවෙන් සඳහන් කර බවත් ඉන්දියන් ඔයිල් සමාගමේ නීති අංශයට මේ ලියිවිලි ඉදිරිපත් කළ අවස්ථාවේදී මෙහි ඉන්ධන පිරවුම්හලක් ඉදි කිරීමට නම් එම පැවරුමේ එකී වාක්‍ය සංශෝධනය විය යුතු බවට පෙන්වා දුන් බවත් පවසා සිටියේය. ඒ අනුව ඉන්ධන පිරවුම්හල බස්නැවතුම්පළ සහ වෙළඳ සංකිර්ණය යන කාරණා තුනම සිදු කිරීම සඳහා මෙම භූමිය භාවිතා කිරීමට අවශ්‍ය බැවින් මෙලෙස සිදු කරන බව පවසා සිටියේය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කෝසල ජයවීර මැතිතුමා:**

එය තමන්ද දන්නා බවත් නමුත් මේ යෝජනාවේ එකී කාර්යයෙන් බැහැරව වෙනත් කාර්යයක් සඳහා යොදා ගත නොහැකි බවට සඳහන් කර තිබීම උචිත නොවනබවපෙන්වාදෙනලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුගත් මාධව මැතිතුමා:**

අපට වැටහී යන ආකාරයට මේ ඉන්ධන ව්‍යාපෘතිය යම් දිනක අසාර්ථක ව්‍යාපෘතියක් බවට පත් වුවහොත් මේ ව්‍යාපෘතිය අත්හැර මේ භූමියේ ලාභ ලබන වෙනත් කාර්යක් සිදු කළ යුතු බවත් එය සිදු කිරීමට මේ තීරණය හේතුවෙන් යම් බාධාවක් නැවත උද්ගත වන බව පෙන්වා දෙන ලදී.

**ගරු සභාපති ඒ.ජී. දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

ගරු මන්ත්‍රීතුමන්ලා පවසන කරුණ තමන්ට අවබෝධ බවත් එම නිසා මෙම යෝජනාව

“ මෙම ඉඩම දෙහිඕවිට ඇහැළියගොඩ බස් නැවතුම සහ ඉන්ධන පිරවුම්හල සහ වෙළඳ සංකිර්ණය ඇතුළු කාර්යන් සඳහා පවරා ගන්නා ලදී යනුවෙන් යෝජනාව සංශෝධනය කරන බව පවසා සිටියේය.

සංශෝධිත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්. අබේසේන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී යශෝධ පද්මසිරි මැතිතුමා:**

මෙම ඉඩමේ මුළු ප්‍රමාණය වන රූඩ් 03 පර්චස් 26.7 ක කොටසක් පවතින බවත් මේ ඉඩමේ ගැටළුවක් ඇති වී අධිකරණයට ගොස් එහි කරුණු වාර්තා කර තීන්දුව මේ වන විට ලැබී ඇති බවත් එහි මේ භූමිය ප්‍රාදේශීය සභාව සතු බවට අධිකරණයෙන් නම් කර එවා ඇති නිසා ඒ ස්ථානයේ ඇති අනවසර ඉදි කිරිම් ඉවත් කර මේ ඉඩම සභාවට අත්පත් කර ගැනීමට කටයුතු කළ යුතු නොවේදැයි විමසා සිටියේය.

**ගරු සභාපති ඒ.ජී. දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

මේ වන විට සභාව විසින් මායිම් ලකුණු කර ඇති බවත් අධිකරණයෙන් අදාල නඩු තීන්දුව ලබා දෙන ලෙස ඉල්ලීම් සිදු කර ඇති බවත් එය ලැබුණු පසු අනවසර පදිංචකරුවන් ඉවත් කිරීමට කටයුතු කරන බවත් පවසා සිටින ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී යශෝධ පද්මසිරි මැතිතුමා:**

සභාවට හිමි වූ බිම් ප්‍රමාණයට අදාල ඉඩම් කොටසත් ඇතුලත්ව ඇත්දැයි විමසා සිටියේය.

**ගරු සභාපති ඒ.ජී. දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

පිඹුරට අදාල ඉඩම් ප්‍රමාණය සම්පූර්ණයෙන්ම සභාවට හිමි වී ඇති බව පවසා සිටියේය. ඒ සඳහා අනවසර ඉදි කිරීම් තිබූ බිම් කොටසත් ඇතුලත් බව පවසා සිටියේය.

සංශෝධිත යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩබ්.අබේසේන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

යෝජනාව බෙදීමකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

**01.(xxviii) ගරු සභාපති ඒ.ජී. දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

දෙහිඕවිට- ඇහැළියගොඩ බස්නැවතුම්පල භූමිය තුළ ප්‍රාදේශීය සභා ඉන්ධන පිරවුම්හල බස්නැවතුම්පල සහ වෙළඳ සංකීර්ණය ඉදිකිරීමේ ව්‍යාපෘතිය සඳහා 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 132 (ඌ) උප වගන්තිය යටතේ ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව රුපියල් මිලියන පහක මුදලක් (ලක්ෂ 50ක්) දෙහිඕවිට ප්‍රාදේශීය සභාව සහ ලංකා ඉන්දියන් ඔයිල් සමාගම සමඟ ගිවිසුම්ගත වීමේදී හෝ ඊට පෙර ඇප තැන්පතු වශයෙන් තැන්පත් කිරීම සඳහා දෙහිඕවිට ප්‍රාදේශීය සභාවේ ස්ථාවර තැන්පත් ගිණුමකින් ලබා ගැනීම සුදුසු බව යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එස්.එම්.නිමල් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ගරු සභාපති ඒ.ජී. දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

IOC සමාගමෙන්අපට මෙම ඉන්ධන පිරවුම්හල සඳහා බල පත්‍රය ලබා දී ඇති බවත් එම කොන්දේසි වලට යටත්ව ටැංකි සහ පොම්ප වළලා භූමිය සකස් කර ලබා දීම අදාල සමාගම මඟින් සිදු කරනු ලබන බවත් ඒ කාර්යය සඳහා නැවත ලබා ගැනීමේ හැකියාව ඇතිව මෙම රුපියල් ලක්ෂ 50 ක තුන්පතුව එම සමාගමේ තැබිය යුතු බව පෙන්වා දෙන ලදී. මෙම ගිවිසුමෙන් අප ඉවත් වන ඕනෑම අවස්ථාවක එකී මුදල අපට නැවත ලබා ගත හැකි බව පෙන්වා දෙන ලදී. පිඹුරුපත ලබා දුන් පසු සභාව විසින් මෙම මුදල තැන්පතුවක් වශයෙන් IOC

සමාගමේ තැන්පත් කිරීමට කටයුතු කරන බව පැවසූ එතුමා මේ සම්බන්ධයෙන් වැඩිදුර කරුණු දැනගැනීමට අවශ්‍ය නම් කාරක සභාවක් බවට පත් කර සාකච්ඡා කරමුයැයි පවසා සිටින ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කෝසල ජයවීර මැතිතුමා:**

සභා වාර්තාවේ කරුණු සඳහන් විය යුතු බැවින් කාරක සභාවක් බවට පත් කිරීම අවශ්‍ය නොවන බව පවසා සිටියේය. සභාව සතු ස්ථාවර තැන්පතු මුදලෙන් මුදල් ලබා ගැනීම සම්බන්ධයෙන් මෙම යෝජනාව හා ඊට පසුව තිබෙන යෝජනාත් ඉදිරිපත්ව තිබෙන බවත් ඒ අනුව මෙම ඉන්ධන පිරවුම්හල සම්බන්ධයෙන් පසු ගිය මහා සභා රැස්වීමට ගරු සභාපතිතුමා විසින් යෝජනා ගෙන ආ අවස්ථාවේ ප්‍රකාශ කර සිටියේ මේ කාර්ය සඳහා දේශීය ණය සහ සංවර්ධන අරමුදලෙන් මුදල් ලබා ගෙන එම කාර්ය සිදු කිරීමට අපේක්ෂා කරන බව සිහිපත් කර සිටියේය. එලෙස සඳහන් කර මේ සභා රැස්වීම වන විට එම ප්‍රකාශය සම්පූර්ණයෙන් වෙනස් කර මෙම යෝජනාවෙන් ලක්ෂ 50ක්, පසු ඇති යෝජනා වලින් ලක්ෂ 76 ක් සහ අනෙක් යෝජනාවේ ලක්ෂ 04 ක් ආදී වශයෙන් රුපියල් කෝටි එක හමාරකට අධික මුදලක් සභාවේ ස්ථාවර තැන්පත වලින් ලබා ගැනීමට කටයුතු කර ඇති බව පෙන්වා දෙන ලදී. අද වන විට මිනිසුන්ට ජීවත් වීමට කියා දවසේ තුන්වේල කෑමටවත් නොහැකි තත්වයකට රට පත්ව ඇති මොහොතේ රටේ සහ බල ප්‍රදේශයේ ජනතාව මුහුණදෙන මෙම ගැටළු වලට විසඳුම් මෙම ව්‍යාපෘතිය මඟින් ලැබෙනවාද යන්න විමසා සිටියේය. සභාවේ ගිණුමක පවතින මුදලක් මෙවැනි මිනිසුන්ගේ සුබසාධන කටයුතු වෙනුවෙන් යොදනවා වෙනුවට මෙවැනි කාර්යන් සඳහා යෙදවීම යුක්තිගරුක දැයි විමසා සිටියේය. මේ තත්වය සභාවේ අනෙකුත් මන්ත්‍රීවරුන්ද වටහා ගත යුතු බවත් මේ ආකාරයට පවතින මූලික ගැටළු වලට විසඳුම් ලබා නොදී අත්‍යාවශ්‍ය නොවන කරුණු කෙරෙහි ඒ මුදල් යෙදවීම සුදුසු නොවන බවත් ඉන්ධන නොමැති වීම මත මේ නගරයේ ජනතාව මිය නොයන බවත් පවසා සිටියේය. මේ සඳහාත් බෙදීමක් අවශ්‍ය බවත් දේශීය ණය සහ සංවර්ධන අරමුදලෙන් මෙම කාර්යය සඳහා මුදල් ලබා ගන්නා බව පවසා මෙලෙස ස්ථාවර තැන්පතුවෙන් මුදල් ලබා ගැනීම කිසිසේත් අනුමත කළ නොහැකි බව පවසා සිටියේය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිමල් රාජපක්ෂ මැතිතුමා:**

පසුගිය මහා සභා රැස්වීමකදී රුපියල් කෝටි දෙකකට ආසන්න මුදලක් සභාවේ ස්ථිර තැන්පතු ගිණුමක බැංකුගත කරන බවට ප්‍රකාශ වූ අවස්ථාවේදී ඒ සම්බන්ධයෙන් කරුණු සාකච්ඡා කිරීමේදී ආණ්ඩු පක්ෂයේ ඇතැම් මන්ත්‍රීවරුන් විසින් එම මුදලත් ලබා ගැනීමට උත්සාහ කරනවාද යනුවෙන් විපක්ෂයෙන් විමසා සිටි බව සිහිපත් කළ එතුමා මෙම කෝටි දෙකේ මුදලට එක් එක් මහා සභා රැස්වීම් වල විවිධ යෝජනා ගෙන එමින් සිදු කිරීමට ගිය කාර්යයේ අවසන් ප්‍රතිඵලය අද මේ ආකාරයට ප්‍රසිද්ධියේ සියළුදෙනාටම දැක ගැනීමට තිබෙන බව පවසා සිටියේය. මෙම ව්‍යාපෘතිය සම්බන්ධයෙන් ශ්‍රවණාගාරයේ පැවති කරුණු පැහැදිලි කිරීමේදීත් මේ සඳහා අවශ්‍ය මුදල් දේශීය ණය සහ සංවර්ධන අරමුදලින් ලබා ගන්නා බවට ප්‍රකාශ කළ බව පැවසූ එතුමා ඒ ආකාරයට ලක්ෂ 121 ක් හෝ ඊට ආසන්න මුදලක් එම අරමුදලෙන් ණය වශයෙන් ලබා ගන්නා බව පවසමින් සභාවේ තිබෙන ස්ථාවර තැන්පතු වලින්ද කෝටියකට වඩා මුදලක් ලබා ගැනීමට කටයුතු කරන බව පෙන්වා දෙන ලදී. පසු ගිය මහා සභා රැස්වීමේදී ස්ථාවර තැන්පතු ඉවත් කරගෙන වැඩි පොළී ප්‍රතිශතයක් යටතේ නැවත බැංකුගත කරන බවට පවසා මාසයක් ඉක්ම ගිය පසු එම මුදල ඉන්ධන පිරවුම්හලේ කාර්යන් සඳහා යොදා ගැනීමට යෝජනා ගෙන එන බව පවසා සිටියේය. මෙම ඉඩමත් සභාව සතු එකක් නම් , සභාවේ මුදලුත් වියදම් කර නැවත තැන්පතුවකුත් තැබීමට අවශ්‍ය නම් එවැනි ව්‍යාපෘති සිදු කිරීමට පෙළඹෙන්නේ ඇයිද යන්න විමසා සිටියේය. අද වන විට මේ ප්‍රදේශයේ ජනතාවට ඉන්ධන ලබා ගැනීමට වෙනත් කිසිදු විකල්පයක් නොමැතිව ඇති එකම විසඳුම මෙම ඉන්ධන පිරවුම්හල පමණක් වී ඇත්නම් මෙය අනිවාර්යයෙන් සිදු කළ යුතු ව්‍යාපෘතියක් ලෙස අපද ඒ සඳහා එකඟ වන බවත් නමුත් එවැනි කඩිනම් අවශ්‍යතාවක් මේ සම්බන්ධයෙන් තමන් නොදකින බවත් පවසා සිටියේය. ගරු සභාපතිතුමා සිදු කළ කාර්යන් වලදී කාලෝචිත වූ සියළු කාර්යන් සඳහා කුහක දේශපාලන ගති පසෙකලා විපක්ෂයක් ලෙස අප හැකි උපරිම සහය ලබා දුන් බව සිහිපත් කළ එතුමා මෙම ව්‍යාපෘතිය එතරම් අත්‍යාවශ්‍ය නොවන බවත් සභාවේ ස්ථිර තැන්පතු මුදල් වැය කර මෙය සිදු කරන්නට යන්නේ නම් ඒ සඳහා තමන් පෞද්ගලිකව විරුද්ධ වන බවත් සිය සහය මේ යෝජනාව සඳහා ලබා නොදෙන බවත් පවසා සිටියේය.

**ගරු සභාපති ඒ.ජී. දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

මේ කාර්යය සඳහා දේශීය ණය සහ සංවර්ධන අරමුදලින් අනිවාර්යයෙන්ම මුදල් ලබා ගන්නා බවත් නමුත් බලපත්‍රය ලබා ගන්නා අවස්ථාවේදී මෙම මුදල් IOC සමාගමට ලබා දිය යුතු බවත් පෙන්වා දෙන ලදී. බල පත්‍රය දෙන අවස්ථාවේදී අදාල ගිවිසුමට ගිවිසුම්ගත නොවුනහොත් එම ගිවිසුම අවලංගු වන බව පෙන්වා දෙන ලදී. එම ගිවිසුමට පසු ව්‍යාපෘතියට අදාල සැලැස්ම හිමි වන බවත් එයට අනුව ඇස්තමේන්තුව සකස් කර ණය මුදල ලබා ගැනීමට කටයුතු කළ යුතු බවත් පැවසූ එතුමා ලබා ගන්නා ණය මුදලේදී තැන්පතු ලෙස බඳින රුපියල් ලක්ෂ 50ක මුදලද ලබා ගැනීමට හැකියාව ඇති බව පෙන්වා දෙන ලදී. දේශිය ණය අරමුදලෙන් 06 %ක පොළියට ණය ලබා දිමට එකඟ වී ඇති බැවින් තමන් ඒ සම්බන්ධයෙන් අදාල රාජ්‍ය ඇමතිවරයාද හමුවී සාකච්ඡා කළ බව පැවසූ එතුමා බල පත්‍රය ලැබුණු පසු අදාල ඇස්තමේන්තුව සකස් කර පැමිණෙන ලෙසත් ණය මුදල කඩිනමින් ලබා දීමට කටයුතු කරන බවට එතුමා විසින් තමන්ට දන්වා සිටි බවත් පවසා සිටියේය. එම නිසා ස්ථාවර තැන්පතුවෙන් ලබා ගන්නා මෙම මුදල ණය මුදල ලැබුණු පසු නැවත ස්ථාවර තැන්පතුවට එකතු කිරීමට හැකියාව ඇති බවත් දේශීය ණය අරමුදලේ ණය හිමි වන තෙක් බලා සිටියහොත් ඉන්ධන පිරවුම්හලට අදාල බලපත්‍රය අහිමි වී යා හැකි බවත් පවසා සිටියේය. තමන් සැමදාම මෙම සභාවේ සභාපතිවරයා වශයෙන් සිටීසට අපේක්ෂා නොරකන බවත් මෙම ව්‍යාපෘතිය දිගුකාලීනව මේ සභාවට ආදායම් ලැබෙන ව්‍යාපෘතියක් බැවින් ඉදිරියේදී පත් වන ඕනෑම සභාපතිවරයෙකුට එයින් සේවා සැලසීමේ අවස්ථාව හිමි වන බවත් පෙන්වා දෙන ලදී. එසේම දැනට නිකුත් කර ඇති චක්‍රලේඛ මඟින් සංවර්ධන කටයුතු නවතා ඇති බවට පැවසුවත් සභා ශක්තිමත් කිරීමේ අරමුණින් සිදු කරනු ලබන සංවර්ධන ව්‍යාපෘති සඳහා අවස්ථාව එමඟින් අහිමි වී නොමැති බවත් පවසා සිටියේය. තව වසර පහක් හයක් ඉදිරියේදී මෙම ව්‍යාපෘතිය හේතුවෙන් සභා අරමුදල ශක්තිමත් වී සේවක වැටුප් ආදිය ගෙවා ගැනීමට හැකි පසුබිමක් උදා වන බවත් තමන් සභාපති ධූරය භාර ගන්නා අවස්ථාවේ සභා අරමුදලේ පැවතිය තත්වය හේතුවෙන්ම ඉදිරියේදී පත්ව එන සභාපතිවරයෙකුට එවැනි අපහසුතාවයන් ඇති නොවන ආකාරයෙන් සභා අරමුදල ශක්තිමත් කිරීමට අවශ්‍ය මෙවැනි යෝජනා ගෙන ආ බව පවසා සිටියේය. මේ කාර්ය නිසි පරිදි සිදු කළහොත් පසු දින සිටම එයින් ලාභයක් සභාවට හිමි වන බව පෙන්වා දෙන ලදී. සභාවේ භූමියක මෙවැනි ඉදි කිරීමක් සිදු කිරීමට රුපියල් ලක්ෂ 50 ක මුදලක් වියදම් කරන්නේ ඇයිද යන්න සම්බන්ධයෙන් එක් මන්ත්‍රීතුමෙකු විමසා සිටි බවත් මේ ඉදි කිරීමේ තනි අයිතිය සභාවට හිමි වන බවත් එය IOC සමාගමට හිමි නොවන බවත් පවසා සිටියේය. එම නිසා මේ සම්බන්ධයෙන් පුළුල් අවබෝධයක් ලබා ගෙන එක් එක් කෝණ වලින් මේ දෙස නොබලා සභාවේ ගිණුම ශක්තිමත් කර ගැනීමේ අරමුණින් මේ සම්බන්ධයෙන් ක්‍රියා කරන ලෙස ඉල්ලා සිටියේය. මෙවැනි අවස්ථාවක් නැවත මෙම සභාවට හිමි නොවීමට ඉඩ ඇති බවත් එම නිසා ලැබුණු අවස්ථාවෙන් උපරිම ප්‍රයෝජනය ලබා ගැනීමට කටයුතු කළ යුතු බවත් පවසා සිටින ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රනිල් චන්ද්‍රකුමාර මැතිතුමා:**

මෙම ඉදි කිරීම සිදු කිරීම ගැටළුවක් නොවන බවත් ඒ සඳහා මුදල් වියදම් කරන ආකාරයේ ගැටළුක් පමණක් ඇති බවත් පැවසීය. තැන්පත් මුදල අවශ්‍ය වෙලවක ලබා ගත හැකි බව පැවසුවත් තමන්ට අවබෝධ වන ආකාරයට එය එසේ සිදු කළ නොහැකි බවත් IOC සමාගම සමඟ ඇති ගිවිසුම අහෝසි කළහොත් පමණක් මේ මුදල ලබා ගත හැකි බව පෙන්වා දෙන ලදි. තව වසර ගණනාවකින් එසේ සිදු වුවත් ඒ කාලය වන විට රුපියල් ලක්ෂ 50 ක මුදලේ වටිනාකම මීට වඩා බොහෝසෙයින් අඩු වී තිබිය හැකි බවත් පවසා සිටියේය. එසේම ඇස්තමේන්තුව සකස් කර නොමැති බව පැවසූ බවත් ඒ කරුණ සම්බන්ධයෙන් යම් පැහැදිලි කිරීමක් සිදු කරන ලෙසත් ගරු සභාපතිතුමාගෙන් ඉල්ලා සිටියේය.

**ගරු සභාපති ඒ.ජී. දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

ගිවිසුම අත්සන් කරන විට මුදල් තැන්පතුව ලබා දුන් පසු අදාල සමාගමෙන් අප වෙත සැලසුම ලබා දෙන බවත් එකී සැලසුමට අනුව ඇස්තමේන්තුව සකස් කිරීමේ කාර්ය පසුව සිදු කරන බවත් පෙන්වා දෙන ලදී. මුදල් වියදම් කිරීමේදී නීත්‍යානුකූල රාමුවෙන් බාහිරව එම කාර්යයන් සිදු කළ නොහැකි බව පවසා සිටියේය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රනිල් චන්ද්‍රකුමාර මැතිතුමා:**

මෙම ව්‍යාපෘතිය සම්බන්ධ පැහැදිලි කිරීමේදී කෝටි 10 ක මුදල දේශීය ණය හා සංවර්ධන අරමුදලින් ලබා ගන්නා බවටත් ඉතිරි ලක්ෂ 21 ක මුදල ව්‍යාපෘතියේ ලැබෙන ආදායමෙන් පියවා බවටත් ප්‍රකාශ වූ බවත් නමුත් දුන් එයට වඩා වැඩි මුදලක් වියදම් වන බව පවසා සිටියේය. එසේම ගරු සභාපතිතුමා විසින් මීට සුළු මොහොතකට පෙර ස්ථාවර තැන්පතුවෙන් ලබා ගන්නා මෙම මුදල් ණය මුදලට එකතු කර ලබා ගෙන ඒ මුදල් නැවත ස්ථාවර තැන්පතුවට ලබා දිය හැකි බවට ප්‍රකාශ කළ බවත් ඒ සම්බන්ධයෙන් වගකීම භාර ගන්නවාද යන්න පිළිබඳව පවසන ලෙස ඉල්ලා සිටියේය.

**ගරු සභාපති ඒ.ජී. දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

ණය මුදල අනුමත වන තෙක් මේ කාර්යන් සිදු විය යුතු බවත් කලින් ණය ලබා නොදෙන බැවින් මෙලෙස සිදු කළත් ණය අනුමත වන තුරු මේ කාර්ය ආරම්භ නොකරන බවත් පවසා සිටියේය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රනිල් චන්ද්‍රකුමාර මැතිතුමා:**

ගරු සභාපතිතුමා පවසන කාරණය පැහැදිලි වන බවත් ව්‍යාපෘතිය සම්බන්ධයෙන් මූල්‍ය ඇස්මේන්තුවක් කලින් සකස් කර යන වියදම් පිළිබඳ අවබෝධයක් ලබා ගෙන ඇති බවත් ඒ අනුව සභාව සතු මුදල් යොදවාගෙන මේ කාර්යයේ පළමු පියවර ආරම්භ කළ යුතු බවත් පිළිගන්නා බව පැවසූ එතුමා ණය මුදල අනුමත වූ පසු මේ ලබා ගන්නා මුදල් වලින් වැඩිපුර ඇති මුදල් නැවත සභාවේ ගිණුම් වලට යෙදවිය හැකි නොවේදැයි විමසා සිටියේය. එය සිදු කළ හැකි නම් මේ සභාවේ එය ප්‍රකාශ කරන ලෙසත් ඉල්ලා සිටියේය.

**ගරු සභාපති ඒ.ජී. දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

එලෙස එකතු කළ හැකි බව ප්‍රකාශ කර සිටියේය. ඇස්තමේන්තු සකස් කරන විට තැන්පතුව සඳහා ලබා ගත් රුපියල් ලක්ෂ 50 ක මුදලත් ඇතුලත් කර එය සකස් කර එම මුදල ලබා ගැනීමට කටයුතු කළ හැකි බව පවසා සිටියේය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රනිල් චන්ද්‍රකුමාර මැතිතුමා:**

මෙම ව්‍යාපෘතියට බාධා කිරීමට අවශ්‍ය නොවන බවත් එදා සිටම මේ කාර්ය වඩාත් සාධනීය ආකාරයෙන් සිදු කර ගැනීම සඳහා අවශ්‍ය කරුණු විපක්ෂයක් ලෙස අප විසින් ඉදිරිපත් කරන ලද බවත් පවසා සිටියේය. නමුත් අප නියෝජනය කරනු ලබන්නේ විපක්ෂය බැවින් කුමන ප්‍රකාශයක් සිදු කළත් එය අදාල කාර්යට බාධා සිදු කිරීම සඳහා සිදු කරන ප්‍රකාශ ලෙස වැරදි අවබෝධයක් ඇති කර ගන්නා බව පවසා සිටියේය.

**ගරු සභාපති ඒ.ජී. දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

සියළු කාර්යන් සිදු කිරීමේදී ඒවායේ ධනාත්මක පැතිකඩ කෙරෙහි අප අවධානය යොමු කරන බවත් ගැටළුවක් උද්ගත වූ විට තර්ක විතර්ක සිදු කරමින් වඩාත් නිවැරදි තීරණය ලබා ගැනීම සඳහා අවස්ථාව හිමි කර ගන්නා බවත් පෙන්වා දුන් එතුමා ගරු මන්ත්‍රීවරුන් මතු කරන ගැටළු අප ආදර්ශයක් කර ගත යුතු බව පවසා සිටියේය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රනිල් චන්ද්‍රකුමාර මැතිතුමා:**

අප විසින් කිසිදු අවස්ථාවක අයහපත් ප්‍රකාශ සිදු නොකරන බවත් මේ සභාව දේශපාලන ආයතනයක් බැවින් සහ මාසිකව මහා සභා රැස්වීමක් කැඳවා මේ කාර්යන් සිදු කළ යුතු බවට ක්‍රමවේදයක් සකස් කර ඇත්තේත් මේ හේතුව නිසා බව පවසා සිටියේය.

(ගරු මන්ත්‍රී විකුම් චන්දන මැතිතුමා සභාවට පැමිණෙන ලදී.පෙ:ව: 10.32)

එසේ නොමැති නම් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයයේ මෙන් ප්‍රාදේශීය ලේකම් ඇතුළු පරිපාලන නිලධාරීන්ට සියළු තීන්දු තීරණ ලබා ගැනීමට අවස්ථාව ලබා දිය හැකි බවත් එසේ නොමැතිව මේ ආයතන සඳහා වෙනම ක්‍රමවේදයක් සකස් කර ඇත්තේ මේ සභාවට අපව පත් කර එවා ඇති මිනිසුන්ගේ මතය සභාව ඉදිරියේ ප්‍රකාශ කිරීමට බවත් පවසා සිටියේය.

**ගරු සභාපති ඒ.ජී. දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

අවශ්‍ය කාරණය මහා සභාවට යෝජනා කරන ලෙසත් එම කරුණත් ඇතුලත් කර ණය මුදල ලබා ගැනීමට කටයුතු කළ හැකි බව පවසා සිටියේය. තමන් මෙය ප්‍රකාශ කළ බව පමණක් සඳහන් වීමට හෝ මේ ව්‍යාපෘතිය පුරා තමන් ගේ කාර්යක් ලෙස මෙය පවත්වාගෙන යාමේ අවශ්‍යතාවයක් තමන්ට නොමැති බවත් පවසා සිටියේය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රනිල් චන්ද්‍රකුමාර මැතිතුමා:**

මහා සභාව විසින් ගනු ලබන තීරණ ක්‍රියාත්මක කරන්නේ ගරු සභාපතිතුමා ප්‍රමුඛ නිලධාරීන් බවත් ඒ සඳහා අනෙකුත් මන්ත්‍රීන් මැදිහත් නොවන බවත් පවසා සිටියේය. ඒ සඳහා ඇති බලය හිමි වී තිබෙන්නේ ගරු සභාපතිතුමාට බැවින් ව්‍යාපෘතියේ කටයුතු වලට අවශ්‍ය මුදල් ලබා ගත් පසු ණය මුදලින් ඉතුරු වන මුදල් ස්ථිර තුන්පතු ගිණුමට නැවත බැර කරන ලෙසත් ඒවා බල ප්‍රදේශයේ ජනතාවගේ මුදල් බැවින් නාස්ති වීමෙන් තොරන ආරක්ෂා කිරීම සභාවෙ ්වගකීමක් බවත් පවසා සිටියේය.

**ගරු සභාපති ඒ.ජී. දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

අද වන විට බැංකුවල මුදල් තැන්පත් කළහොත් 26%ක මුදල් පොළී අනුපාතයකට යා හැකි බවත් ණය මුදල 07 % ප්‍රතිශතයට ලබා ගෙන එය තැන්පතුවක් ලෙස බැංකු ගත කළහොත් එහි පොළියත් වටිනා බව පවසා සිටියේය. එම නිසා ඇස්තමේන්තුව සකස් කරන විට මේ සියළු කරුණු ඇතුලත් කර ණය මුදල ලබා ගතහොත් සභා අරමුදලත් ව්‍යාපෘතියත් යන කාරණා දෙකම ශක්තිමත් බව පවසා සිටියේය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වික්ටර් බණ්ඩාර මැතිතුමා:**

කොතරම් වාද විවාද සිදු කළත් මෙම ඉන්ධන පිරවුම්හල සභාවට ඉතාමත් වැදගත් ව්‍යාපෘතියක් බව පවසා සිටියේය. නමුත් ගැටළුවකට ඇත්තේ වරින් වර එක් එක් ස්වරූපයෙන් මේ කාර්යට අදාල යෝජනා සභාවට ඉදිරිපත් කිරීම බව පැවසීය. එක් වරක් මේ සඳහා දේශීය ණය සංවර්ධන අරමුදලෙන් ණයක් ලබා ගෙන මෙය සිදු කරන බව පැවසූ බවත් ඊට පසු සභා රැස්වීමකදී සභාවේ ඇති රුපියල් කෝටි දෙකකට අදාල ස්ථිර තැන්පතු මුදල් වැඩි පොලියක් හිමි වන බැංකුවක තැන්පත් කිරීමට එම මුදල් නිදහස් කර ගැනීමට අනුමැතිය ලබා ගැනීම සඳහා යෝජනාවක් ඉදිරිපත් කළ බවත් ඊට පසුව මෙම සභාවට මේ ආකාරයෙන් යෝජනාවක් ගෙන ආ බවත් පෙන්වා දුන් එතුමා එක එක සභාවට ගෙන එනු ලබන යෝජනා පරස්පර වීම මත මේ ආකාරයේ ගැටළු ඇති වන බව පවසා සිටියේය.

(ගරු මන්ත්‍රී සරත් විජේසිරි මැතිතුමා සභාවට පැමිණෙන ලදී. 10.35)

මේ ප්‍රදේශයේ ජනතාවගේ බදු මුදලින් එකතු කර ගත් මුදල් ප්‍රදේශයේ ජනතාවගේ සුබසිද්ධිය වෙනුවෙන් වියදම් කළ යුතු බවත් මේ ව්‍යාපෘතිය සිදු කිරීම සඳහා මේ මුදල් යොදවා ගැනීම සම්බන්ධයෙන් තම ප්‍රසාදයක් නොමැති බව පවසා සිටියේය. මෙයින් අදාල ව්‍යාපෘතිය සඳහා තමන් විරුද්ධ බවට අදහසක් ඇති කර නොගන්නා ලෙසත් ඒ සඳහා අනුගමනය කිරීමට යෝජනා කළ ක්‍රමවේද සඳහා යොමු වීම සුදුසු බවත් පවසා සිටියේය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ප්‍රියන්ත උදයකුමාර මැතිතුමා:**

මෙය කාලෝචිත යෝජනාවක් බවත් මේ වන විට සභාවේ සිටින අනියම් සේවකයන්ට සහ සභිකවරුන්ට දීමනා ලබා දීමට ප්‍රමාණවත් මුදලක්වත් මේ සභා අරමුදලේ නොපවතින අවස්ථාවක සභාවට ආදායමක් ලැබෙන මෙවැනි කාර්යක් සඳහා මුලපිරීම වඩාත් සුදුසු බව පැවසීය.

(ගරු මන්ත්‍රී රනිල් චන්ද්‍රකුමාර මැතිතුමා සභාවෙන් පිටතට යන ලදී. පෙ:ව: 10.31)

කෙසේ වෙතත් ගරු මන්ත්‍රී කෝසල ජයවීර මැතිතුමා පැවසූ කරුණ සමඟ තමන්ද එකඟ වන බවත් අද වන විට මේ රටේ මෙන්ම බල ප්‍රදේශයේත් බහුතර ජනතාවක් දැඩි ආර්ථික අර්බුදයන්ට මුහුණ දෙමින් සිටින බව පවසා සිටියේය. එම නිසා මේ රට ගොඩනැඟීම සඳහා මේ රට පාලනය කරන ඉහළ සිට පහළ දක්වා සිටින කිසිම වගකිව යුතු බලධාරියෙකුට කිසිදු ස්ථිර වැඩපිළිවෙලක් නොමැති බවත් ඔවුන් තම බලය රැක ගැනීම සඳහා පමණක් කටයුතු කරන බව තම පෞද්ගලික මතය බව පවසා සිටියේය. මෙම මුදල තැන්පතුවක් ලෙස තබාගෙන ඉන්ධන පිරවුම්හල ආරම්භ කළහොත් මේ මුදල නාස්ති වීමක් සිදු නොවන බවට තමන් විශ්වාස කරන බවත් මේ ඉන්ධන පිරවුම්හල ආරම්භ කළහොත්එතුළින් සභාවට ලැබෙන ආදායමෙන් ප්‍රදේශයේ ආර්ථික දුෂ්කරතා ඇති ජනතාවට යම් සේවයක් සිදු කළ හැකි බවට තමන් විශ්වාස කරන බව පවසා සිටියේය. එසේ නොමැතිව මේ මුදල් සුබසාධන කාර්යන් සඳහා පමණක් යොදා ගතහොත් සභාවට ආදායම් මාර්ගයක් ලැබීම අහිමි වන බව පවසා සිටියේය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අමිල කන්දෙආරච්චි මැතිතුමා:**

සභාව සතු ස්ථිර තැන්පත් මුදලක් තිබෙන බවත් එම මුදලින් මේ ව්‍යාපෘතියේ මූලික කටයුතු ආරම්භ කිරීමට යෝජනාවක් ගෙන ආ විට පිරිසක් ඒ සඳහා කැමැත්ත ප්‍රකාශ කරන අතර තවත් පිරිසක් එයට විරුද්ධ වන බව පවසා සිටියේය. ව්‍යාපෘතියක් ආරම්භ කිරීමේදී ඒ සඳහා මූලික පිරිවැයක් සභාව විසින් දැරිය යුතු වන බවත් තම පාලන කාලය තුළ මේ ගොඩනැඟිල්ල ඉදි කිරීමේ කාර්යයේදී මූලික සැලසුම් සකස් කර ගැනීම සඳහා නාගරික සංවර්ධන අධිකාරියට මූලික ගෙවීමක් සිදු කළ යුතු වූ බවත් ඒ අවස්ථාවේදීත් එවකට සභාව නියෝජනය කළ ඇතැම් මන්ත්‍රීවරු තමන්ට අධිභාරයක් ගෙවීමට සිදු වනු ඇති බව පවසා ඒ සඳහා විරුද්ධ වූ බව පෙන්වා දෙන ලදී. එම නිසා මේ අවස්ථාවේදී ගරු සභාපතිතුමා ස්ථාවර තීරණයක සිට මේ කාර්යයේදී ක්‍රියා කළ යුතු බව පෙන්වා දෙන ලදී. මේ ප්‍රදේශයේ ජනතාව වෙනුවෙන් උන්නතිය වෙනුවෙන් යම් සේවයක් සිදු කරන්නේ නම් ඒ සඳහා වැය කිරීම සඳහා මෙම මුදල් ස්ථාවර තැන්පතු වල තබා තිබෙන බව පෙන්වා දුන් එතුමා ටැංකි සහ පොම්ප ලබා ගැනීම සඳහා මෙයට වඩා මුදලක් වැය වන බවත් ඒ වෙනුවෙන් තැන්පතුවක් ලෙස මෙම මිලියන 50 ක මුදල තැන්පත් කිරීමට සිදු වන බවත් පැවසීය. එම නිසා මේ සඳහා අවශ්‍ය තීන්දුව ලබා ගන්නා ලෙසත් විරුද්ධ පිරිසක් සිටියහොත් ඡන්ද විමසීමකට ගොස් හෝ අවශ්‍ය අනුමැතිය ලබා ගැනීමට ක්‍රියා කරන ලෙස ගරු සභාපතිතුමාගෙන් ඉල්ලා සිටින ලදී. එසේම මාර්තු මාසයෙන් මේ සභා වල දීර්ඝ කරන ලද කාලය අවසන් වන බැවින් බොහෝදුරට සභා විසුරුවා හැරීමට ඉඩ ඇති බවත් කොමසාරිස් පාලනයකට ගියහොත් මේ සභාවේ කාලය වැය කරමින් අප ගත් තීරණ ක්‍රියාත්මක කිරීමේ ගැටළුවක් උද්ගත වීමට ඉඩ ඇති බවත් පෙන්වා දෙන ලදී. මුලින්ම මේ සභා ගොඩනැඟිල්ලඉදි කිරීමේ සඳහාත් 40% ක කොටසක් සභා අරමුදලෙන් දරා ඉතිරි 60% ක මුදල සඳහා දේශීය ණය හා සංවර්ධන අරමුදලෙක් ණය මුදලක් ලබා ගැනීමට තීරණය කළ බවත් අවසානයේ එවකට මුදල් නියෝජ්‍ය ඇමතිව සිටි රංජිත් සියඹලාපිටිය මැතිතුමා මූලික වීමෙන් මේ ගොඩනැඟිල්ල සඳහා මිලියන 350 ක මුදලක් කැබිනට් මණ්ඩලය විසින් අනුමත කර ලබා දුන් බව පවසා සිටියේය.

(ගරු මන්ත්‍රී කේ.නිශාන් මැතිතුමා සහ ගරු මන්ත්‍රී ප්‍රියන්ත උදයකුමාර මැතිතුමා සභාවෙන් පිටතට යන ලදී. පෙ:ව: 10.42)

අද වන විට මේ ගොඩනැඟිල්ල ප්‍රදේශයේ ජනතාවට සේවය සැලසීම සඳහා ඉතිරිව ඇති බවත් එම කාර්යන් වලදී ආණ්ඩු පක්ෂය මෙන්ම විපක්ෂ නායක ලෙස කටයුතු කළ ගරු මන්ත්‍රී සෙස්ටස් අර්සකුලරත්න මැතිතුමා ඇතුළු විපක්ෂයෙන් ලැබුණු සහයද අගය කළ යුතු බව පවසා සිටියේය. එම නිසා මේ කාර්යය සම්බන්ධයෙන්ද කඩිනම් තීන්දුවක් ලබා ගැනීමට කටයුතු කරන ලෙස ගරු සභාපතිතුමාගෙන් ඉල්ලා සිටින ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සෙස්ටස් අර්සකුලරත්න මැතිතුමා:**

මේ සම්බන්ධයෙන් සභාවක් ලෙස තීන්දු තීරණ ගැනීමේදී එය ඉතාමත් වගකීමෙන් සිදු කළ යුතු බවත් මේ වියදම් කරන සෑම රුපියලක් පාසා මහජනතාවට වගකීමට අප බැඳී සිටින බවත් පවසා සිටියේය.

(ගරු මන්ත්‍රී ලක්මාල් සමරරත්න මැතිතුමා ගරු මන්ත්‍රී යූ.ආර්.ඒ.සී.කරුණාරත්න මැතිතුමා, ගරු මන්ත්‍රී අමිල කන්දෙආරච්චි මැතිතුමා සභාවෙන් පිටතට යන ලදී.පෙ:ව: 10.44)

මේ කරුණු සම්බන්ධයෙන් විගණන හා වෙනත් නීතිමය ප්‍රශ්න උද්ගත වන විට ඒ සඳහා අනුමැතිය ලබා දුන් සියළුදෙනාටම එකී ගැටළුවලට මුහුණ දීමට සිදු වන බව පවසා සිටියේය. මේ කරුණ පිළිබඳව ධනාත්මක මෙන්ම සෘණාත්මක පැතිකඩක්ද තිබෙන බව පැවසූ එතුමා මුලින් දේශීය ණය සහ සංවර්ධන අරමුදලෙන් ණය මුදලක් ලබාගෙන මේ කාර්ය සිදු කිරීමට තීරණය වුවත් දැන් එම තීරණය වෙනස් වන බව හැඟී යන බවත් පවසා සිටියේය. මේ සභාවේ මේ වනවිට අනියම් හා ආද්ශක කම්කරුවන් විශාල සංඛ්‍යාවක් සිටින බවත් ඔවුන්ට වැටුප් ගෙවිය යුතු වන්නේත් සභා අරමුදලෙන් බවත් පවසා සිටි එතුමා සභා අරමුදල දුර්වල වීම මේ සියළු කාර්යන් සඳහා බලපාන බව පවසා සිටියේය. එම නිසා වගකිව යුතු මහජන නියෝජිතයන් ලෙස මේ කාර්යන් සඳහා එකවරම අනුමැතිය ලබා දිය නොහැකි බවත් පවසා සිටියේය. සභාවේ ඉඩමක මධ්‍යම බෙහෙත් ශාලාවක් වැනි යමක් ඉදි කිරීමට යෝජනාවක් ගෙන ආවා නම් එය මේ අවස්ථාවේ සිදු කළ යුතුම කාර්යක් ලෙස පිළිගත හැකි බවත් නමුත් මෙය ඒ ආකාරයේ අත්‍යාවශ්‍ය කාරණයක් ලෙස තමන් නොදකින බව පවසා සිටින ලදී.

(ගරු මන්ත්‍රී කේ.නිශාන් මැතිතුමා, ගරු මන්ත්‍රී රනිල් චන්ද්‍රකුමාර මැතිතුමා,ගරු මන්ත්‍රී යූ.ආර්.ඒ.සී.කරුණාරත්න මැතිතුමා සභාවට පැමිණෙන ලදී. පෙ:ව: 10.54)

එම නිසා බල ප්‍රදේශයේ ජනතාවට මෙම ඉන්ධන පිරවුම්හල අත්‍යාවශ්‍ය දෙයක් නොවන බවත් නමුත් සභාව සතු මුදල් කුමන හෝ කාර්යකට වැය කර තමන් විසින් යමක් සිදු කල පැවසීමට මොවුන් බෙහෙවින් කැමති බව පවසා සිටියේය. පළාත් පාලන පනතින් ජනතාවගේ සුබවිහරණය සඳහා සිදු කළ යුතුයැයි නියම කර ඇති වැඩපිළිවෙලවල් ක්‍රියාත්මක කිරීම පසෙකලා මේ ආකාරයට ක්‍රියා කිරීම සුදුසු නොවන බව පවසා සිටියේය. එසේම ඉන්ධන ලබා ගැනීම සහා රජය විසින් හඳුන්වා දුන් නව ක්‍රමවේදය හේතුවෙන් ඉන්ධන පිරවුම්හල වල කාර්ය මණ්ඩල විශාල වශයෙන් සේවයෙන් ඉවත් කිරීමක් දක්නට ඇති බව පේනවා දුන් එතුමා එවැනි තත්වයක් තුළ මෙම ඉන්ධන පිරවුම්හල සාර්ථ වෙනු ඇතිද යන්න සම්බන්ධයෙන් සිතා බැලිය යුතු බවක් පවසා සිටියේය. මුදුගමුවේ සිට අවිස්සාවේල්ල දක්වා ඉන්ධන පිරවුම්හල් 06ක් පවතින බැවින් නව ඉදි කිරීමක් සිදු කළත් බලාපොරොත්තු වන ආකාරයේ සාර්ථකත්වයක් ලබා ගත හැකි වනු ඇතැයි අපේක්ෂා කිරීම සුදුසු නොවන බව පවසා සිටියේය. එසේම වර්තමානයේ පවතින ඉන්ධන අර්බුදය හේතුවෙන් ඉන්ධන බෙදා හැරීම සඳහා හඳුන්වා දී ඇති ක්‍රමවේදය මත ඉන්ධන පිරවුම්හල් බොහොමයක සේවකයන් සේවයෙන් ඉවත් කිරීමට බලධාරින් තීරණය කර ඇති බවත් එසේ වන්නේ ඔවුන්ගේ වැටුප් සහ අනෙකුත් දීමනා ලබා දීම සඳහා ප්‍රමාණවත් මුදලක් නොලැබීම මත බව පෙන්වා දෙන ලදී.

(ගරු මන්ත්‍රී ලක්මාල් සමරරත්න මැතිතුමා, ගරු මන්ත්‍රී ප්‍රියන්ත උදයකුමාර මැතිතුමා සභාවට පැමිණෙන ලදී. පෙ:ව: 10.56)

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.එම්.එම්.ෆර්හාන් මැතිතුමා:**

ඉන්ධන පිරවුම්හල ඉදි කිරීමේ කාර්යට විපක්ෂය විරුද්ධ බවට චෝදනාවක් එල්ල වන බවත් එය එසේ නොවන බවත් පවසා සිටියේය. සභාවේ ආදායම වැඩි කර ගැනීම සඳහා සිදු කරනු ලබන කාලෝචිත කාර්යන් වලදී ක්‍රමවත් වැඩපිළිවෙලක් යටතේ සිදු කරන කාර්යන් සඳහා විපක්ෂය විරුද්ධ නොවන බවත් නමුත් මේ කාර්ය කඩිනම් නොකර කල් මැරීම සම්බන්ධයෙන් නම් විපක්ෂයේ ප්‍රසාදයක් නොමැති බව පවසා සිටියේය.

(සභාව ඝෝෂාකාරී)

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.ජී.එස්.සී.කේ.පියරත්න මැතිතුමා :**

මහා සභා රැස්වීම් කීපයකම ප්‍රධාන මාතෘකාව ලෙස මේ ඉන්ධන පිරවුම්හල ඉදි කිරීමේ ව්‍යාපෘතිය පිළිබඳව කතා වෙන බවත් නමුත් අද වන විට මේ ප්‍රදේශයේ ජනතාවට ඇති ප්‍රධාන ප්‍රශ්නය එය නොව ලබන වසරේ පාසල් යන තම දූදරුවන්ට අවශ්‍ය පොත්පත් ලබා ගන්නේ කෙසේද යන කාරණාව බව පවසා සිටියේය. එම නිසා රුපියල් ලක්ෂ 50ක මුදලක් IOC සමාගම සඳහා ලබා දීම පිළිබඳව තමන් කිසිසේත් එකඟ නොවන බව පවසා සිටියේය. අද වන විට මේ ප්‍රදේශයේ ජනතාවට ඉන්ධන පිරවුම්හලකට වඩා අවශ්‍ය ප්‍රධාන කාරණය වන්නේ කුසගින්නට විසඳුමක් ලබා ගැනීම බවත් ඒ සම්බන්ධයෙන් අවධානය යොමු නොකර මෙවැනි කාර්යන් සඳහා ප්‍රමුඛස්ථානය ලබා දීම ප්‍රදේශයේ ගරු සභාපතිතුමාට ඡන්දය ලබා දුන් ජනතාව පිළිබඳව හෝ සිතා නවතා දමන ලෙස ඉල්ලා සිටියේය. එම නිසා රුපියල් ලක්ෂ 50ක මුදලක් සභාවේ මුදල් වලින් ලබා ගෙන IOC සමාගම සඳහා ලබා දීම පිළිබඳව තමන්ගේ පෞද්ගලික විරෝධය ප්‍රකාශ කරන බව පවසා සිටියේය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී ශ්‍රියානි ජයකොඩි මැතිණිය:**

මේ යෝජනාව සම්බන්ධව කතා කිරීමේදී ඉන්ධණ පිරවුම්හල ඉදි කිරීම පිළිබඳව බහුතරයක් මන්ත්‍රීවරුන්ගේ විරුද්ධත්වයක් නොමැති බවත් විරුද්ධ වන්නේ රුපියල් ලක්ෂ 50 ක මුදලක් IOC සමාගමේ තැන්පත් කිරීම සම්බන්ධයෙන් පමණක් නිසා ඒ සඳහා වෙනත් විකල්පයක් සම්බන්ධව අවධානය යොමු කිරීම සුදුසු නොවන්නේදැයි විමසා සිටියාය. ඒ අනුව ඉඩම් ප්‍රමාණය ම ඒ වටිනාකමට එය ඇපයට තබා බැංකු ණයක් ලබා ගෙන එම කාර්ය සිදු කළ නොහැකිදැයි විමසා සිටියාය.

**ගරු සභාපති ඒ.ජී. දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

සභාව සතු දේපල එලෙස බැංකු ඇපකර ලෙස තබා ණය ලබා ගත නොහැකි බව පෙන්වා දෙන ලදී. ණය මුදල ලබා ගන්නා තෙක් මෙය සිදු නොකරන ලෙස පැවසුවත් මේ මුදල වැය නොකර මෙහි මූලික කටයුතු ආරම්භ කළ නොහැකි බව පැවසීය. හිටපු සභාපති අමිල කන්දෙආරච්චි මැතිතුමා මෙය ඉතාමත් හොඳින් පැහැදිලි කර දුන් බවත් වැඩ කටයුත්තක් ආරම්භ කිරීම සඳහා අවශ්‍ය මූලික ක්‍රියා මාර්ග මුදල් නොමැතිව සිදු කරන්නෙ කෙසේද යන්න විමසා සිටියේය. අද වන විට පොත් ටික බෙදා ගැනීමට නොහැකිව බඩු පාර්සලක් දිළිඳු පවුලකට ලබා දිය නොහැකිව මේ සභා අරමුදල පැවතියත් තව අවුරුදු 05 ක් ගත වූ පසු මේ ව්‍යාපෘතිය තුළින් ලබන ආදායමෙන් මේ බල ප්‍රදේශයේ ජනතාවට සර්ව සාධාරණයක් සිදු කිරීමට හැකියාව ඇති බව හොඳින් පැහැදිලි කරුණක් බව පෙන්වා දෙන ලදී. එම නිසා දුර දිග බලා ගනු ලබන තීන්දු තීරණ වලට සහය ලබා දෙන ලෙසත් කියවන්නන් වාලේ කියවමින් සියල්ලගේම ඍණාත්මක පැතිකඩ පමණක් නොබලන ලෙස ඉල්ලා සිටියේය. අද වන විට වරිපනම් ආදායම හෝ මුද්දර ගාස්තු මඟින් ලැබෙන ආදායම එන තෙක් සේවක පඩි ගෙවීම සඳහා බලා සිටීමට සිදු වුවත් මේ ව්‍යාපෘතියේ සාර්ථකත්වය තුළ අනාගතයේ දිනක මේ සියල්ල ඉතාමත් කාර්යක්ෂමව සිදු කිරීමේ හැකියාව ඇති බව පෙන්වා දෙන ලදී. එම දිනයේදී මෙම ව්‍යාපෘතිය අපගේ සභා කාලයේ සිදු කරන ලද ව්‍යාපෘතියක් බවට අභිමානයෙන් යුතුව ප්‍රකාශ කිරීමේ හැකියාව මේ සියළුම මන්ත්‍රීවරුන්ට හිමි වන බවත් එහි අයිතිය තමන්ට පමණක් නොවන බවත් පෙන්වා දෙන ලදී. අද වන විට සැලසුම් සහගතව සිදු කරනු ලැබූ ක්‍රියා වල ප්‍රතිඵල වශයෙන් වසරේ හොඳම වාර්ෂික වාර්තාවට හිමි සම්මාන ප්‍රධානෝත්සවයේදී රාජ්‍ය අංශයට හිමි තෙවන ස්ථානයක් මේ සභාවට ලබා ගත හැකි වූ බවත් හෙට දිනයේදී ජාතික ඵලදායිතා තරඟාවලියේ රාජ්‍ය අංශයේ තෙවන ස්තානයට හිමි ජාතික සම්මානය ලබා ගැනීම සඳහා තමන් පිටත්ව යන බවත් පැවසූ එතුමා මේ සියල්ල සිදු කරනු ලැබුවේ මනා කළමනාකාරීත්වයෙන් මේ කාර්යන් හැසිරවීම හේතුවෙන් බවත් එම නිසා මෙම ව්‍යාපෘතියද මේ සභාවේ අනාගතය යහපත් ලෙස වෙනස් කරනු ලබන සුබදායී හැරවුම් ලක්ෂ්‍යක් වන බවට තමන් විශ්වාස කරන බව පවසා සිටියේය.

(ගරු මන්ත්‍රී නිමල් රාජපක්ෂ මැතිතුමා , ගරු මන්ත්‍රී අමිල කන්දෙආරච්චි මැතිතුමා සභාවට පැමිණෙන ලදී. පෙ:ව: 11.01)

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ශාන්තප්‍රිය පතිරණ මැතිතුමා:**

අනාගතය පිළිබඳව සිතා ගරු සභාපතිතුමා විසින් මෙම ඉන්ධන පිරවුම්හල ව්‍යාපෘතිය ආරම්භ කිරීමට පියවර ගෙන ඇති බවත් මේ ආකාරයේ යහපත් යෝජනා ගෙන එන විටත් ඇතැම් මන්ත්‍රීවරුන් ඒ සඳහා විරුද්ධ වන බවත් එහි යම් සාධාරණත්වයක් ඇති බවත් පවසා සිටියේය. එසේ වන්නේ මේ ව්‍යාපෘති වල ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන් නිවැරදි පැහැදිලි කිරීමක් පූර්වයෙන් මේ මන්ත්‍රීවරුන්ට නොලැබීම මත ඒ සම්බන්ධයෙන් ඇති කරගෙන ඇති සෘණාත්මක ආකල්ප හේතුවෙන් බවට තමන් විශ්වාස කරන බව පවසා සිටියේය. එම නිසා මේ කරුණු නිවැරදි ලෙස අවබෝධ කර දෙනවා නම් මේ සභාව නියෝජනය කරනු ලබන උගත් බුද්ධිමත් මන්ත්‍රීවරු මේ කරුණු නිසි ලෙස අවබෝධ කර ගන්නා බවත් පවසා සිටියේය. එසේම ආණ්ඩු පක්ෂ රැස්වීමක් හෝ නොපවත්වා මෙලෙස යෝජනා ගෙන ආ විට අපට වුවත් ඒ පිළිබඳව නිවැරදි අවබෝධයක් නොලැබෙන බවත් නමුත් ගරු සභාපතිතුමා ගෙන ආ යෝජනා නිවැරදි ඒවා බැවින් පූර්වයෙන් පැහැදිලි කිරීමක් සිදු කරන්නේ නම් වඩාත් සුදුසු බවට තමමන් විශ්වාස කරන බව පවසා සිටියේය.

**ගරු සභාපති ඒ.ජී. දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

අද උදැසන ආණ්ඩු පක්ෂ රැස්වීම පැවැත්වෙන බවට ගරු මන්ත්‍රී ශාන්තප්‍රිය පතිරණ මැතිතුමාට දැන්වුවත් ඔබතුමා එයට සහභාගී නොවූ බව පවසා සිටියේය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ශාන්තප්‍රිය පතිරණ මැතිතුමා:**

එකවරම දැන්වූ විට යොදා ගත් වැඩ රාජකාරි හේතුවෙන් පැමිණීමට නොහැකි වන බව පවසා සිටියේය. රුපියල් කෝටි දෙකකට ආසන්න මුදලක් සභාව සතු බවත් මේ මුදල් වලින් කොටසක් හෝ යොදවා ගම් වල සංවර්ධන කාර්යන් සිදු කළ යුතු බවට මිනිසුන් අතර මතයක් පවතින බවත් පැවසූ එතුමා අප සභාවට එන විට ඉන්ධන පිරවුම්හලට අත්සන් කිරීමටද සභාවේ බෝක්කුව සෑදීමටද යනුවෙන් විමසා සිටින බව පවසා සිටියේය. ගරු සභාපතිතුමා අනාගතය පිළිබඳව සිතා මේ කාර්යන් සිදු කළත් ඒ කාර්යන් කොතරම් නිවැරදි වුවත් මේ සභාවේදී ගරු සභාපතිතුමාට හිනා වී කතා කරන පිරිස් මෙයින් පිටතට ගොස් එතුමා විවේචනය කරන බව පවසා සිටියේය.

(සභාව සෝෂාකාරී)

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සරත් විජේසිරි මැතිතුමා:**

මීට පෙර ආදාහනාගාරය ඉදි කිරීමට ගිය අවස්ථාවේදීත් ඒ කාර්ය සඳහා පක්ෂ වූ පිරිස් මෙන්ම විරුද්ධ වූ පිරිසක්ද සිටි බවත් නමුත් අද වන විට එම කාර්ය සාර්ථකව නිමා කර දේශීය ණය සහ සංවර්ධන අරමුදලේ ණය මුදලත් ගෙවා අවසන් කර ඇති බව පවසා සිටියේය. කාල සීමාව අවසන් වේගන එන අවස්ථා වලදී බලයේ සිටින පිරිසකගේ දුර්වලතා සොයමින් විපක්ෂයේ සිටින පිරිස බලය ලබා ගැනීමට උත්සාහ කිරීම නිරන්තරයෙන් සිදු වන දෙයක් බවත් පවසා සිටියේය. මෙම කාර්ය සඳහා මෙතරම් මුදලක් වැය වන්නේ නම් වෙළඳ සංකීර්ණය සෑදීමේ කාර්ය පසෙකලා ඉන්ධන පිරවුම්හල සඳහා පමණක් පළමු අදියරේ අවස්ථාව සලසා දෙන්නේ නම් සුදුසු නොවන්නේදැයි විමසා සිටියේය. සාමාන්‍යයෙන් ව්‍යාපෘතියක් සිදු කිරීමේදී ඇස්තමේන්තුවක් සකස් කර එයට වඩා යම් ප්‍රමාණයක මුදලක් වැඩියෙන් තබා හෝ ණය මුදලක් ලබා ගත්තත් අවසානයේ 30% ක මුදලක් අප විසින් දැරීමට සිදු වන බවත් එසේ තිබියදී ණය මුදල අනුමත වන තුරු මේ කාර්යන් සිදු නොකරන ලෙස ඇතැම් මන්ත්‍රීවරු පවසන්නේ කෙසේදැයි විමසා සිටියේය. ව්‍යාපෘතියක් ආරම්භ කිරීමට නම් සභාවේ යම් මුදලක් පැවතිය යුතු බවත් එසේ නොමැති නම් ණය මුදලක් හෝ අනුමත නොවන බවත් පවසා සිටියේය. ඒ ආකාරයට දීර්ග කාලයක් ක්‍රමක්‍රමයෙන් ඉතිරි කරගත් මුදල් වලින් මෙවැනි කාර්යක් ආරම්භ කිරිමට ගරු සභාපතිතුමාට හැකි වූයේ මනා සකසුරුවමින් ඒ මුදල් පරිහරණය කළ නිසා බව පැවසූ එතුමා එවැනි දූරදර්ශී පාලනයක් සිදු කිරීම නිසා මේ ආකාරයට ඉතිහාසයේ පළමු වරට ජාතික මට්ටමේ ජයග්‍රහන මේ සභාවට ලබා දීමට හැකි වී ඇති බව පවසා සිටියේය. මේ කාර්ය සිදු කිරීමේදී නිලධාරීන් හා ලේකම්වරු ඥානාන්විත ලෙස ගරු සභාපතිතුමාට සහය ලබා දුන් බවත් එලෙස සාර්ථකව නිමා කළ තවත් එක්

ව්‍යාපෘතියක් වන හෙළ බොජුන් හල අද වන විට හොඳ ආදායමක් මේ සභාවට ලබා දෙන බවත් පවසා සිටින ලදී.

**ගරු සභාපති ඒ.ජී. දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

මෙම යෝජනාව සඳහා බෙදීමක් අවශ්‍යදැයි විමසා සිටියේය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කෝසල ජයවීර මැතිතුමා:**

යෝජනාව සඳහා බෙදීමක් අවශ්‍ය බව පවසා සිටියේය.

යෝජනාව සඳහා බෙදීමක් අවශ්‍ය බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කෝසල නුවන් ජයවීර මැතිතුමා විසින් යෝජනා කළ බැවින් ඡන්ද විමසීමක් සිදු කරන ලදී.

**<u>යෝජනාවට පක්ෂව ඡන්දය ප්‍රකාශ කළ සභිකයින්:</u>**

1. ගරුසභාපතිදමිඳුශ්‍යාමින්දමැතිතුමා -ශ්‍රීලංකාපොදුජනපෙරමුණ
2. ගරු උප සභාපති විමුක්ති කුමාර ජයරත්න මැතිතුමා. - ස්වාධීන මන්ත්‍රී
3. ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී අමිල කන්දෙආරච්චි මැතිතුමා - ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ
4. ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩබ්.අබේසේන මැතිතුමා. - ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ
5. ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩී.එස්.එම්.නිමල් මැතිතුමා. - ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ
6. ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී යූ.ජී.සරත් විජේසිරි මැතිතුමා. - ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ
7. ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ලක්මාල් සමරරත්න මැතිතුමා. - ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ
8. ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිනී එච්.අමරාවතී මැතිණිය. - ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ
9. ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ප්‍රියන්ත උදයකුමාර මැතිතුමා. - ශ්‍රී ලංකා නිදහස් පක්ෂය
10. .ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී අතුල ජයසිරි මැතිතුමා. - ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ
11. ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිනී.නයනා ප්‍රියන්ති මැතිණිය - ශ්‍රී ලංකා නිදහස් පක්ෂය
12. ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ශාන්තප්‍රිය පතිරණ මැතිතුමා - ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ
13. ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී කේ.නිශාන් මැතිතුමා - ශ්‍රී ලංකා නිදහස් පක්ෂය
14. ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී තුෂාර අමරසිරි මැතිතුමා - ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ
15. ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිනී සඳමාලි විජේරත්න මැතිණිය. - ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ
16. ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී විකුම් චන්දන කස්තිරගේ මැතිතුමා. - ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ
17. ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී යූ.ආර්.ඒ.සී.කරුණාරත්න මැතිතුමා - ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ
18. ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී යශෝධ පද්මසිරි මැතිතුමා. - ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ
19. ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී සුධර්මා ලක්මාලි මැතිණිය. - ශ්‍රී ලංකා නිදහස් පක්ෂය
20. ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිනී නීතා බාලසූරිය මැතිණිය. - ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ

**<u>යෝජනාවට විරුද්ධ බව ප්‍රකාශ කළ සභිකයින්:</u>**

1. ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී සෙස්ටස් අර්සකුලරත්න මැතිතුමා. - එක්සත් ජාතික පක්ෂය
2. ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී වික්ටර් බණ්ඩාර මැතිතුමා. - එක්සත් ජාතික පක්ෂය
3. ගරුප්‍රාදේශිය සභාමන්ත්රීඑම්.එම්.එම්.ෆර්හාන්මැතිතුමා. - එක්සත්ජාතිකපක්ෂය
4. ගරුප්‍රාදේශිය සභාමන්ත්රීඒ.ආර්.ඒ.එම්.දරුක්මැතිතුමා. - එක්සත්ජාතිකපක්ෂය
5. ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී නිමල් රාජපක්ෂ මැතිතුමා. - එක්සත් ජාතික පක්ෂය
6. ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී රනිල් චන්ද්‍රකුමාර මැතිතුමා. - එක්සත් ජාතික පක්ෂය
7. ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී සුගත් මාධව මැතිතුමා. - එක්සත් ජාතික පක්ෂය
8. ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිනී ශ්‍රියානි ජයකොඩි මැතිණිය. - එක්සත් ජාතික පක්ෂය

9. ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිනී එම්.බී.ආර්.එන්.එල්ලාවල මැතිණිය. - එක්සත් ජාතික පක්ෂය
10. ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිනී කේ.ජී.ඒ.කේ.සුමනදාස මැතිණිය - එක්සත් ජාතික පක්ෂය
11. ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී කෝසල නුවන් ජයවීර මැතිතුමා -ජනතා විමුක්ති පෙරමුණ
12. ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩී.ජී.එස්.සී.කේ.පියරත්න මැතිතුමා. - ස්වාධීන මන්ත්‍රී

<u>**මහා සභා රැස්වීම සඳහා නොපැමිණි සභිකයින්:**</u>

1. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අරුණ ශාන්තසිරි නිල්වල මැතිතුමා - එක්සත් ජාතික පක්ෂය
2. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී දිස්නා කුමාරි වීරක්කොඩි මැතිණිය - ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ

ඒ අනුව වැඩි ඡන්ද 08 කින් යෝජනාව සභා සම්මත විය.

**01.(xxix) ගරු සභාපති ඒ.ජී. දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

දෙහිඕවිට ප්‍රාදේශීය සභා ඉන්ධන පිරවුම්හල ඉදි කිරීමට අදාලව යෝජිත ව්‍යාපෘති භූමිය වන දෙහිඕවිට-ඇහැළියගොඩ බස්නැවතුම්පල භූමිය තුළ ඇති කඩ කාමර පහ ඉවත් කිරීමට සිදු වන බැවින් එලෙස ඉවත් වන කඩ කාමර සඳහා වෙනත් කඩ කාමර එකී භූමියේ අනෙක් පසින් ඉදි කිරීමට සිදුව ඇත. ඒ සඳහා දේශීය ණය සංවර්ධන අරමුදලේ ණය පහසුකම් අනුමත වන තුරු එම කඩ කාමර ඉදි කිරීම සඳහා සකස් කරන ලද ඇස්තමේන්තුවට අනුව වැය වන රු. 7,650,000.00 ( හැත්තෑ හය ලක්ෂ පනස් දහසක්) ක මුදල ප්‍රාදේශිය සභා අරමුදලෙන් හෝ ස්ථාවර තැන්පත් ගිණුමකින් ලබා ගැනීම සුදුසු බව යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.අබේසේන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ගරු සභාපති ඒ.ජී. දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

මෙම කාර්ය සඳහා ඇස්තමේන්තුවක් සකස් කර පළාත් පාලන කොමසාරිස් වෙත යොමු කළ බවත් මෙම කඩ කාමර කඩ කාමර ඉවත් නොකර ඒ කඩ ඒ ආකාරයෙන්ම පවතිද්දී කඩ හිමියන්ට වෙනත් ස්ථානයක කඩ සකස් කර දීම සඳහා මේ ඇස්තමේන්තුව සකස් කළ බව පවසා සිටියේය. ඉවත් නොකර තබා ගන්නා කඩ පේළිය ඉන්ධන පිරවුම්හලේ කාර්යාල සඳහා භාවිතා කරන බවත් කාර්යාල අලුතින් ඉදි කිරීම සඳහා යන වියදම මෙයින් අඩු වන බව පවසා සිටියේය. එම නිසා අලුත් ස්ථානයක කඩ පවත්වාගෙන ගිය පුද්ලගයන් සඳහා කඩ ඉදි කර දීමට අදහස් කර ඇති බවත් මේ සඳහා කමිටුවක් පත් කර ඒ කඩ හිමියන් සමඟද සාකච්ඡා අදාල කාර්ය සිදු කිරීමට අපේක්ෂා කරන බව පවසා සිටියේය. මෙම ඇස්තමේන්තුව පළාත් පාලන කොමසාරිස් වෙත ඉදිරිපත් කළ පසු ඔවුන් විසින් අලුත් මිල ගණන් යටතේ එම ඇස්තමේන්තුව සංශෝධනය කර එවා ඇති බවත් ඒ අනුව නව ඇස්මේන්තුව රුපියල් එක්කෝටි අට ලක්ෂ අනූ හතරදහස් අටසිය හැත්තෑ පහක් ලෙස (10,894.875.00) සංශෝධනය කර එවා ඇති බවත් පවසා සිටියේය. මේ කාර්ය සිදු වන්නේ දේශීය ණය සහ සංවර්ධන අරමුදලින් ණය මුදල් ලබා ගත් පසුව බවත් එතෙක් ඒ සඳහා මහා සභා අනුමැතිය ලබා ගැනීමට මේ යෝජනාව අද දින සභාවට ඉදිරිපත්කළ බව පවසා සිටියේය. ඒ අනුව ගරු සභාපතිතුමා විසින් අදාල යෝජනාව පහත පරිදි සංශෝධනය කිරීමට අවශ්‍ය බවත් පවසා සිටියේය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වික්ටර් බණ්ඩාර මැතිතුමා:**

නැවත කඩ ලබා දෙන බවට ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කළත් එම ව්‍යාපාර සඳහා ගණුදෙනුකරුවන් හුරු වී ඇත්තේ වර්තමානයේ පිහිටි ස්ථානයට බවත් ඔවුන් එම ස්ථානයෙන් ඉවත් කර එහි පිටුපසට වන්නට ස්ථානයක මේ කඩ කාමර ඉදි කර දුන්නොත් ඔවුන්ට ඒ ස්ථානයේ ව්‍යාපාර පවත්වාගෙන යාමට හැකියාව ඇතිද යන්න විමසා සිටියේය. එම නිසා එම ව්‍යාපාරික ස්ථාන වෙනත් තැනකට ගෙන න්නේ නම් පාරිභොගික ජනතාවට විවෘත වන ස්ථානයක් ඒ සඳහා ලබා දෙන ලෙස ඉල්ලා සිටින ලදී.

**ගරු සභාපති ඒ.ජී. දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

එම ස්ථානයේ ව්‍යාපාර පවත්වාගෙන යන විට ඉන්ධන පිරවුම්හලේ ඉදි කිරීම් කටයුතු සිදු කිරීමට අපහසු වන බව පෙන්වා දෙන ලදී. නමුත් මේ ව්‍යාපෘතිය එම ස්ථානයේ සිදු කළ පසු නිතැතින්මඑම ස්ථානය ජනාකීරණ තත්වයකට පත් වන බවත් ඒ නිසා අදාල ව්‍යාපාරිකයන්ට එමඟින් අසාධාරණයක් සිදු නොවනු ඇති බවත් පවසා සිටියේය. එම නිසා ඉන්ධන පිරවුම්හල පිටුපසට අඩි 20 ක පාරක් ඉදි කර එයට මුහුණලා මේ කඩ ඉදි කිරීමට අපේක්ෂා කරන බව පවසා සිටි එතුමා අදාල ව්‍යාපාරික ස්ථාන වල ඇත්තේ මෝටර් රථ අමතර කොටස් අළෙවිසැල් බැවින් ඉන්ධන පිරවුම්හලටත් නිරන්තරයෙන් වාහන පැමිණීම මත ඔවුන්ගේ ව්‍යාපාර වලට කිසිදු පාඩුවක් සිදු නොවන බව වගකීමෙන් ප්‍රකාශ කළ හැකි බව පවසා සිටියේය. එසේම දැනට පවතින ප්‍රමාණයට වඩා වර්ග ප්‍රමාණයෙන් විශාල කඩ කාමර එම ව්‍යාපාරිකයන්ට ලබා දීමට කටයුතු කරන බවත් පවසා සිටියේය.

(ගරු මන්ත්‍රිනී අජන්තා සුමනදාස මැතිණිය සභාවෙන් පිටතට යන ලදී. පෙ:ව: 11.27)

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සෙස්ටස් අර්සකුලරත්න මැතිතුමා:**

01(xxix)යෝජනාව සංශෝධනය කරනවාද යන්න විමසා සිටියේය. මෙම යෝජනාවේ කඩ කාමර කඩන බවට සඳහන් වී ඇති බවත් ප්‍රකාශ කරන විට එලෙස නොමැති බවට සඳහන් කරන බැවින් මේ යෝජනාව තේරුම් ගැනීමට අසීරු බව පවසා සිටියේය.

(සභාව ඝෝෂාකාරී)

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුගත් මාධව මැතිතුමා:**

යෝජනාව කියවීමේදී ඉවත් කරනු ලබන්නේ කඩ කාමර පහද ව්‍යාපාරද යන්න හරියාකාරව අවබෝධ නොවන බව පවසා සිටියේය.

**ගරු සභාපති ඒ.ජී. දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

කඩ කාමර කඩා ඉවත් නොකරන බවත් ඒවායේ තිබෙන ව්‍යාපාර ඉවත් කර එම කඩ කාමර ඉන්ධන පිරවුම්හලේ කාර්යාල ලෙස භාවිතා කර ව්‍යාපාරිකයන්ට වෙනත් කඩ කාමර ඉදි කර දෙන බව පවසා සිටියේය. නමුත් සභාවේ අනුමැතියෙන් තොරව අනවසරයෙන් එම ස්ථානයේ ඉදි කර ඇති කඩ කාමරය ඉවත් කිරීමට සිදු වනු ඇති බවත් පවසා සිටියේය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.ජී.එස්.සී.කේ.පියරත්න මැතිතුමා :**

මේ කාර්ය සිදු කිරීම සඳහා භූමිය වෙන් කරගෙන ඇතිද යන්න විමසා සිටියේය. එම බස් නැවතුම්පලෙන් බස් රථ කීපයක් ධාවනය වන බවත් එසේම එම භූමිය හරහා නිවාස කීපයක් වෙත ගමන් කරන මාර්ගයක් පවතින බවත් පැවසූ එතුමා මේවා ඉවත් කරන සීමාව ලකුණු කරගෙන තිබේද යන්න විමසා සිටියේය.

**ගරු සභාපති ඒ.ජී. දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

මේ භූමිය නිරවුල් කරගෙන ඇති ආකාරය හා ඒ සම්බන්ධ ඉදිරි කටයුතු සිදු වන ආකාරය ගරු මන්ත්‍රී යශෝධ පද්මසිරි මැතිතුමා විමසා සිටි අවස්ථාවේ පැහැදිලි කර දුන් බව සිහිපත් කර සිටියේය. එම නිසා එකම කරුණ සම්බන්ධයෙන් නැවත නැවත ප්‍රකාශ කිරීම අවශ්‍ය නොවන බව පවසා සිටියේය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.ජී.එස්.සී.කේ.පියරත්න මැතිතුමා :**

මේ ස්ථානයේ ව්‍යාපාර සිදු කරනු ලබන පුද්ගලයන්ට වෙනත් විකල්ප ස්ථානයක් ලබා දෙන්නේ නම් ඒ කුමන ස්ථානයෙන්ද යන්න විමසා සිටියේය.

**ගරු සභාපති ඒ.ජී. දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

පසු ගිය මහා සභා රැස්වීමට අදාල සැලසුම ඉදිරිපත් කළ බවත් එහිදී අදාල කරුණු සියල්ල තමන්විසින් පැහැදිලි කර දුන් බවත් පැවසූ එතුමා ඒ අවස්ථා වලදී අවධානය නොදී නැවත නින්දෙන් අවදි වූවාසේ මෙලෙස එකම කරුණ සම්බන්ධයෙන් නැවත නැවත විමසා සභාවේ කාලය වැය නොකරන ලෙස දන්වා සිටියේය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.ජී.එස්.සී.කේ.පියරත්න මැතිතුමා :**

කවුරු කෙසේ පැවසුවත් මේ ව්‍යාපෘතිය සාර්ථක වීමට ඇති අවස්ථාව අඩු බවත් අද වන විට සභා බල ප්‍රදේශයේ ජනතාව සිය කුසගින්නට විසඳුමක් ඉල්ලනවා හැර ඉන්ධන පිරවුම්හල් නොඉල්ලන බව පවසා සිටියේය. එම නිසා මෙතරම් මුදලක් ණයක් ලෙස ලබා ගෙන මේ අවස්ථාවේදී මෙවැනි ව්‍යාපෘතියක් සිදු කිරීම සම්බන්ධයෙන් තමන් විරුද්ධ බවත් මේ සඳහා සහය ලබා නොදෙන බව පවසා සිටියේය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කෝසල ජයවීර මැතිතුමා :**

ගරු සභාපතිතුමාගේ අවශ්‍යතාවය ඉටු කර ගැනීම සඳහා මෙම යෝජනාව උපක්‍රමශීලී ලෙස යොදාගෙන ඇති බව පවසා සිටියේය. මෙය ජනතා මුදල් වලින් වගකිව යුතු රාජ්‍ය ආයතනක සිදු කරනු ලබන ව්‍යාපෘතියක් බවත් මේ සඳහා පළමු යෝජනාව ගෙන ආ අවස්ථාවේදී දේශීය ණය සංවර්ධන අරමුදලින් මෙම ව්‍යාපෘතිය සිදු කරන බව පවසා අද වන විට ඒ සඳහා සභා අරමුදලේ හා ස්ථාවර තැන්පතු වල තිබෙන මුදල් ලබා ගැනීමට යෝජනා ගෙන එන බව පැවසීය. මීට පෙර තමන් ඉල්ලා සිටි ආකාරයේ සාක්‍යතා වාර්තාවක් අද හෝ මේ සභාවට ඉදිරිපත් කළ හැකිද යන්න විමසා සිටි එතුමා දේශීය ණය සංවර්ධන අරමුදලෙන් ණය ලබා ගන්නා බවට අදාල ලියවිල්ලක් හෝ මේ සභාවට ඉදිරිපත් කළ හැකිද යන්න විමසා සිටියේය.

(සභාව ඝෝෂාකාරී)

මේ මහජනතාවගේ මුදල් බවත් එම නිසා හිතූ හිතූ ආකාරයට ඒ මුදල් නාස්ති කිරීමට අනුමැතිය ලබා දිය නොහැකි බවත් පවසා සිටියේය.

(සභාව ඝෝෂාකාරී)

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අමිල කන්දෙආරච්චි මැතිතුමා :**

මේ කඩ කාමර වල සිටින ව්‍යාපාරිකයන් ඉවත් කරනවා නම් ගොඩනැඟිල්ල සෑදූ පසු ඉවත් කරනවාද ඊට පෙර එය සිදු කරනවාද යන්න පිළිබඳව අප දැනුවත් වී නැති බව පවසා සිටියේය. නමුත් මේ කාරණයේදී අප නැවත වරක් සභාවේ කතා කිරීමේදී ව්‍යාපෘතියක් ලෙස මෙය සිදු කරනවා නම් මේ කඩ කාමර සඳහාත් වැය වන මුදල් ඒ ණය ලබා ගැනීමේදී එයට ඇතුලත් කරන්නේ නැතිද යන ගැටළුව උද්ගත වන බව පවසා සිටියේය. ගොඩනැඟිලි ඉවත් නොකරන්නේ නම් ව්‍යාපාරිකයන්ද දඅන්ම ඉවත් කිරීමට අදහසක් නොමැති නම් මේ මුදල් කඩිනමින් අනුමත කර ගන්නේ කුමන හේතුවක් නිසාද යන ගැටළුව මේ මන්ත්‍රීවරුන්ට ඇති වන බව පවසා සිටියේය. එම නිසා මේ ව්‍යාපෘතිය තුළට මේ කඩ කාමර ඉදි කිරීමත් ඇතුලත් කර ඒ කාර්ය සිදු කරන ලෙස ගරු සභාපතිතුමාගෙන් ඉල්ලා සිටින බවත් මෙහි කැඳ ව්‍යාපාරයක් සිදු කරන පුද්ගලයාට නීත්‍යානුකූලව ලියවිල්ලක් නොමැති වීම මත යම් ගැටළුකාරී තත්වයක් ඇති වී තිබෙන බවත් පවසා සිටියේය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුගත් මාධව මැතිතුමා:**

හිටපු සභාපතිතුමා පැවසූ කාරණය විපක්ෂයක් ප්‍රකාශ කිරීමට උත්සාහ ගත් බවත් මේ කාර්යයන් දෙකම ණය ලබා ගෙන සිදු කිරීමට කටයුතු කරන ලෙසත් වඩාත් යෝග්‍ය වන්නේ එලෙස සිදු කිරීම බවත් පවසා සිටියේය.

(ගරු මන්ත්‍රී අමිල කන්දෙආරච්චි මැතිතුමා සභාවෙන් පිටතට යන ලදී.පෙ:ව: 11.51)

**ගරු සභාපති ඒ.ජී. දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

( ව්‍යාපෘතිය සැලැස්ම සභාවට ඉදිරිපත්කරමින් ව්‍යාපාරික ස්ථාන ඉදි කිරීමට අපේක්ෂා කරන ආකාරය පැහැදිලි කර සිටියේය.)

ඒ අනුව ඉන්ධන පිරවුම්හලේ ඉදි කිරීම් කටයුතු සඳහා භූමිය භාර දිය යුතු බවත් එහිදී මේ ව්‍යාපාරික ස්තාන පැවතීම එම කාර්යට අවහිරයක් වන බව පෙන්වා දෙන ලදී. හම නිසා ඔවුන් වෙනුවෙන් ඉදි කරනු ලබන කඩ කාමර කඩිනමින් සකස් කර එම ව්‍යාපාර අදාල ස්ථානයෙන් ඉවත් කළ යුතු බවත් ඒ සඳහා ණය මුදල අනුමත වනතුරු ප්‍රමාද විය නොහැකි බැවින් තිබෙන මුදලින් අදාල කාර්ය සිදු කිරීම ආරම්භ කර වැඩ අඩක් හෝ නිම කර ගැනීමට උත්සාහ කරන බව පෙන්වා දෙන ලදී. නමුත් ව්‍යාපෘතියෙ සමස්ථ කාර්යන් ආරම්භ කරන්නේ දේශිය ණය හා සංවර්ධන අරමුදලේ ණය හිමි වූ පසුව බවත් පවසා සිටියේය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රනිල් චන්ද්‍රකුමාර මැතිතුමා:**

මේ යෝජනාව අද අනුමත කර ගත්තද කාර්ය සිදු කරන්නේ දේශිය ණය හා සංවර්ධන අරමුදලේ ණය මුදල සඳහා අනුමැතිය හිමි වූ පසුව බවට ගරු සභාපතිතුමා පැහැදිලිව ප්‍රකාශ කරන්නේද යන්න විමසා සිටියේය.

**ගරු සභාපති ඒ.ජී. දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

එසේ නොමැතිව ණය ලබා නොගෙන මේ ව්‍යාපෘතිය ආරම්භ කර අතරමඟ නවතා දැමිය නොහැකි බවත් ණය මුදල අනුමත වන තුරු කාර්යය ආරම්භ නොකරන බවත් පවසා සිටියේය. මේ සභාවේ කිසිදු මන්ත්‍රීවරයෙකු බිල්ලට දමට තමා සූදානම් නැති බවත් වසර 04ක් පුරාවට කිසිදු අපකීර්තියක් අත් කර නොගත් තමන් මේ සභාව විසුරුවීමට ආසන්න කාලයේදී සිය නාමයට කැළලක් එකතු කර නොගන්නා බවත් පවසා සිටියේය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අමිල කන්දෙආරච්චි මැතිතුමා:**

මේ සම්බන්ධයෙන් පැහැදිලි අවබෝධයක් ලබා ගැනීමට අවශ්‍ය බැවින් කාරක සභාවක් බවට පත් කර වැඩිදුරටත් සාකච්ඡා කිරීම සුදුසු බැවින් මහා සභාව කාරක සභාවක් බවට පත් කරන බව යෝජනා කර සිටියේය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.අබේසේන මැතිතුමා:**

එම යෝජනාව ස්ථිර කර සිටියේය.

කාරක සභා අවස්ථාවෙන් අනතුරුව මහා සභාවත් බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අමිල කන්දෙආරච්චි මැතිතුමා විසින් යෝජනා කළ අතර ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.අබේසේන මැතිතුමා විසින් එය ස්ථිර කරන ලදී. ඒ අනුව යෝජනාව පහත පරිදි සංශෝධණය කරන බව ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කර සිටියේය.

“දෙහිඕවිට ප්‍රාදේශීය සභා ඉන්ධන පිරවුම්හල ඉදි කිරීමට අදාලව යෝජිත ව්‍යාපෘති භූමිය වන දෙහිඕවිට-ඇහැළියගොඩ බස්නැවතුම්පල භූමිය තුළ ඇති කඩ කාමර පහ ඉවත් කිරීමට සිදු වන බැවින් එලෙස ඉවත් වන කඩ කාමර සඳහා වෙනත් කඩ කාමර එකී භූමියේ අනෙක් පසින් ඉදි කිරීමට සිදුව ඇත. ඒ සඳහා දේශීය ණය සංවර්ධන අරමුදලේ ණය පහසුකම් අනුමත වන තුරු එම කඩ කාමර ඉදි කිරීම සඳහා සකස් කරන ලද ඇස්තමේන්තුවට අනුව වැය වනරුපියල් එක්කෝටි අට ලක්ෂ අනු හතරදහස් අටසිය හැත්තෑ පහක් ලෙස (10,894.875.00) සංශෝධනය කර එම මුදල ප්‍රාදේශීය සභා අරමුදලෙන් හෝ ස්ථාවර තැන්පත් ගිණුමකින්

ලබා ගැනීමටත් දේශීය ණය සහ සංවර්ධන අරමුදලේ ණය මුදල අනුමත වූ පසු මෙම ව්‍යාපෘතියේ වැඩ ආරම්භ කිරීම සුදුසු බවට යෝජනා කරමි“ යනුවෙන් එම යෝජනාව සංශෝධනය කරන බවත් පවසා සිටියේය.

සංශෝධිත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එස්.එම් නිමල් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

යෝජනාව බෙදීමකින් තොරව ඒකමතිකව සහා සම්මත විය.

**01.(xxx) ගරු සභාපති ඒ.ජී. දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

දෙහිඕවිට ප්‍රාදේශීය සභා ඉන්ධන පිරවුම්හල ඉදි කිරීම සම්බන්ධයෙන් පරිසර බල පත්‍රය, නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් නිරාකරණය, ගිනි ආරක්ෂණ බල පත්‍රය, මිනින්දෝරු සැලසුම් ආදායම් බල පත්‍රය, පත්ඉරු හිමිකම් වාර්තා ලබා ගැනිම වෙනුවෙන් වැය වන මුදල් සඳහා සහා අරමුදලෙන් රුපියල් ලක්ෂයක අත්තිකාරම් මුදලක් සහා අරමුදලෙන් හෝ සභාවේ ස්ථාවර තැන්පත් ගිණුමකින් ලබා ගැනීම සුුදුසු බව යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී සඳමාලි විජේරත්න මැතිණිය විසින් ස්ථිර කරන ලදී.

යෝජනාව බෙදීමකින් තොරව ඒකමතිකව සහා සම්මත විය.

**01.(xxxi) ගරු සභාපති ඒ.ජී. දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

වෙලන්ගල්ල පොදු සුසාන භූමියේ පවතින වට අඩි 15 ක සහ උස අඩි අඩි 05ක් පමණ වනලූණුමිදෙල්ල ගසේ අරටුව දිරා යාම හේතුවෙන් අනතුරුදායක තත්වයක් ඇති බැවින් රු.6000.00 අවම ලංසු මුදල ලෙස සලකා එම ටෙන්ඩර් කර වැඩිම ලංසු මුදලක් ඉදිරිපත් කරනු ලබන ලංසුකරුට වෙන්දේසි කර ලබා දීම සුදුසු බව යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එස්.එම්.නිමල් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

යෝජනාව බෙදීමකින් තොරව ඒකමතිකව සහා සම්මත විය.

**01.(xxxii) ගරු සභාපති ඒ.ජී. දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

පළාත් පාලන ආයතන වල ප්‍රසම්පාදන කාර්ය පටිපාටි වලඇති දුර්වලතා , ඒ පිළිබඳව සිදු කර ඇති අධීක්ෂණ අනාවරණයන්ද සලකා බලමින් පළාත් පාලන ආයතන සඳහා ප්‍රසම්පාදනය පිළිබඳ තෙදිනක විෂය පුහුණු වැඩසටහනක් ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාවේ නිලධාරින් විසින් පුස්සැල්ල කළමනාකරණ පුහුණු මධ්‍යස්ථානයේදී පවත්වයි. ඒ සඳහා මෙම සභාව නියෝජනය කරමින් ලේකම් එම්.ඩී.සී.රුක්ෂානි මහත්මිය, ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරී එච්.ඒ.ආර්.එස්.තිලකරත්න මහතා, සහ සංවර්ධන නිධාරී උපුල් ජයසිංහ මහතා සහභාගී වන අතර එම වැඩමුළුව සඳහා වන පාඨමාලා ගාස්තුව වන රු. 15,000.00 ක මුදල සභා අරමුදලින් දැරීම සුදුසු බව යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අතුල ජයසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

යෝජනාව බෙදීමකින් තොරව ඒකමතිකව සහා සම්මත විය.

**01.(xxxiii) ගරු සභාපති ඒ.ජී. දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

2021 වර්ෂයේ ක්‍රියාත්මක වූ පහත සඳහන් කර්මාන්ත අගුරින් කීපයක් 2022 වර්ෂය සඳහා අවිච්ඡේදව ඇති අතර එම කර්මාන්ත පවතින මිල ගණන් යටතේ ක්‍රියාත්මක කිරිමට අපහසු බවත් වැඩ අවසන් කර ඇති ප්‍රමාණයන්ට අදාල ගෙවීම සිදු කර කොන්ත්‍රාත් ගිවිසුම අවලංගු කරන ලෙසත් කොන්ත්‍රාත්කරුවන් විසින් ඉල්ලා ඇත.

| අනු අංකය | ව්‍යාපෘතිය | කොන්ත්‍රාත්කරු | ගිවිසුම්ගත වටිනාකම | ඉදිරිපත් කර ඇති බිල්පත් වටිනාකම |
|---|---|---|---|---|
| 1 | තල්දූව සති පොළ භූමිය සංවර්ධනය කිරීම අදියර 01 ( සතිපොළ භූමියේ ගොඩනැඟිල්ලක් ඉදිකිරීම) | ඇක්ෂස් ඉන්ටර් නැෂනල් ඉදිකිරීම් පුද්: සමාගම, ඉහළ බෝමිරිය, කඩුවෙල. | 11,026,084.00 | 1,519,025.92 |
| 2 | තල්දූව සති පොළ භූමිය සංවර්ධනය කිරීම අදියර 02 ( සතිපොළ භූමිය වටා ආරක්ෂිත වැට හා තාප්පය ඉදි කිරීම) | එකමුතු වැඩිහිටි සමිතිය, ඉහළ තල්දූව | 3,453,737.51 | 1,119,664.36 |
| 3 | දීගලවත්ත කසළ කළමනාකරණ මධ්‍යස්ථානය සඳහා ගොඩනැඟිල්ලක් ඉදි කිරීම. | පුබුදු වැඩිහිටි සමිතිය, අටුළුගම | 3,496,539.23 | 1,620,072.52 |
| 4 | දීගලවත්ත ගම හරහා ජල ව්‍යාපෘතිය | එක්සත් ග්‍රාම සංර්ධන සමිතිය, ගුරුගල්ල | 1,990,000.00 | 909,710.03 |

මෙම කර්මාන්ත වැඩ අවසන් කර ඇති ප්‍රමාණයන්ට පමණක් ගෙවීම් සිදු කර ගිවිසුම අවලංගු කර වර්තමානයේ පවතින මිල ගණන් යටතේ ඇස්තමේන්තු සංශෝධනය කර නැවත ප්‍රසම්පාදන කටයුතු සිදු කර ක්‍රියාත්මක කිරීම සුදුසු බව යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.අබේසේන මැතිතුමා විසින් ස්ථීර කරන ලදී.

**ගරු සභාපති ඒ.ජී. දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

මෙම ව්‍යාපෘති පසු ගිය වසරේ පළාත් සභාවෙන් මුදල් ලැබුණු ව්‍යාපෘති බවත්, එම මුදල් ලැබුණු පසු භාණ්ඩ වල මිල ගණන් වෙනස් වී ඒවා අවිච්ඡේද වී ඇති බවත් පෙන්වා දෙන ලදී. වර්තමානය වන විට ඒකකයක මිල වැඩි වීම් අනුව ලැබී ඇති මුදල් වලට එම කාර්යයන් සිදු කළ නොහැකි බැවින් මේ වන තෙක් සිදු කළ ඇති කාර්යයන් සඳහා බිල් පත් ඉදිරිපත් කර අදාල සමිති සමඟ ඇති ගිවිසුම් නිම කිරීමටත් පසුව නැවත තිබෙන මුදලට අදාලව ඇස්තමේන්තු සකස් කර එයට පළාත් සභා අනුමැතිය ගෙන එකී කාර්යයන් සිදු කිරීම සඳහා මෙම යෝජනාව ඉදිරිපත් කළ බව පවසා සිටියේය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිමල් රාජපක්ෂ මැතිතුමා:**

මෙහි සඳහන් කර ඇති දීගල වත්ත ගම හරහා ජල ව්‍යාපෘතියේ දැනට බිල් පත් ගෙවීම සඳහා රු. 909,710.03 (නම ලක්ෂ නම දහස් හත්සිය දහයයි ශත තුනක්) ක මුදලක් ගෙවීමට ඇති බවත් මෙම මුදලේ වටිනාකමට සිදු කර ඇති ඉදි කිරීම් මොනවාද යන්න දැනගැනීමට අවශ්‍ය බව පවසා සිටියේය.

**ගරු සභාපති ඒ.ජී. දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

දීගවත්තේ ජල ටැංකිය ඇති ස්ථානය සකස් කර ඇති බවත් ඊට පහළින් ඇති ළිඳ සකස් කර ඇති බවත් පවසා සිටියේය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිමල් රාජපක්ෂ මැතිතුමා:**

අද දිනයේ මෙම යෝජනාව මේ න්‍යාය පත්‍රයට ඉදිරිපත් කරන විට ඊයේ දිනයේ මේ ළිඳ ඉස ශුද්ධ කළ බව පවසා සිටියේය.

**ගරු සභාපති ඒ.ජී. දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

තවම මේ මුදල් කිසිවක් ගෙවා නැති බවත් මේ සම්බන්ධයෙන් ගරු මන්ත්‍රී නිමල් රාජපක්ෂ මැතිතුමාත් පෙන්වා දුන් පසු තමන් විසින් ඒ ස්ථානයට පළාත් ඉංජිනේරුවරයා කැඳවූ බවත් ඔහු මාර්ගයෙන් ඒ සම්බන්ධයෙන් උපදෙස් ලබා දෙන ලෙස දන්වා සිටි බවත් පැවසීය. ඉදි කිරීම් කළ පසු ළිඳ ඉසීමක් සිදු කර නොතිබූ බැවින් එය ඉස එහි වතුර සාම්පලයක් ගෙන එහි ගුණාත්මක තත්වය පරීක්ෂා කර බලන ලෙස පළාත් ඉංජිනේරු විසින් උපදෙස් ලබා දුන් බැවින් ඒ සඳහා සභාවේ සේවකයන් විසින් ළිඳ ඉසීම සිදු කළ බව පෙන්වා දෙන ලදී. ඒ හැරුණුකොට මෙයට අදාලව කිසිදු මුදලක් මේ වන තෙක් ගෙවා නොමැති බව පවසා සිටින ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිමල් රාජපක්ෂ මැතිතුමා:**

ළිඳ කපා සිලින්ඩර බස්සවා සියළු කටයුතු අවසන් කළ පසු ජලය පරීක්ෂා කිරීම සිදු කරන බව පැවසූ එතුමා මෙම ළිඳ පරීක්ෂා කර බැලුවහොත් එය ඌරන් බසින වලක ස්වරූපයක් දක්නට ඇති තැනක් බවත් මෙය කුඹුරක් අයිනෙන් කපන ලද ඇළක් හරස් කර සකස් කරන ලද වළක් බව පෙන්වා දුන් එතුමා මෙය පානීය ජලය ලෙස භාවිතා කිරීමට කිසිසේත් සුදුසු නොවන බව තමන් මීට පෙර මහා සභා රැස්වීමකදීත් පෙන්වා දුන් බව පවසා සිටියේය. මේ කරුණු පැහැදිලි කර දුන් පසු ඒවාට පිළිතුරක් නොලැබීම සම්බන්ධයෙන් කණගාටු වන බව පැවසූ එතුමා මෙය මී හරකුන් මඩ නෑමට භාවිතා කරන වලක ස්වරූපයක් ඇති බවත් ළිඳක් ලෙස පැවසිය නොහැකි බවත් පවසා සිටියේය. එම ස්ථානයේම ඊට මඳ දුරක් ඉදිරියෙන් ටැංකියක් ඇති බවත් (අදාල ඡායා රූප සභාවට පෙන්වමින්) තමන් සඳහන් කරන්නේ එම ටැංකිය පිළිබඳව නොවන බව පවසා සිටියේය. එම නිසා එම ස්ථානයට ගොස් ළිඳ පරීක්ෂා කර බලන ලෙස සියළුම මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලා සිටින බවත් එතෙක් මේ ගෙවීම් සිදු නොකරන ලෙසත් ඉල්ලා සිටියේය. මේ කර්මාන්තය සිදු කර ඇත්තේ අටුළුගම එක්සත් ග්‍රාම සංර්ධන සමිතිය, ගුරුගල්ල ලිපිනයේ පිහිටි සමිතියක් බවත් වසම ඇතුලත සමිතියකට මේ කාර්ය භාර නොදී වෙනත් ප්‍රදේශයක පිහිටි සමිතියක් සඳහා මේ අවස්ථාව ලබා දී ඇත්තේ ඇයිද යන්න විමසා සිටියේය. මෙවැනි ක්‍රියා හේතුවෙන් දීගලවත්ත ප්‍රදේශයේ ජනතාව දිගින් දිගටම බැට කන බවත් තමන් මේ කරුණු ප්‍රකාශ කරන්නේ කිසිවෙකුගෙන් අසාගෙන නොව සියැසින් මේ ස්ථානය පරීක්ෂා කර බලා යැයි පවසා සිටියේය. එම නිසා ආණ්ඩු පක්ෂය මෙන්ම විපක්ෂයත් නියෝජනය වන ලෙස මන්ත්‍රීවරුන් රැගෙන කාර්මික හා සේවා කාරක සභාවෙන් හෝ එම ස්ථානයට යන ලෙස ඉල්ලා සිටියේය.

**ගරු සභාපති ඒ.ජී. දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

තමන් පසුගිය සතියෙත් එම ස්ථානයට ගිය බව පවසා සිටියේය. එම ළිඳ ඉදි කිරීමට පෙරත් තමන් එම ස්ථානයට ගොස් පරීක්ෂා කළ බවත් පවසා සිටියේය. එම ස්ථානයේ මෝටර් මඟින් පානීය ජලය ලබා ගන්නා

ළිඳක් තිබූ බවත් එම ළිඳ මේ ආකාරයට පුළුල් කර මේ කාර්ය සිදු කළ බවත් පවසා සිටියේය. සිලින්ඩර් දැමීමට යාමේදී එම ස්ථානයේ ගලක් අසුවී ඇති බවත් එය ගල් බෝර දමා ඉවත් කළ නොහැකි ගලක් බැවින් ඒ හේතුවෙන් මෙය ටිකෙන් ටික පහළට ගැනීමට සිදු වූ බවත් පවසා සිටියේය. එම ස්ථානය බැකෝ යන්ත්‍රය මගින් හැරීමේදී මඩ වූ බවත් ඒ අවට සිටි පිරිස පවසන ආකාරයට එලෙස පැමිණි මඩ සිලින්ඩර අතරින් කාන්දු වී පැමිණෙන බවත් පවසා සිටියේය. එම නිසා කීප වරක් නැවත ළිඳ ඉස ඉන් පසු ජල සාම්පලක් ලබා ගෙන පරීක්ෂා කර බලන ලෙස තමන් විසින් උපදෙස් ලබා දුන් බව පවසා සිටියේය. ඒ අනුව වතුර ලබා ගෙන ඒ පරීක්ෂණ වාර්තාවට අනුව ඉදිරි කටයුතු සිදු කරන බව පවසා සිටියේය. පසුව අවශ්‍ය නම් වටේ ගල් අසුරා මඩ ජලය කාන්දු නොවන ලෙස සකස් කළ හැකි බවට ඉංජිනේරුවන් විසින් උපදෙස් ලබා දුන් බවත් පවසා සිටින ලදී. ජල සාම්පල වල වාර්තාව ලැබෙන තෙක් ගෙවීමට ඇති මුදල් සභාවේ තැන්පත් කර තබන බවත් තමන් සිටිනා තාක් අත්තනෝමතික ලෙස ගෙවීම් සිදු කිරීමට අවස්ථාවක් නොදෙන බවත්  පවසා සිටියේය. එලෙස මුදල් නොගෙවා ඇති තවත් ව්‍යාපෘතියක් දීගලවත්තේ තිබෙන බවත් රුපියල් ලක්ෂ අටකට ආසන්න මුදලක් අද වනතෙක් ගෙවා නොමැති බවත් පවසා සිටියේය. තමන්ට අවශ්‍ය නම් වෙනත් ජල සාම්පලයක් ඉදිරිපත් කර එම බිල ගෙවීමට තිබූ බවත්  නමුත් හැකි උපරිම විනිවිද භාවයෙන් මේ කාර්යන් සිදු කිරීමට තමන් නිරන්තරයෙන් කටයුතු කරන බවත් පවසා සිටින ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රනිල් චන්ද්‍රකුමාර මැතිතුමා:**

මෙම අනුමැතිය ලබා ගන්නේ අදාල මුදල ගෙවීම සඳහාද යන්න විමසා සිටියේය.

**ගරු සභාපති ඒ.ජී. දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

මේ බිල් පළාත් සභාව වෙත ගෙවීම් සඳහා ඉදිරිපත් කළ බවත් ඔවුන් එය අනුමත කළ පසු එම ගිවිසුම් අවසන් කර අලුතින් දැන් පවතින මිල ගණන් යටතේ ඉතිරි වන මුදල නැවත ඇස්තමේන්තු කරන බව පවසා සිටියේය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රනිල් චන්ද්‍රකුමාර මැතිතුමා:**

එවිට සම්පූර්ණ ව්‍යාපෘතියේ කටයුතු සිදු කළ නොහැකි වනු ඇතිද යන්න විමසා සිටියේය.

**ගරු සභාපති ඒ.ජී. දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

එසේ සියළුම කාර්යන් පවතින මිල ගණන් යටතේ සිදු කළ නොහැකි වනු ඇති බැවින් යම් යම් අයිතමයන් කපා හැරීමට සිදු වන බව පෙන්වා දෙන ලදී. මෙයට කොන්ත්‍රාත්කරුට දොස් පැවරිය නොහැකි බවත් එවකට රට පුරා පැවති තත්වය හේතුවෙන් සිදු වූවක් බවත් පෙන්වා දෙන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කෝසල ජයවීර මැතිතුමා:**

පළමු කොටසේ ගිවිසුම්ගත වටිනාකමට වඩා ඉදිරිපත් කර ඇති බිල්පත් වල වටිනාකම රුපියල් ලක්ෂ 04කින් වැඩි වී ඇති බව පැවසීය.

**ගරු සභාපති ඒ.ජී. දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

ගිවිසුම්ගත වටිනාකම රුපියල් එක්කෝටි දස ලක්ශ විසි හයදහස් අසූහතරක් බවත් (11,026,084.00) බිල් පත් වටිනාකම ලෙස සඳහන් කර ඇත්තේ රුපියල්පහලොස් ලක්ෂ දහනමදහස් විසිපහයි ශත අනූ දෙකක් බවත් (1,519,025.92) පෙන්වා දෙන ලදී. මිල ගණන් කියවීමේදී වරදවාගෙන කියවා ඇති බවත් මේ කරුණු අධ්‍යානයේදී වඩාත් සුපරික්ෂාකාරී විය යුතු බවත් පෙන්වා දෙන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කෝසල ජයවීර මැතිතුමා:**

එය තමන් අතින් සිදු වූ අතපසු වීමක් බව පවසා සිටියේය. මේ මුදල් ගෙවීම සඳහා අනුමැතිය ලබා දී ඇත්තේ කවුරුන් විසින්ද යන්න විමසා සිටියේය.

**ගරු සභාපති ඒ.ජී. දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

කාර්මික නිලධාරී බිල්පත් අනුමත කළ පසු ඒවා කොමසාරිස් කාර්යාලයට යවා එම නිලධාරීන් පරීක්සා කර බලා පසුව පළාත් ඉංජිනේරු අනුමැතිය ලබා දුන් පසු පළාත් පාලන අමාත්‍යාංශයට යොමු කරන බව පවසා සිටියේය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී විකුම් චන්දන මැතිතුමා:**

මේ ආකාරයෙන්ම දෙහිඕවිට දෙමළ විද්‍යාලය අසල කර්මාන්තයකටද සිදු වූ බවත් පවතින මිල වැඩිවීම් යටතේ සිදු කළ නොහැකි බැවින් කොන්ත්‍රාත්කරුගේ ගෙවීම් සිදු කර වැඩ අවසන් කර නැවත ගිවිසුම්ගත වූ බව පවසා සිටියේය.

යෝජනාව බෙදීමකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

**01.(xxxiv) ගරු සභාපති ඒ.ජී. දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

දෙහිඕවිට ප්‍රාදේශිය සභා වෙළඳ සංකීර්ණය සහිත බහු කාර්ය ගොඩනැඟිල්ලේ පිරිසිදු කිරීම් කටයුතු සඳහා 2023 වර්ෂයට ටෙන්ඩර් කිරීම් සිදු නොකර සභාව මඟින් අදාල පිරිසිදු කිරීමේ කටයුතු සිදු කිරීමට තීරණය කර ඇති බැවින් එකී කාර්ය සඳහා දංගම්පල දෙහිඕවිට C22 ලිපිනයේ පදිංචි එන්.කරුණාරත්න සහ හිගුරලකන්ද , දෙහිඕවිට ලිපිනයේ පදිංචි අයි. කුසුමලතා යන දෙපල බඳවා ගැනීම සුදුසු බව යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී එච්.අමරාවතී මැතිණිය විසින් ස්ථිර කරන ලදී.

යෝජනාව බෙදීමකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

**(ඊ) කාරක සභා වාර්තා සලකා බැලීම හා වෙනත් දිනයක් නියම කිරීම:**

2022.11.22 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා වාර්තා, 2022.11.22 දින පැවති පරිසර හා පොදු පහසුකම් කාරක සභා වාර්තාව,2022.11.22 පැවති නිවාස හා ප්‍රජා සංවර්ධන කාරක සභා වාර්තාව , 2022.11.23 දින පැවති කාර්මික හා සේවා කාරක සභා වාර්තාව සලකා බලන ලදී.

(උ) 2022 නොවැම්බර් මාසයට අදාල එකතු කල ආදායම් පිළිබඳ ප්‍රගති වාර්තාව හා වියදම් විස්තරය) සලකා බලන ලදී.

(ඌ) වෙනත් කරුණු:

**සභාවට දන්වා නොපැමිණි මන්ත්‍රීවරුන්ගේ නිවාඩු අනුමත කිරීම:**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.අබේසේන මැතිතුමා:**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අරුණ ශාන්තසිරි නිල්වල මැතිතුමා සහ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී දිස්නා කුමාරි වීරක්කොඩි මැතිණිය අසනීප තත්වයන් හේතුවෙන් අද දින මහා සභා රැස්වීමට නොපැමිණෙන බවත් ඔවුන් වෙනුවෙන් අසනීප නිවාඩු අනුමත කිරීම සුදුසු බවත් යෝජනා කරන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එස්.එම්.නිමල් මැතිතුමා:**

එම යෝජනාව ස්ථිර කරන ලදී.

ඒ අනුව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අරුණ ශාන්තසිරි නිල්වල මැතිතුමා සහ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී දිස්නා කුමාරි වීරක්කොඩි මැතිණිය සඳහා අසනීප නිවාඩු අනුමත විය.

**ගරු මන්ත්‍රීතුමන්ලාගේ සහ මන්ත්‍රීතුමියන්ලාගේ අදහස් ඉදිරිපත් කිරීම:**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී යශෝධ පද්මසිරි මැතිතුමා:**

අල්ගොඩ වසමේ පොල්අත්තාවෙල මාර්ගය පවුල් 27ක් පමණ භාවිතා කරනු ලබන සභාවට අයත් මාර්ගයක් බවත් පසු ගිය වර්ෂාවෙන් පසු එම මාර්ගය දැඩි ලෙස හානි වී ඇති බවත් පවසා සිටියේය. මේ හේතුවෙන් අද වන විට වාහන ධාවනය කළ නොහැකි තත්වයට මේ මාර්ගය පත්ව ඇති බැවින් කාර්මික නිලධාරියෙකු මඟින් පරීක්ෂා කර බලා මේ මාර්ගය වාහන ධාවනය කළ හැකි වන ලෙස සංවර්ධනය කර ගැනීමට අවශ්‍ය කටයුතු සලසා දෙන මෙන් ගරු සභාපතිතුමාගෙන් ඉල්ලා සිටියේය.

**ගරු සභාපති ඒ.ජී. දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

මේ සම්බන්ධයෙන් ලිඛිත ඉල්ලීමක් ලබා දෙන ලෙසත් කාර්මික නිලධාරි වාර්තාවක් ලබා ගෙන අවශ්‍යඉදිරි කටයුතු සිදු කිරීමට අවශ්‍ය පියවර ගන්නා බව පවසා සිටින ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී යූ.ආර්.ඒ.සී.කරුණාරත්න මැතිතුමා:**

වෙලන්ගල්ලේ මාබුන්නාවල මාර්ගයේ බෝක්කුවක් කැඩී ඇති බවත් ප්‍රදේශවාසීන්ගේ ශ්‍රමදායකත්වයෙන් එය සකස් කර ගැනීමට වැලි කියුබ් එකක් සහ ගල් ලබා දෙන ලෙස ඉල්ලා සිටියේය.

**ගරු සභාපති ඒ.ජී. දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

ලිඛිත ඉල්ලීමක් ලබා දෙන ලෙසත් කාර්මික නිලධාරිවරයෙකු යවා පරක්සා කර ඉදිරි කටයුතු සිදු කරන ආකාරය තීරණ කළ හැකි බවත් පවසා සිටියේය.

**ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එම්.එම්.එම්.ෆර්හාන් මැතිතුමා**

දෙහිඕවිට තැපැල් කාර්යාලය අසලින් ඇති කෙහෙල් වත්ත අතුරු මාර්ගයේ පිහිටි නිවසක ඉවුරක් ප්‍රාදේශීය සභා මාර්ගයට යොදා ඇති කොන්ක්‍රීට් පළුදු වන ආකාරයෙන් කැපීම හේතුවෙන් මාර්ගයට අලාභහානි සිදු වී ඇති බවත් මේ හේතුවෙන් එම ස්ථානයේ සිට මාර්ගයට යොදා ඇති කොන්ක්‍රීට් කැඩී යාමේ අවධානමක් ඇති බැවින් එය කඩිනමින් ප්‍රතිසංස්කරණය කර දෙන මෙන් ඉල්ලා සිටියේය. එසේම දයිගල ආපදා ගම්මානයේ බෝක්කුවක් කැඩී යාම නිසා පාසල් දරුවන්ට පාසල් යාමේදී පවා අනාරක්ෂිත තත්වයක් උද්ගත වී ඇති බැවින් ඒ සම්බන්ධයෙන්ද පරීක්ෂා කර කඩිනම් ක්‍රියා මාර්ගයක් ගන්නා ලෙස ඉල්ලා සිටියේය.

**ගරු සභාපති ඒ.ජී. දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

එම ඉඩම ප්‍රාදේශීය ලේකම් භාරයේ පවතින ඉඩමක් බවත් කාර්මික කමිටුව මහින්ද මේ සම්බන්ධයෙන් අවස්ථා කීපයකදී පරීක්ෂා කළ බවත් පවසා සිටියේය.ප්‍රාදේශීය ලේකම්ගේ මැදිහත වීම මත එම භූමිය මැනුම් කටයුතු සිදු කළ බවත් එහිදීත් මායිම් තිබුණේ මේ සඳහන් කළ ආකාරයෙන්ම බව පවසා සිටියේය.රජයේ මිනින්දෝරු විසින් මැනුම් කළ පසු එය අප විසින් පිළිගත යුතු බවත් නමුත් එම ස්ථානයේ යම් ගැටළුවක් තිබෙනබව තමන්ද පිළිගන්නා බව පැවසූ එතුමා ඉදිරියේදී නැවත අදාල පාර්ශව කැදවා යම්විසඳුමක්ලබා දීමට ක්‍රියා කරමු යැයි පවසා සිටියේය.

**ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී අතුල ජයසිරි මැතිතුමා:**

තල්දූව තුරඟ තරඟ පිටියේ මැණික් පතල් වලින් ඉවත් කරනු ලබන පස් ප්‍රවාහනයට යොදා ගනු ලබන ට්‍රක් රථ සහ බැකෝ යන්ත්‍ර ගමන් කිරීම හේතුවෙන් මාදොල ප්‍රදේශයෙන් වෙලන්ගල්ලට යාමට ඇති ජනසළු මාර්ගය අබලන් තත්වයට පත් වන බව පවසා සිටියේය. සනත් ජෙම්ස් ආයතනයේ හිමිකරු විසින් මේ ආකාරයට වාහන යොදාගෙන එම පස් ප්‍රවාහනය කරන බවත් දිගු කාලයක් මෙලෙස සිදු වුවහොත් මාර්ගය සම්පූර්ණයෙන්ම අබලන් වන බැවින් මේ වාහන ප්‍රවාහනය සීමා කිරිම හෝ මාර්ගය පළුදු නොවන ආකාරයෙන් ඒවා ප්‍රවාහනය කර ගැනීමට යම් ක්‍රමවේදයක් සකස් කිරීම පිළිබඳව අවධානය යොමු කරන ලෙසත් ඉල්ලා සිටියේය.

**ගරු සභාපති ඒ.ජී. දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

සභාවට අයත් මාර්ග පළුදු වන ආකාරයෙන් එම පස් ප්‍රවාහනය සිදු කිරීමෙන් එකී මාර්ග වලට සිදුවන අලාභහානි සම්බන්ධයෙන් ජාතික මැණික් හා ස්වර්ණාභරණ ආයතනය දැනුවත් කරන ලෙස ලේකම්තුමියට දන්වා සිටියේය.

**ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ප්‍රියන්ත උදයකුමාර මැතිතුමා:**

න්‍යාය පත්‍රයේ ඇමුණුම 02 කොටසේ 1693 ගෙවීම් වවුචරය යටතේ ජලය ලබා ගැනීම සඳහා මාර්ගය පළුදු කිරීම වෙනුවෙන් තැන්පතු මුදල් ආපසු ගෙවීම් ලෙස රු.3500.00ක මුදලක් සඳහන්ව ඇති බවත් මාර්ග පළුදු කිරීම් සිදු කිරීමේදි කොන්ක්‍රීට් කඩා ජලය ලබා ගත් පසු මේ මුදල් නැවත ගෙවීම සිදු කරන්නේ සභාවෙන්පමණක් බවත් එය සභාවේ ආදායමට ගත නොහැකිද යන්නත් විමසා සිටියේය. මේ ගෙවීම් සිදු කරනු ලබන්නේ කාටද යන්න පිළිබඳව තමන් නොදන්නා බවත් පොදුවේ අදාල ගැටළුව සම්බන්ධයෙන් විමසීමක් සිදු කිරීම පමණක් කළ බවත් වැඩිදුරටත් සඳහන් කර සිටියේය.

**ගරු සභාපති ඒ.ජී. දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

මාර්ගය පළුදු කර ජල සැපයුම් ලබා ගැනීමේදී අත්තිකාරමක් ලෙස යම් මුදලක් සභාවේ තැන්පත් කර ගැනීමක් සිදු කරන බවත් පසුව අදාල කාර්ය නිසි පරිදි සිදු කර මාර්ගය සකස් කළ බවට කාර්මික නිලදාරී වාර්තාව ලබා දුන් පසු එම මුදල නිදහස් කරන බව පවසා සිටියේය.

**ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ප්‍රියන්ත උදයකුමාර මැතිතුමා:**

මාර්ගයක් පළුදු කළ පසු තිබූ තත්වයට එය සකස් කිරීමට නොහැකි බැවින් මේ මුදල නැවත ගෙවීම සාධාරණ දැයි විමසා සිටි එතුමා එම මුදල් මාර්ග සංවර්ධන අධිකාරියෙන් ගෙවීමක් සිදු නොකරන බවත් එම නිසා කාර්මික නිලධාර වාර්තාවකට මේ මුදල් නිදහස් කිරීම සුදුසු නොවන බවට තමන් විශ්වාස කරන බව පවසා සිටියේය. මේ ආකාරයට තල්දූව සීතා විද්‍යාල පාරේත් මාර්ග කඩා නැවත සකස් කරන තුරු විශාල පීඩාවක් ඒ ප්‍රදේශයේ ජනතාව විඳි බව සිහිපත් කර සිටියේය.

**ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී විකුම් චන්දන මැතිතුමා:**

තබා ගන්නා මුදල සම්බන්ධයෙන් තමන්ද සෑහීමකට පත් නොවන බවත් පසු ගිය මාසයේ ගෙවීම් ලේඛනයේත් රු.3500.00 ක මුදලක් ගෙවූ බවට සඳන් වී ඇති බව පැවසීය. මාර්ගයේ උරහිස පළුදු කිරීම සඳහා රු.2500.00ක මුදලක් අය කරන බව පවසා සිටියේය.

**ගරු සභාපති ඒ.ජී. දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

මෙය කොන්ක්‍රීට් නොදැමූ මාර්ගයක සිදු කරන ලද කාර්යකට ආපසු ගෙවන ලද මුදලක් විය හැකි බවත් එසේ නොමැතිව කොන්ක්‍රීට් කරන ලද මාර්ගයක නම් මේ මුදල් ප්‍රමාණය වැඩි විය යුතු බව පවසා සිටියේය.

**ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ලක්මාල් සමරරත්න මැතිතුමා**

මීට මාස ගණනාවකට පෙර තමන් විසින් මන්ත්‍රී යෝජනාවක් වශයෙන් ඉදිරිපත් කරන ලද බොරලංකඩ ප්‍රදේශයට මහජන පුස්තකාලයක් ලබා ගැනීමේ යෝජනාව ක්‍රියාත්මක වීම ඒ කාර්ය සඳහා නිශ්චිත භූමියක් වෙන් කර ගැනිමට නොහැකි වීම මත යම් කාලයක් ප්‍රමාද වූ බව පවසා සිටියේය. නමුත් දැන් ඒ සඳහා බොරලංකඩ ගැමි දිරිය සමිතියට අයත් අඩක් වැඩ නිම කර ඇති ගොඩනැඟිල්ලක් සහිත ඉඩම සභාවට පවරා දීමට එම සමිතිය එකඟ වී ඇති බවත් ඒ ඉඩම ආසන්නයේම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් ඉඩමක්ද පවතින බැවින් මේ ඉඩම් දෙකම හෝ එකක් සභාව වෙත පවරාගෙන අදාල කාර්ය සිදු කිරීමේ හැකියාව ඇති බැවින් එම ඉඩම් දෙක පරීක්ෂා කර බැලීමට කටයුතු කරන ලෙස ගරු සභාපතිතුමාගෙන් ඉල්ලා සිටියේය. එසේම ගැමි දිරිය සමිතියට අයත් ඉඩමේ ගොඩනැඟිල්ලක් ඉදි කිරීමේ කටයුතු ආරම්භ කර ඇති නිසා එය සභාව වෙත පවරාගෙන එම ගොඩනැඟිල්ලේ ඉතිරි කටයුතු සම්පූර්ණ කර පුස්තකාලය ස්ථාපිත කිරීමට කටයුතු කළ හැකි නම් එය වඩාත් සුදුසු බවට තමන් අදහස් කරන බව පවසා සිටියේය.

**ගරු සභාපති ඒ.ජී. දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

මේ සම්බන්ධයෙන් සභා තීරණයක් මීට පෙර ගෙන ඇති නිසා අදාල ස්ථාන පරීක්ෂා කර බලා වඩාත් සුදුසු ස්ථානය සම්බන්ධයෙන් වාර්තාවක් ලබා ගෙන එය සභාව වෙත පවරා ගැනීමට අවශ්‍ය කඩිනම් ක්‍රියා මාර්ග ගැනීම සඳහා දායකත්වය ලබා දෙන ලෙස ගරු මන්ත්‍රී ලක්මාල් සමරරත්න මැතිතුමාට දන්වා සිටින ලදී.

**ගරු උප සභාපති විමුක්ති ජයරත්න මැතිතුමා:**

දෙබෑගම ඉහල තල්දූව කඹුරාපොල මාර්ගයේ පරණ කාපට් කළ කොටසේ කාපට් එක කැඩී යන බවත් මේ සම්බන්ධයෙන් දැනුවත් කළත් තවමත් සකස් කර නොමැති බැවින් අවශ්‍ය ක්‍රියා මාර්ග ගන්නා ලෙස ඉල්ලා සිටියේය.

**ගරු සභාපති ඒ.ජී. දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

ඒ සම්බන්ධයෙන් විධායක ඉංජිනේරු කාර්යාලය දැනුවත් කිරීමට කටයුතු කරන ලෙස දන්වා සිටියේය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කෝසල නුවන් ජයවීර මැතිතුමා**

සමරුගම යාය පැති බැම්ම ඉදි කිරීමේ කාර්ය ගිවිසුම් ගත වී ඇති ආකාරයට සිදු වී නොමැති බවත් එහි අස අඩි 07 ක් තිබිය යුතු වුවත් අඩි 3 ½ ක් 4 ක ප්‍රමාණයට පමණක් එය සකස් කර ඇති බව පවසා සිටියේය. එසේම පැති බැම්මක් ඉදි කිරීමේදී කොන්ක්‍රීට් අනුපාතය 80 %ක් හා ගල් අනුපාතය 20% ක් ලෙස තිබිය යුතු වුවත් මේ කාර්යයේදී ගල් අනුපාතය වැඩි කර කොන්ක්‍රීට් අනුපාතය අඩු කර ඇති බවත් පවසා සිටියේය. ගොවි සමිතියක් මේ කර්මාන්තයේ ගිවිසුම්ගත වී ඇති බවත් ඔවුන් විසින් කොන්ත්‍රාත්කරුවෙකු මාර්ගයෙන් එම කාර්යය සිදු කර ඇති බවත් පැවසූ එතුමා අදාල කාර්යය නිවැරදි කරන තෙක් කොන්ත්‍රාත්කරුට මුදල් ගෙවීම ගොවි සමිතිය විසින් ප්‍රතික්ෂේප කරන බවත් පවසා සිටියේය. මේ සම්බන්ධයෙන් සභාවේ මැදිහත් වීමෙන් පරීක්ෂණයක් සිදු කරන ලෙස ඉල්ලා සිටින ලදී. මේ ව්‍යාපෘතියට අදාලව කුඹුරු අක්කර එක හමාරක් දෙක් වගා කිරීමට නොහැකිව පවතින බවත් එහි ඇති බෝක්කුවක් සකස් කිරීමට හියුම් පයිප්ප ගෙනවිත් තිබියදී දේශපාලන බලපෑමක් හරහා ඒවා වෙනත් ස්ථානයකට ගෙන ගොස් ඇති බව පවසා සිටියේය. මේ සඳහා මුදල් අනුමත කර ඇති බවත් අදාල කාර්ය සිදු නොවීම නිසා ඒ සම්බන්ධයෙන් පරීක්ෂා කර බලන ලෙස ඉල්ලා සිටින ලදී.

**ගරු සභාපති ඒ.ජී. දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

කෘෂිකර්ම අමාත්‍යාංශයේ සංවිධාන කටයුතු විශාල මාෆියාවක් සිදු වන බවට අවස්ථා කීපයකදීම නිරීක්ෂණය වී ඇති බවත් අදාල ස්ථානය සම්බන්ධයෙන් නොව කොන්ත්‍රාත්කරුට අවශ්‍ය ස්ථානයට යෝජනා ගෙනවිත් සංවර්ධන කටයුතු සිදු කරන බවත් තමන් මේ සම්බන්ධයෙන් දිස්ත්‍රික් හා ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු රැස්වීම් වලදීත් පෙන්වා දී ඇති බව පවසා සිටියේය. එම නිසා අදාල කරුණු සම්බන්ධයෙන් සභාවට වාර්තා කිරීම ගැන ගරු මන්ත්‍රී කෝසල ජයවීර මැතිතුමාට ස්තුතිවන්ත වන බවත් අදාල අංශ මේ සම්බන්ධයෙන් දැනුවත් කිරීමට කටයුතු කරන බවත් පවසා සිටියේය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ආර්.ඒ.එම්.දරුක් මැතිතුමා**

එම හියුම් පයිප්ප වසර 03 ක් පමණ කාලයක් එම ස්ථානයේ තිබූ බවත් පසුව ගම්මානයේ මාර්ගයක් කැඩී යාම හේතුවෙන් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව හා ප්‍රාදේශීය ලේකම් සමඟ සාකච්ඡා කර එම බෝක්කු රැගෙන ගොස් ඒ මාර්ගය සකස් කළ බව පවසා සිටියේය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සරත් විජේසිරි මැතිතුමා**

අටුගම ශ්‍රමදානය පවත්වා මාර්ගයේ කාණු සකස් කළත් ඒ කාණු ඇතුලත ශුද්ධ කිරීම තවමත් සිදු කර නැති බවත් වර්ෂාව නැවත ආරම්භ වීම හේතුවෙන් යම් ගැටළුකාරී තත්වයක් ඇති විය හැකි බැවින් එය සකස් කර දීම කඩිනම් කර දෙන ලෙස ඉල්ලා සිටියේය. කනංගමට විශාල සේවයක් වන යොවුන් සේනාංකය පිහිටි ගොඩනැඟිල්ලට යන මාර්ගය වැසි ජලය හේතුවෙන් ඛාදනයට ලක් වී එම දරුවන්ට මාර්ගයේ ගමන් කිරීමට නොහැකි තත්වක් උද්ගත වී ඇති බවත් එය සකස් කිරීම සඳහා සිලින්ඩර් 03 ක් අවශ්‍ය වී ඇති බව පවසා සිටියේය. අඩි 04 ක සහ අඩි 08 සිලින්ඩර් 02ක් ලබා දිය හැකි නම් මේ මාර්ගයේ ගැටළු නිරාකරණය කර ගත හැකි බව පවසා සිටින ලදී. මේ සම්බන්ධයෙන් යොවුන් සේනාංකයේ අධ්‍යක්ෂකතුමා විසින් ලිපික් ලබා දී ඇති බැවින් ඒ සම්බන්ධයෙන් සලකා බලන ලෙස ඉල්ලා සිටියේය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ශාන්තප්‍රිය පතිරණ මැතිතුමා**

ප්‍රිමික්ස් අංගනයේ කටයුතු මේ වන විට සිදු කරමින් පවතිනවාද යන්න විමසා සිටියේය.

**ගරු සභාපති ඒ.ජී. දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

වර්ෂාව හේතුවෙන් මේ දින වල එහි කටයුතු තාවකාලිකව නවතා ඇති බව පවසා සිටියේය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ශාන්තප්‍රිය පතිරණ මැතිතුමා**

ඇපලපිටිය මාර්ගයේ භාගෙට තාර දැමූ ස්ථානයක් තිබෙන බවත් එහි වැඩි අවසන් කර දෙන ලෙස ප්‍රදේශවාසීච් විසින් ඉල්ලීම් සිදු කරන බවත් පවසා සිටියේය.

**ගරු සභාපති ඒ.ජී. දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

මේ වන විට තාර තිබෙන බවත් වැලි සහ චිප් ගල් ලබා ගැනීම සඳහා මුදල් කමිටුවට අනුමැතියට යොමු කළ යතු බව පවසා සිටියේය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ප්‍රියන්ත උදයකුමාර මැතිතුමා**

ගරු මන්ත්‍රී සරත් විජේසිරි මැතිතුමා පැවසූ කනංගම යොවුන් සේනාංකයේ ඉල්ලීම සම්බන්ධයෙන් අවධානය යොමු කරන ලෙස ඉල්ලා සිටියේය. මේ ප්‍රදේශයේ පමණක් නොව දුර බැහැර ප්‍රදේශ වලින් පවා දරුවන් මේ මධ්‍යස්ථානයට පැමිණ පුහුණුව ලබන බවත් එම නිසා ප්‍රදේශයට සම්පතක් වන ඒ ස්තානය රැක ගැනීම අපගේ වගකීම බැවින් අවශ්‍ය සහය ලබා දීමට කටයුතු කරන ලෙස ඉල්ලා සිටියේය.

**ගරු සභාපති ඒ.ජී. දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

කනංගම යොවුන් සේනාංකය සභාව සමඟ සහයෝගයෙන් කටයුතු කරන ආයතනයක් බවත් එම නිසා හැකි සෑම විටම ඒ ආයතනය වෙනුවෙන් අපගේ සහය ලබා දී ඇති බව පවසා සිටියේය. මෙය පළාත් සභාව සතු මාර්ගයක් බවත් දැනට සභාව සතුව එකදු සිලින්ඩරයක් හෝ නොමැති බැවින් වෙනත් මාර්ගයකින් හෝ සිලින්ඩර ලබා ගැනීමට හැකියාව ඇත්දැයි සොයා බලන බව පවසා සිටියේය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී ශ්‍රියානි ජයකොඩි මැතිණිය:**

කනංගම යොවුන් සේනාංකය සාදන විට එයට විරුද්ධ වූ ගරු මන්ත්‍රී සරත් විජේසිරි මැතිතුමා මෙලෙස ප්‍රකාශකිරීම පිළිබඳව සතුටු වන බව පවසා සිටියේය.

(සභාව සෝෂාකාරී)

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සරත් විජේසිරි මැතිතුමා**

දේශපාලනය සිදු කරනවා කියා මේ ආකාරයේ අසත්‍ය ප්‍රකාශ සිදු නොකරන ලෙස පැවසීය. එම මධ්‍යස්ථානය සකස් කරන විට අවශ්‍ය ගල් ලබා දුන්නේත් තමන් විසින් බවත් මේ ආකාරයේ අසත්‍ය ප්‍රකාශ සිදු කිරීම පිළිබඳව අතිශය කණගාටු වන බව පවසා සිටියේය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී ශ්‍රියානි ජයකොඩි මැතිණිය:**

මෙම් ආයතනය මඟින් තරුණ දූ දරුවන්ට යහපත් පුහුණුවක් ලබා දී ඔවුන් සමාජයට මුදාහරින බවත් ගරු ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමා අගමැතිව සිටි යහපාලන කාලයේදී මෙය ඉදි කිරීමට මුල් වී ක්‍රියා කළ බව පවසා සිටියාය.

(සභාව සෝෂාකාරී)

**ගරු සභාපති ඒ.ජී. දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

ගරු මන්ත්‍රීනී ශ්‍රියානි ජයකොඩි මැතිණිය ප්‍රකාශ කළ පරිදි යොවුන් සේනාංකය ඇති කිරීමට මුල් වූයේ එවකට අගමැති වූ වර්තමාන ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහතා නම් එතුමාගේ සහයෙන් එහි ඉතිරි වැඩකටයුතු සම්පූර්ණ කර ගැනීමට හැකි වනු ඇති බව පවසා සිටියේය.

දිනයට සාකච්ඡා කිරීමට තිබූ කරුණු සාකච්ඡා කර අවසන් බැවින් 2022 වර්ෂයේ අවසන් මහා සභා රැස්වීමේ කටයුතු අවසන් කරන බවත් ලබන්නා වූ නව වසර සියළුදෙනාට සාමය සතුට සෞභග්‍ය පිරි සුබ නව වසරක් වේවායි ප්‍රාර්ථනා කරන බව පැවසූ ගරු සභාපතිතුමා මී ළඟ මහා සභා රැස්වීම 2023.01.10 දින පෙ:ව: 09.30 ට ප්‍රාදේශීය සභා කාර්යාලයේදී පැවැත්වෙන බව නිවේදනය කරමින් එදින ප:ව:01.09 ට මහා සභා රැස්වීමේ කටයුතු අවසන් කරන ලදී.

ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද,
සභාපති,
දෙහිඕවිට ප්‍රාදේශීය සභාව.